පුරෝගාමියා සමඟ සම්බන්ධ වීම සඳහා

**kcg.edu**

The Kyoto College of Graduate Studies for Informatics

京都情報大学院大学

**URL: https://www.kcg.edu/**

විද්‍යුත්තැපැල: **admissions@kcg.edu**

විමසීම්: ඇතුළත් කිරීමේ අංශය,

කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI)

10-5 Nishikujoteranomae-cho, Minami-ku, Kyoto 601-8407, Japan

දුරකථනය: 075-681-6334 (+81-75-681-6334 ජපානයෙන් පිටත)

ෆැක්ස්: 075-671-1382 (+81-75-671-1382 ජපානයෙන් පිටත)

シンハラ語 202307

# kcg.edu

## KCGI: The Kyoto College of Graduate Studies for Informatics

ජපානයේ ප්‍රථම තොරතුරු
තාක්ෂණ වෘත්තීය උපාධි පාසල

京都情報大学院大学

කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය

# කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය

## The Kyoto College of Graduate Studies for Informatics (KCGI)

### ◆ අපි සංකේන්ද්‍රීය ක්ෂේත්‍ර දෙකක් පිරිනමන්නෙමු: තොරතුරු විද්‍යා හා කළමනාකරණ අධ්‍යයනය.

ප්‍රධාන තොරතුරු නිලධාරී (CIO) සහ ව්‍යාපෘති කළමනාකරු ආදී ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු ඉලක්ක කරන්නන් වෙනුවෙන්.

### ◆ අපි මානව ශාස්ත්‍ර සහ විද්‍යා යන දෙක ද ඇතුළුව පුළුල් පරාසයක සිසුන් පිළිගන්නෙමු.

පරිගණක ආධුනිකයන්ට වුව ද KCGI හි ලියාපදිංචි විය හැක. ඔබේ ආරම්භක දැනුම මට්ටම අනුව ඉගෙනුම් කටයුතු සිදු කරන්න.

### ◆ දිගු කාලීන අධ්‍යයන පද්ධතිය ආදී වැඩසටහන් හරහා, අපි රැකියාවල නියුතු වෘත්තිකයන්ට අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට සහාය වන්නෙමු.

සිසුන්ට KCGI තුළ පන්තිවලට සහභාගී විය හැකි විවිධ ක්‍රමවේද පවතී. සතියේ දිනවල දිවා කාලයේ පන්තිවලට අමතරව, KCGI සවස සහ සෙනසුරාදා පන්ති මෙන්ම ඉ-ඉගෙනුම් ආදී විකල්පයන් ද පිරිනමයි. වසර දෙකක් පමණ වටිනා උපකාරක පන්ති සමග අධ්‍යයන කාලය වසර තුනක් හෝ වසර හතරක් දක්වා පවා විහිදෙන දිගුකාලීන අධ්‍යයන ක්‍රමය ආදී වූ වැඩසටහන් හරහා, රැකියා කටයුතුවල යෙදෙන අතරතුර ඉගෙනීමට කැමති සිසුන්ට අපි සහාය වන්නෙමු.

### ◆ KCGI තොරතුරු තාක්‍ෂණ (ICT) ක්ෂේත්‍රවල පුළුල් පරාසයක අයදුම්පත් භාරගනී.

පුළුල් පරාසයක විසිරුණු තොරතුරු තාක්‍ෂණ දැනුම අතරින්, තොරතුරු තාක්‍ෂණය හා සම්බන්ධ දැනුම සහ කුසලතාවලට ඉහළ ඉල්ලුමක් පවතින ව්‍යාපාරික ලෝකය හා විශේෂ බැඳියාවක් ඇති සංකේන්ද්‍රීය ක්ෂේත්‍ර අටක් KCGI සතුව ඇත. තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයෙකුගෙන් සමාජය අපේක්‍ෂා කරන විවිධ දැනුම සහ කුසලතා ඉගෙනීමට KCGI සිසුන්ට මඟ පාදයි. අපි පුළුල් පරාසයක විහිදුණු කාර්මික ක්ෂේත්‍රවල තොරතුරු තාක්‍ෂණ (ICT) භාවිතයන් පිළිබඳ පාඨමාලා ද පිරිනමන්නෙමු.

### ◆ අපි සප්පෝරෝ සහ තෝකියෝ නගරවල පරිවාර පාසල් විවෘත කොට ඇත. අපි තවමත් ජපානයේ සහ විදේශ රටවල ව්‍යාප්තකරණ කටයුතු සිදු කරමින් සිටිමු.

සිසුන්ට සෑම පරිවාර පාසලකම පංතිවලට සහභාගී වී ඉගෙනුම් කටයුතු සිදු කළ හැකි ය. විදේශ රටවල් ඇතුළු කලාප ගණනාවක තවදුරටත් පරිවාර පාසල් විවෘත කිරීමට අපි සැලසුම් කරමින් සිටිමු.

### ◆ සැබෑ ලෝකයේ අත්දැකීම් සම්භාරයකින් පොහොසත් පීඨයක්.

අපගේ බොහෝ උපදේශකයින් ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සමාගම්වල අඛණ්ඩ සේවයේ නියුතු වන්නන් වේ. සමහරු ප්‍රධාන සමාගම්වල CIO තනතුරු දරන අතර; අනෙකුත් අය අන්තර්ගත ව්‍යාපාරය සම්බන්ධ අති නවීන අංශවල ක්‍රියාකාරී භූමිකා ඉටු කරයි.

### ◆ KCGI සිසුන් විශාල සංඛ්‍යාවක් SAP ERP සහතිකලත් උපදේශක විභාගය සමත් වී ඇත.

මනා අවධානයක් යොමු කරමින් දෙනු ලබන ඒක පුද්ගල උපදේශන හරහා, අපි සිසුන්ට ඉහළ මට්ටමේ සුදුසුකම් සපුරා ගැනීමට සහාය වන්නෙමු. සුදුසුකම් සපිරූ පසු බොහෝ සිසුන් ප්‍රධාන පෙළේ සමාගම්වලට සේවයට ගැනීම හෝ සමාගම්වලට මාරුකර යැවීම සිදු වේ.

### ◆ බොහෝ පන්ති ද්විභාෂා ආකාරයෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පිරිනමනු ලැබේ.

KCGI බොහෝ පන්ති ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන අතර, අනෙකුත් පන්ති ජපන් සහ ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් සිදු කරයි. ඉංග්‍රීසියෙන් පමණක් පැවැත්වෙන පන්ති හරහා ද උපාධියක් ලබා ගැනීමේ හැකියාව ඇත.

### ◆ අපි අන්තර්ගතයන් සම්බන්ධ ගෝලීය ඉසව්වලට සහභාගී වන්නෙමු.

සෑම වසරකම ප්‍රංශයේ පැවැත්වෙන ජපන් සංස්කෘතිය පිළිබඳ සාමාන්‍ය ප්‍රදර්ශනයක් වන Japan Expo ප්‍රදර්ශනයට KCGI සහභාගී වේ. මාංගා සහ ඇනිමෙ සම්බන්ධ සියලු දේ සඳහා වූ වෙළඳ ප්‍රදර්ශනයක් වන කියෝතෝ ජාත්‍යන්තර මාංගා ඇනිමෙ ප්‍රදර්ශනය (“Kyomafu”) සඳහා ද KCGI සම අනුග්‍රහය දක්වයි.

### ◆ KCGI නිපොන් ව්‍යවහාරික තොරතුරු විද්‍යා සංගමයේ (NAIS) සහ කියෝතෝ මාංගා සහ ඇනිමෙ සංගමයේ (KMAS) ලේකම් ධූර හොබවයි.

අපි තොරතුරු තාක්‍ෂණය (ICT) ආශ්‍රිත පුළුල් ප්‍රභේද පරාසයක ශාස්ත්‍රීය සංගම් පිහිටුවා ඇත. මෙම සංගම් හරහා අපි පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, සහ ජාල ගොඩනැඟීමේ කටයුතු සිදු කරමින් සිටිමු.

### ◆ කියෝතෝ සන්නාමය ලොව පුරා ව්‍යාප්ත කිරීමට අපි Kyoto නමින් භාවිතා කරනු ලබන .kyoto නම් වූ නව උසස් ගණයේ ඩොමේන් පරිපාලකයා බවට පත් වීම පිළිබඳ KCGI හට ඇත්තේ අභිමානයකි.

කියෝතෝ ප්‍රාන්ත රජයේ සහාය හා ගෝලීය ඩොමේන් පරිපාලකගේ අවසරය ඇතිව, භූගෝලීය නාමයක් පාදක කොටගත් උසස් ගණයේ ඩොමේන් නාමයක් පරිපාලය සහ හැසිරවීම සිදු කරන ලොව එකම අධ්‍යාපන ආයතනය බවට KCGI පත්ව ඇත.

### ◆ ඉහළ මට්ටමේ තොරතුරු තාක්‍ෂණ කුසලතා සහිත පුද්ගලයින් වසරකට සාමාන්‍යයෙන් යෙන් මිලියන 9.37ක් උපයනු ලබයි.

ජපානයේ තොරතුරු තාක්‍ෂණ ප්‍රවර්ධන නියෝජිතායතනයට (IPA) අනුව, නියෝජිතායතනයේ තොරතුරු තාක්‍ෂණ කුසලතා ප්‍රමිතීනගේ තුන්වන අනුවාදය මගින් “ඉහළ මට්ටමේ” (4 සහ 5 වන මට්ටම්) පුද්ගලයින්ව, “ඊළඟ පරම්පරාව පුහුණු කිරීමට දැනුම සහ ප්‍රායෝගික කුසලතා යෙදවිය හැකි වෘත්තිකයන්, විශේෂීකෘත ක්ෂේත්‍රවල පිළිගැනීමක් ඇති පුද්ගලයින් ලෙස හඳුන්වයි”. 2017 අගෝස්තු මාසයේ දී ආර්ථික, වෙළඳ සහ කර්මාන්ත අමාත්‍යාංශය (METI) විසින් ප්‍රකාශයට පත් කරන ලද “තොරතුරු තාක්‍ෂණය ආශ්‍රිත කර්මාන්තවල වැටුප් පිළිබඳ කරුණු සෙවීමේ සමීක්‍ෂණයෙහි ප්‍රතිඵලවලට අනුව”, 5 වන මට්ටමේ සාමාන්‍ය වැටුප වසරකට යෙන් මිලියන 9.37 කි. පුද්ගලයෙකුගේ වෘත්තිය එවැනි මට්ටමකට ඔසවා තැබීම සඳහා සමාගමකින් සේවා පළපුරුද්ද ලබා ගැනීමට වඩා වැඩි යමක් අවශ්‍ය වේ. මේ සඳහා ඉතා ඵලදායී විකල්පයක් වන්නේ KCGI වැනි වෘත්තීය උපාධි පාසලකින් ව්‍යාපාර සහ තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රවල ප්‍රායෝගික අධ්‍යයනයන් සිදු කිරීම යි.

අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්‍ෂණ අමාත්‍යාංශය (MEXT)
විසින් සහතික කරන ලද පළමු වෘත්තීය තොරතුරු තාක්‍ෂණ උපාධි පාසල

## No. 1 & the Only One!

## කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI)

### පාසලේ දර්ශනය

අපගේ පාසලේ පරමාර්ථය වන්නේ සමාජයේ ඉල්ලීම් සපුරාලීමටත් වර්තමාන හා අනාගත පරපුර සඳහා වන වගකීම ඉසිලීමටත් හැකියාව ඇති, වර්තමාන ව්‍යාපාරික භාවිතයන් පිළිබඳ ශක්තිමත් ප්‍රායෝගික දැනුමක්, ශක්තිමත් න්‍යායාත්මක පසුබිමක් සහ නිර්මාණාත්මක හා නව්‍යකරණ ජීවගුණයක් සහිත ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයින් පුහුණු කිරීමයි.

### KCGI හි මෙහෙවර සහ අරමුණ

අපගේ තොරතුරු තාක්ෂණ සමාජයේ ඉහළ මට්ටමේ සහ විවිධ වූ මානව සම්පත්වල අවශ්‍යතාවය සපුරාලීමත්, සාම්ප්‍රදායිකත්වය ඉක්මවා ගිය වඩාත් පුළුල් දැනුමක් හා ඉහළ මට්ටමේ කුසලතා සහිත මෙන්ම සාර්වත්‍රික පරිගණකකරණ යුගයේ අන්තර්ජාතික චින්තනයක් සහිත ඉහළ මට්ටමේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සැපයීම තුළින් ආර්ථිකයේ දියුණුව සහ ඉහළ මට්ටමේ තොරතුරු සමාජයක් සාක්ෂාත් කර ගැනීමට දායක වීම.
අපගේ අරමුණ වන්නේ තොරතුරු හා ඒ ආශ්‍රිත තාක්ෂණයන්හි විකාශනයන්ට අනුවර්තනය වීම සහ ඉහළ මට්ටමේ වෘත්තිකයින් පුහුණු කිරීමේ දී විද්‍යාව, තාක්‍ෂණය සහ ව්‍යාපාර පරිපාලනය සම්බන්ධ අධ්‍යයන ක්ෂේත්‍රයන්හි න්‍යාය හා ප්‍රායෝගික තාක්‍ෂණය පිළිබඳ අධ්‍යාපනය ලබා දීමයි.

kcg.edu
The Kyoto College of Graduate Studies for Informatics

### ඇතුළත් කරගැනීමේ ප්‍රතිපත්ති

තොරතුරු තාක්ෂණ/ICT* කර්මාන්තය යනු තොරතුරු මෙන්ම කළමනාකරණය සම්බන්ධ ක්ෂේත්‍ර දෙකෙහිම ඒකාබද්ධ ක්ෂේත්‍රයක් වන අතර එහි ඉලක්ක සංකීර්ණ හා විවිධ වේ. මේ හේතුවෙන්, තොරතුරු තාක්‍ෂණ කර්මාන්තයේ අවශ්‍යතා සඳහා වන කුසලතා වෙන කවරදාටත් වඩා විවිධාංගීකරණය වෙමින් පවතී. අද වන විට, ජපාන කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින විවිධාකාර කුසලතා සැපයුම් අවශ්‍යතාවන්, දැනට පවත්නා ඉංජිනේරු විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ උපාධි පාසල් තුළින් කෙරෙන ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් සංවර්ධනය කිරීම මත පමණක් රඳා පවතින ජපන් අධ්‍යාපන ක්‍රමයෙන් සපුරාලීමට නොහැකි වී ඇත. ඉදිරි අනාගතයේ දී, ජපාන කර්මාන්ත ක්ෂේත්‍රය සහ ආර්ථිකය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා, තොරතුරු තාක්‍ෂණ/ICT කර්මාන්තයේ ඉහළ විශේෂඥ වෘත්තිකයන් ලෙස විවිධ පසුබිම්වල පුද්ගලයන් සෑම ආකාරයකින්ම පුහුණු කිරීම වැදගත් ය.

මෙම ඉදිරි දර්ශනයෙන් බලන විට, විවිධ පසුබිම්වලින් පැමිණෙන සිසුන් හැකිතාක් ප්‍රමාණයක් ඔවුන්ගේ අපේක්ෂක උපාධි විශේෂණය කිරීමකින් තොරව පුළුල් ලෙස පිළිගැනීමේ ප්‍රතිපත්තියක් අප පාසල සතුව ඇත.

**1) අපගේ පාසලේදී විශේෂිත දැනුම ඉගෙනීමේ පදනම් අධ්‍යයන හැකියාව ඇති පුද්ගලයින්;**

**2) ස්ථාපිත සංකල්පවල සිරවී නොසිට අලුත් දේ ඉගෙනීමට, තනිවම සිතීමට සහ අලුත් දෙයක් නිර්මාණය කිරීමට අභිලාෂය ඇති පුද්ගලයින්; හා**

**3) අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහ සන්නිවේදනය තුළින් ගැටළු වලට පිළිතුරු සෙවීමට කැමැත්තක් ඇති පුද්ගලයින්.**

*ICT: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

# KCGI අධ්‍යාපනයක්



**සභාපති, අධ්‍යක්ෂ සහ මහාචාර්ය**
**කියෝතෝ ජෝහෝ ගකුඑන්**

## වතරු 長谷川 亘
## හසෙගාවා
## Wataru Hasegawa

ශාස්ත්‍රවේදී උපාධිය, වසේදා විශ්ව විද්‍යාලය

අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කලා ශාස්ත්‍රපති, ඇමරිකා එක්සත් ජනපදයේ කොලම්බියා විශ්ව විද්‍යාලය

සභාපති, කියෝතෝ ප්‍රාන්තයේ තොරතුරු කර්මාන්ත සංගමය

භාරකරු සහ සභාපති, සමස්ථ නිපොන් තොරතුරු කර්මාන්ත සංගම් සම්මේලනය (ANIA)

ජපානයේ තොරතුරු තාක්‍ෂණ සම්මේලනයේ (IT Renmei) නිර්මාතෘ

නියෝජිත සභාපති සහ අග්‍ර උප සභාපති, ජපන් තොරතුරු තාක්ෂණ සමිති සම්මේලනය

ජපානයේ තොරතුරු සැකසුම් සංගමයේ (IPSJ) සභාපති

ජපන් සුවිසල් විවෘත ඔන්ලයින් අධ්‍යාපන ප්‍රවර්ධන කවුන්සිලයේ (JMOOC) සභාපති

තොරතුරු තාක්‍ෂණ සම්බන්ධීකාරක සංගමයේ (ITCA) කළමනාකරණ සැලසුම් කමිටුවේ උප සභාපති සහ සාමාජික

සේවක පිරිස් පුහුණු කවුන්සිලය, IT Security Slogan, පෝස්ටර් සහ සිව් මණ්ඩල මාංගා තරඟ පරීක්ෂා කමිටු IPA සාමාජික

වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් සහ රැකියා සොයන්නන් සඳහා වූ ජපන් සංවිධානයේ උසස් බහුතාක්‍ෂණ මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටු සාමාජික

නිපොන් ව්‍යවහාරික තොරතුරු විද්‍යා සංගමයේ (NAIS) උපදේශක සහ සභාපති

තායිලන්ත රාජධානියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ උප අමාත්‍ය සම්මානය (දෙවරක්)

ඝානා ජනරජයේ අධ්‍යාපන අමාත්‍යාංශ සම්මානය

ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් ප්‍රාන්තයේ අධ්‍යාපන පරිපාලකයෙකු ලෙස සුදුසුකම් ලබා ඇත

බාහිර මහාචාර්ය, තියැන්ජින් විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලය, චීනය

ප්‍රතිපත්ති උපදේශක කමිටුව, JDC, ජෙජු නිදහස් අන්තර්ජාතික නගර සංවර්ධන මධ්‍යස්ථානය

**පාඨමාලා:** නායකත්ව න්‍යාය, ගෞරව ප්‍රධාන නිබන්ධනය

කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය ජපානයේ ප්‍රථම තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධි පාසල වේ. KCGI හි මව් සංවිධානය වන කියෝතෝ කම්පියුටර් ගැකුයින් (KCG) යනු ජපානයේ ප්‍රථම පුද්ගලික පරිගණක අධ්‍යාපන ආයතනයයි. KCG පුද්ගලික පාසලක් ලෙස ෂිගියෝ හසෙගාවා සහ යසුකෝ හසගාවා විසින් තම අද්විතීය, ඉදිරි දර්ශනය යටතේ පිහිටුවන ලදී. 1963 දී KCG ස්ථාපිත කළ දා පටන් එය පරිගණක අධ්‍යාපනයේ නියැලී සිටී. එම කාලය තුළ උසස් විද්‍යාල උපාධිධාරීන් පමණක් නොව විශ්වවිද්‍යාලවල සිව් වසර උපාධිධාරීන් රැසක් ද මෙම පාසලට ඇතුළත්ව අධ්‍යාපනය ලබා ඇත. මෙම පාසල ආරම්භ කරන අවස්ථාවේ, ජපානයේ පැවතුනේ පර්යේෂණ අරමුණු කොටගත් උපාධිධාරී පාසල් පමණකි. විශ්ව විද්‍යාල උපාධි ලැබීමෙන් පසු බඳවාගත් බොහෝ සිසුන් විසින් පරිගණක පිළිබඳව ප්‍රායෝගික පැත්තට සෘජුවම සම්බන්ධ උසස් අධ්‍යාපන ආයතනයක් සොයා යාමෙන් පසු, KCG තෝරා ගන්නා ලදී. KCG වෘත්තීය පාසැල් ක්‍රමය යටතේ සංවිධානය කරන ලද නමුත් එය ජපන් සමාජය තුළ විශ්ව විද්‍යාල උපාධිධාරීන් සඳහා අධ්‍යාපනික ආයතනයක් ලෙස කටයුතු කරන අතර වෘත්තිය හා ප්‍රායෝගික උපාධි පාසලක කාර්යභාරයද සිදු කරනු ලබයි.

මෙම තත්ත්වය හා ඉතිහාසය මත පදනම්ව 1998 දී KCG විසින් ඇමරිකා එක්සත් ජනපදයේ රොචෙස්ටර් තාක්ෂණ ආයතනයෙහි උපාධි වැඩසටහන් (තොරතුරු විද්‍යාව හා තාක්ෂණය, පරිගණක විද්‍යාව සහ වෙනත්) සමග ඒකාබද්ධ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර පසුව විෂය මාලාව, ප්‍රායෝගික ඉගෙනීම අරමුණු කොට ගත් වෘත්තීය උපාධි පාසලක් ආරම්භ කර ඇත. ජපාන වෘත්තීය පාසලක් සහ ඇමෙරිකානු උපාධිධාරී පාසැල් වැඩසටහනක් අතර වූ මෙම සහයෝගිතාවය ජපානය තුළ ඒ ලෙසට ඇති වූ ප්‍රථම සහ නවීන සහයෝගිතාවයි.

කියෝතෝ කොම්පියුටර් ගැකුයින් (KCG) හි මෙවැනි නිපුණ පුද්ගලයින් විසින් වෘත්තීය උපාධි පාසල් පද්ධතිය යටතේ තොරතුරු තාක්ෂණ කේන්ද්‍රීය අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම යම් ආකාරයකින් අවශ්‍යයෙන් කළයුත්තක් විය. කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI) ආරම්භ කරන ලද්දේ මූල්‍ය පාර්ශ්ව මෙන්ම රොචෙස්ටර් තාක්ෂණ ආයතනයේ සහ කොලොම්බියා විශ්ව විද්‍යාලයේ පීය ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි අදාළ පාර්ශ්වයන්ගේ නොමසුරු අනුමැතිය හා සහයෝගය ඇතිවය. නව පද්ධතිය අනුගමනය කළ පළමු වසර, එනම් 2004 අප්‍රේල් මාසයේදී KCGI ජපානයේ පළමු හා එකම තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධි පාසල ලෙස විවෘත කෙරිණි.

KCGI හි ආරම්භක දර්ශනය වන්නේ ''සමාජයේ අවශ්‍යතා සපුරාලන, වත්මන් යුගයට උරදෙන සහ අනාගත පරපුර වෙත අපට මඟපෙන්වන නිර්මාණශීලීත්වය සහ ඉහළ මට්ටමේ ප්‍රායෝගික හැකියාවන්ගෙන් හෙබි ව්‍යවහාරික තොරතුරු තාක්‍ෂණය පිළිබඳ විශේෂඥයින් බිහි කිරීම'' වේ. තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය ජාත්‍යන්තර ව්‍යාපාරික අධ්‍යාපනය සමඟ ඒකාබද්ධ කරමින්, KCGI විසින් ඉංජිනේරුවන් සහ විශේෂයෙන් වෙබ් ව්‍යාපාර (ඊ-ව්‍යාපාර) පිළිබඳ නිපුණ පරිගණක තොරතුරු නිලධාරීන් (CIO) බිහිකිරීමේ වැඩසටහනක් නිර්මාණය කරන ලද්දේ, පරිගණක යන්ත්‍රෝපකරණ පිළිබඳ සංගමයේ (ACM) තොරතුරු පද්ධති (IS) ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් විෂයමාලාවේ සංශෝධිත සංස්කරණය පදනම් කරගෙන ය. KCGI හි මෙහෙවර හා අරමුණ වනුයේ සුවිශේෂී නිපුණතා මට්ටම්වලින් හෙබි දැනුම් සම්භාරයකින් යුත්, අන්තර්ජාතික චින්තනයක් සහිත තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සැපයීම වෙනුවෙන් පෙනී සිටීමයි. මෙම ප්‍රයත්නයන් ආර්ථික සංවර්ධනයට සහ උසස් තොරතුරු තාක්ෂණ සමාජයක් සාක්ෂාත් කර ගැනීමටත්; තොරතුරු තාක්ෂණය හා අදාළ තාක්ෂණයන්ට අනුවර්තනය වීමට පහසුකම් සැපයීමටත්; විද්‍යාව, තාක්‍ෂණය සහ ව්‍යාපාර කළමනාකරණයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයන්හි න්‍යාය හා ප්‍රායෝගික තාක්‍ෂණය පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමටත් ඉවහල් වනු ඇතැයි අපි විශ්වාස කරමු. මෙම ජයග්‍රහණයන් ඉහළ නිපුණතා සහිත වෘත්තිකයන්ගෙන් හෙබි අනාගත පරම්පරා බිහි කිරීමට හේතු වනු ඇතැයි අපි තවදුරටත් විශ්වාස කරමු.

KCGI ආරම්භ වනතුරු, උපාධි අපේක්ෂක හා උපාධි විද්‍යාල මට්ටමින් වූ වෙබ් ව්‍යාපාර (ඊ-ව්‍යාපාර) පිළිබඳ ප්‍රධාන උපාධි වැඩසටහන් ජපානයේ නොතිබූ තරම් ය. මෙම ප්‍රධාන උපාධි සලකන ලද්දේ හුදෙක්ම ව්‍යාපාර කළමනාකරණය කාර්මික ඉංජිනේරු තාක්ෂණය සහ තොරතුරු සම්බන්ධ ප්‍රධාන උපාධි වැනි සාම්ප්‍රදායික ප්‍රධාන උපාධි වැඩසටහන් වල අනු-ක්ෂේත්‍රයක් ලෙසය. ගෞරව උපාධි පර්යේෂණය සහ ඉගැන්වීම සිදු වූයේ හුදෙක්ම ක්‍රමික හා පුළුල් ප්‍රධාන උපාධියක කොටසක් ලෙස හෝ ප්‍රධාන උපාධි ක්ෂේත්‍රයක කොටසක් ලෙස ය.

KCGI වෙන්කර හඳුනාගත හැකි කරුණ වන්නේ, තොරතුරු තාක්ෂණය පිළිබඳ පුළුල් අර්ථයෙන් තොරතුරු තාක්ෂණ වෘත්තීය උපාධි පාසලක් ලෙස ගත්කළ, නායකත්ව හැකියාවන් ඔප්නැංවීම කෙරෙහි ද අවධානය යොමු කෙරෙන ලෝක මට්ටමේ වෘත්තීය පාසලක් වීම අපගේ ඉලක්කය වීමයි. බොහෝ විශ්වවිද්‍යාල මෙන් නොව, අපි "සිරස්ව බෙදුණු තනි ක්ෂේත්‍ර" පරිගණක විද්‍යා උපාධි පාසලක් හෝ තොරතුරු විද්‍යා හා ගණිත උපාධි පාසලක් නොවේ. අප සහ එම ආයතන සතු බොහෝ සමානකම් තිබුණද, අප පාසල වෙනස් ප්‍රභේදයක උපාධි පාසලකි. අධ්‍යාපනික දෘෂ්ටි කෝණය මත පදනම් වූ විෂයමාලා සැලසුම් සහ උපදේශක ගුරු පද්ධතියකට අමතරව, ජපාන විශ්ව විද්‍යාල වල කලාතුරකින් දක්නට ලැබෙන පුළුල් පරාසයක අංග සහ ප්‍රතිපත්ති ඒකාබද්ධ කරමින් මනාව සැකසූ සමබර අධ්‍යාපන ක්‍රමයක් සැපයීමට KCGI ඉලක්ක කරයි. මෙයට ශිෂ්‍ය-මූලික උපදේශන සැලසුමක්, විවෘත හා තිරස් ශ්‍රම විභාජනයක් සහිත අධ්‍යාපන ක්‍රමවේදයක් සහ කාලානුරූපීව සිදුකෙරෙන ඉගෙනුම් ප්‍රතිඵල ඇගයීම් ඇතුලත් වේ.

තවද, ආසියාව හා ලෝකය පුරා වැඩ කිරීමට තම හැකියාවන් යෙදවිය හැකි තොරතුරු තාක්‍ෂණ හා කළමනාකරණ කුසලතා වලින් පිරිපුන් ජාත්‍යන්තර නායකයින් සහ ව්‍යාපාරිකයින් බිහිකිරීමේ ඉලක්කයද KCGI හට ඇත. KCGI අප විසින් ලොව පුරා සිසුන් සක්‍රීයව අප වෙත පිළිගනු ලබන්නේ, ආරම්භයේ පටන්ම අප සතුව තිබූ ආසියාවේ අංක එකේ තොරතුරු තාක්ෂණ වෘත්තීය පාසල බවට පත්වීමේ අරමුණෙහි කොටසක් ලෙසය.

තොරතුරු තාක්‍ෂණය අද අපගේ දෛනික ජීවිතයේදී සහ කර්මාන්තයේ අත්‍යවශ්‍යක අංගයකි. ආශ්‍රිත ක්ෂේත්‍ර ගණනාවකට විවිධාංගීකරණය වී ඇති තොරතුරු තාක්ෂණය මගින් සමාජීය අවශ්‍යතා රාශියක් සපුරාලයි. KCGI හිදී සිසුන් තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සාමාන්‍ය මූලික පුහුණුවක් ලබා ගනී. සිසුන්ට තමා ඉගෙන ගත් දේ ප්‍රායෝගිකව යෙදවීමට සහ තමා තෝරාගත් ක්ෂේත්‍රවල ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට හැකි බව සහතික කර ගැනීමට හැකි වන පරිදි විෂය මාලාව අඛණ්ඩව සංශෝධනය හා යාවත්කාලීන කිරීම සිදු කරයි. KCGI තුළ පාඨමාලා සම්පූර්ණ කරන සිසුන් සතුව ජපානය තුළ හෝ විදේශ රටවල ඕනෑම පුළුල් පරාසයක ක්ෂේත්‍රවල ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා සම්භාරයක් මෙන්ම පුළුල් දෘෂ්ටියක් ඇත.

KCGI විසින් සප්පෝරෝ සහ තෝකියෝ වලද පරිවාර සරසවි පිහිටුවා ඇත. මෙම පරිවාර සරසවි කියෝතෝ හි ප්‍රධාන පාසලට ඊ-ඉගෙනුම් පද්ධතියක් හරහා සම්බන්ධ කර ඇති අතර එමඟින් සිසුන්ට පරිවාර සරසවියක ඉගෙනුම ලබන අතරතුර නවීනතම තොරතුරු තාක්ෂණ වෘත්තීය අධ්‍යාපනය ලබාගත හැකිය. පාඨමාලා තථ්‍ය කාලීනව (රියල් ටයිම් ලෙස) සිදු කෙරෙන අතර, එමඟින් සිසුන්ට සෘජුවම කැමරාව හරහා මහාචාර්යවරුන්ගෙන් ප්‍රශ්න ඇසිය හැකි වේ. මෙම පාඨමාලා ද පටිගත කර ඇති බැවින් සිසුන්ට අපගේ සර්වරයේ ගබඩා කර ඇති පාඨමාලා නිවසේ සිටම බැලිය හැකිය. කුමන වේලාවක කොතැනක සිටියද, ඉඩ අවකාශයේ හා කාලයේ බාධක ඉක්මවා යමින්, ඉතා උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාගැනීමේ හැකියාව සිසුන් සතුය. මීට අමතරව, එක්සත් ජනපදය, චීනය සහ දකුණු කොරියාව ඇතුළු ලොව පුරා උසස් අධ්‍යාපන ආයතන හා සම්බන්ධ වන ශක්තිමත් ජාලයකට KCGI උරුමකම් කියයි. KCGI සිය අධ්‍යාපනික මෙහෙයුම් සක්‍රිය ලෙස වැඩිදියුණු කරගන්නේ මෙම ජාත්‍යන්තර සම්බන්ධතා ජාලය තවදුරටත් පුළුල් කර ගනිමිනි.

මීට අමතරව, KCGI එක්සත් ජනපදය, චීනය, දකුණු කොරියාව සහ ලොව පුරා වෙනත් රටවල හවුල්කාරිත්ව සහ හුවමාරු කටයුතු සඳහා පුළුල් විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපනායතන ජාලයක් ස්වාධීනව ගොඩනඟමින් සිටී. දැනටමත් KCGI සිසුන්ට ලොව පුරා උසස් අධ්‍යාපන ආයතන 100කට අධික සංඛ්‍යාවක් සමග පවතින හවුල්කාරිත්වයන්ගේ ප්‍රයෝජන අත්විඳිය හැක. දැනට පවතින සබඳතා ශක්තිමත් කර ගන්නා අතරතුර, KCGI තම අධ්‍යාපන ව්‍යාපාරය සක්‍රීයව වර්ධනය කර ගනිමින් සිටී. KCGI ආරම්භයේ දී එයට ඇතුළත් වීමේ හැකියාව තිබුණේ සිසුන් 80කට (මුළු ධාරිතාව 160) පමණි. 2023 අප්‍රේල් මාසයේ සිට එහි ඇතුළත් වීමේ ධාරිතාව සිසුන් 700ක් (2024 මූල්‍ය වර්ෂයේ මුළු ධාරිතාව 1,400) වන අතර, එය 9 ගුණයක ප්‍රසාරණයකි. සිසුන් ඇතුළත් කර ගැනීමේ මෙම හැකියාව ජපානයේ ඕනෑම තොරතුරු උපාධි පාසලක් සඳහා වූ ඉහළම අගයකි.

වත්මන් ලෝකයේ උද්ගත වන කලබලකාරී වෙනස්කම් මධ්‍යයේ, ඉතා උසස් මට්ටමේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බිහි කිරීම උදෙසා KCGI දැඩි ප්‍රයත්නයක් දරන්නේ අපගේ ආරම්භක දර්ශනය සහ ස්ථාපිත මෙහෙවර හා අරමුණු තුළින් වන මෙහෙයවීමෙනි. ඔබ වැනි අභිලාෂයෙන් අනූන සිසු සිසුවියන්ගේ ආගමනය දෙස මා ඉතා අපේක්ෂාවෙන් බලා සිටිමි.

kcg.edu
The Kyoto College of Graduate Studies for Informatics

# අභියෝගාත්මක ජීවයකින් හෙබි නව යුගයක පුරෝගාමීත්වය



**කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලයේ පීඨාධිපති, ව්‍යවහාරික තොරතුරු තාක්‍ෂණ පාසලේ සභාපති**

## ෂින්ජි ටොමීටා 富田 眞治

## Shinji Tomita

ඉංජිනේරුවේදී උපාධිය කියෝතෝ විශ්ව විද්‍යාලය, ඉංජිනේරු විද්‍යාව ආචාර්ය උපාධිය කියෝතෝ විශ්ව විද්‍යාලය (විදුලි ඉන්ජිනේරු විද්‍යාව ප්‍රධාන විෂය)

සම්මානිත මහාචාර්ය, කියෝතෝ විශ්ව විද්‍යාලය හිටපු පීඨාධිපති, තොරතුරු විද්‍යාව සඳහා උපාධි අධ්‍යයන පාසල, කියෝතෝ විශ්ව විද්‍යාලය; හිටපු අධ්‍යක්ෂ, පොදු මාධ්‍ය මධ්‍යස්ථානය, කියෝතෝ විශ්ව විද්‍යාලය; හිටපු මහාචාර්ය සහ පරිපාලන අංශ ප්‍රධානි නිර්ණිත පදනම, ද්‍රව්‍යමය සෛල ඒකාබද්ධ කළ පද්ධති පදනම කියෝතෝ විශ්ව විද්‍යාලය; හිටපු මහාචාර්ය, කියූෂු විශ්ව විද්‍යාලය; උපදේශක මහාචාර්ය, හර්බින් තාක්ෂණික ආයතනය

සාමාජික, ආචාර්ය උපාධි ප්‍රධාන වැඩසටහන් කමිටුව ඒකාබද්ධ ක්ෂේත්‍රය (තොරතුරු තාක්ෂණය); හෙබවූ වෙනත් නිළතල, සාමාජික, ටී සී.10 කමිටුව, තොරතුරු සැකසුම් සඳහා ජාත්‍යන්තර සම්මේලනය (IFIP); භාරකාර, ජපාන තොරතුරු සැකසුම් සංගමය (IPSJ); ශාඛා අධ්‍යක්ෂ, කන්සායි ශාඛාව, IPSJ; ආරාධිත පර්යේෂණ අධ්‍යක්ෂ, උසස් තාක්ෂණ විද්‍යාව හා කළමනාකරණ පර්යේෂණ ආයතනය, කියෝතෝ (ASTEM RI/Kyoto); සාමාජික, කියෝතෝ දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ උපදේශක මණ්ඩලය; සාමාජික, විද්වත් පරීක්ෂණ කමිටුව, විද්‍යා තාක්ෂණ නවෝත්පාදන කවුන්සිලය (CSTI) එක්සාස්කේල් සුපිරි පරිගණක සංවර්ධන ව්‍යාපෘතිය, ව්‍යපෘති ඇගයුම් හා පරීක්ෂණ කමිටුව; සහ සභාපති, කියෝතෝ ප්‍රාන්ත තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති විශේෂඥ මණ්ඩලය

අධිශිෂ්‍ය, ඉලෙක්ට්‍රෝනික, තොරතුරු සහ සන්නිවේදන ඉන්ජිනේරුවන්ගේ ආයතනය (IEICE); අධිශිෂ්‍ය, IPSJ

**පාඨමාලා:** පරිගණක සැකසුම් න්‍යාය, ගෞරව ප්‍රධාන නිබන්ධනය

**1945** වසරේ පෙන්සිල්වේනියා විශ්ව විද්‍යාලයේ Moore පාසලෙන් අද භාවිතා කෙරෙන පරිගණකයේ මූලාකෘතිය වූ තිළැලි (built-in) වැඩසටහනක් යෝජනා කළ දා සිට වසර 80කට ආසන්න කාලයක් ඉක්මවා ගොස් ඇත. දිගු කලක් තිස්සේ පරිගණක සමග කටයුතු කරන අයෙකු වන මා පරිගණකයේ වැඩිදියුණුව දකින්නේ ඉතා විශ්මයජනක දෙයක් ලෙස යි. 1950 ගණන්වල දී පරිගණක වාණිජකරණය ආරම්භ වූ අතර සංඛ්‍යාත්මක ගණනය කිරීම් සඳහා FORTRAN, කාර්යාලයීය භාවිතය සඳහා COBOL සහ කෘත්‍රිම බුද්ධිය සඳහා LISP වැනි ක්‍රමලේඛ භාෂා වැඩිදියුණු කර විවිධ ක්ෂේත්‍ර සඳහා යොදා ගන්නා ලදී. 1964 දී IBM 360 පරිගණකය මගින් විශාල පොදු කාර්ය පරිගණකයේ සම්පූර්ණ කිරීම සනිටුහන් විය. එතැන් පටන් පරිගණකයේ විශාලත්වය ක්‍රමයෙන් අඩු වූ අතර, 1970 පමණ වන විට UNIX මෙහෙයුම් පද්ධතිය, ව්‍යුහගත ක්‍රමලේඛනය, ARPANET (අන්තර්ජාලයේ මූලාකෘතිය), 1kbit DRAM ආදී තාක්‍ෂණයන්, Intel 4004 4-bit මයික්‍රොප්‍රොසෙසරය, C.mmp හවුල් මතක සමාන්තර පරිගණකය සහ වෙනත් බොහෝ දෑ වාණිජමය භාවිතයට පැමිණියහ. මේ කාලයේ වයස විසි ගණන්වල පසුවූ මා හට පරිගණක සම්බන්ධ සෑම පර්යේෂණ කටයුත්තක්ම ඉතා විනෝදජනක හා උද්යෝගිමත් විය. ඇත්තෙන්ම මම නව්‍ය ව්‍යුහයක් සහිත තරමක් විශාල පරිගණකයක් සැලසුම් කර නිර්මාණය කළෙමි.

1970 ගණන්වල සිට ප්‍රොසෙසරය, මතකය, දෘඪ තැටිය, සන්නිවේදන තාක්‍ෂණයන් ආදිය අඛණ්ඩව වැඩිදියුණු වී වඩාත් සංකලිත (integrated) වී ඇත. මෙම තාක්‍ෂණයන් කිසිවක් නොවන්නට, පරිගණක අද මෙන් පුළුල් ලෙස ව්‍යාප්ත නොවන්නට ඉඩ තිබිණි. අද වේගවත්ම පරිගණකයේ පරිගණන බලය තත්පරයට මෙහෙයුම් 1018 ඉක්මවයි (1949 දී කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ සංවර්ධනය කරන ලද, පළමු පරිගණකය වූ EDSAC හි පරිගණන බලය තත්පරයට මෙහෙයුම් 667ක් විය).

පරිගණන බලයේ වැඩිදියුණුවට අමතරව, ලෝක ව්‍යාප්ත වෙබ් සහ දත්ත කැණීම වැනි අති විශාල දත්ත ප්‍රමාණයක් (Big Data) සඳහා වූ නව පරිගණක සැකසුම් ක්‍රම 1989 සිට භාවිතා කර ඇත. 1960 ගණන්වල සිට අධ්‍යයනයන් සිදු කර ඇති ස්නායුක ජාල 2000 ගණන්වල සිට තවදුරටත් පරිණාමය වී ඇති අතර, එය ස්වාභාවික භාෂාව, කථනය සහ රූප සංවේදනය ආදී කටයුතුවල රටා හඳුනා ගැනීම සඳහා පමණක් නොව, ආයතනික ව්‍යාපාර උපායමාර්ග සැලසුම් කිරීම හා ව්‍යාපාරික ලෝකයේ තීරණ ගැනීම සඳහා වූ ගැඹුරු ඉගෙනුම් ඇල්ගොරිතම ලෙස ද වර්තමානයේ බහුලව භාවිතා වේ.

තරුණ සිසුන් කෘත්‍රිම බුද්ධිය සහ දත්ත විද්‍යාව වැනි නව ක්ෂේත්‍ර සඳහා සංකලිත විද්‍යාවක් හා තාක්‍ෂණයක් ලෙස තමාට හැකි උපරිමයෙන් මෙම පරිගණක භාවිතා කරනු ඇති බවත්, ඔවුන් වෙනත් නව ක්ෂේත්‍රවල පුරෝගාමීන් බවට පත් වී මානව වර්ගයාගේ යහපැවැත්ම වෙනුවෙන් සැබෑ දායකත්වයක් ලබා දෙනු ඇති බවත් මා සිතමි. 1970 ගණන්වල මා අත්විඳි අයුරින්ම වර්තමානය ද ඉතා උද්වේගකර සහ අභියෝගාත්මක කාල වකවානුවක් වන අතර, මා තරමටම ඔබත් මෙම පර්යේෂණ සහ ඉගෙනීම කටයුතු ඉතා උනන්දුවෙන් සිදු කරනු ඇතැයි මා සිතමි.

තොරතුරු තාක්‍ෂණයේ වර්ධන සහ සංවර්ධන කටයුතු මධ්‍යයේ, අපි ජපානයේ තොරතුරු තාක්‍ෂණය පිළිබඳ විශේෂීකරණය වූ පළමු සහ එකම උපාධි පාසල ස්ථාපිත කළෙමු. අපි 2004 අප්‍රේල් මාසයේ දී පළමු සිසු පිරිස බඳවාගත් අතර ලබන වසරට අපගේ 20 වන සංවත්සරය යෙදී තිබේ. සිසුන් 80 දෙනෙක් වූ බඳවා ගැනීමේ ධාරිතාවකින් කටයුතු ආරම්භ කළ අපි, මෙම වසරේ සිට එම ධාරිතාව සිසුන් 700ක් දක්වා ඉහළ නංවා ඇත. සප්පෝරෝ සහ තෝකියෝ නගරවල ද අපගේ පරිවාර පාසල් පිහිටා ඇත. පරිගණක තාක්‍ෂණය ළදරු අවධියේ පැවති කාලයේ 1963 වසරේ පිහිටුවන ලද කියෝතෝ කොම්පියුටර් ගකුයින් හි සම්ප්‍රදාය සහ ජයග්‍රහණ මෙම උපාධි පාසල උරුම කොටගෙන ඇත. පරිගණක පැවති බව 1960 ගණන්වල අගභාගය වන තෙක් මා දැන සිටියේ නැත (ඇත්තෙන්ම කියෝතෝ විශ්ව විද්‍යාලයේ හවුල් භාවිතය සඳහා පරිගණක මධ්‍යස්ථානයක් තිබූ අතර, පර්යේෂකයන් එය භාවිතා කළ බව මට විශ්වාස ය). පරිගණකවල ආරම්භයේදී ම, එනම් 1963 වන විට FORTRAN අධ්‍යයන කණ්ඩායම ස්ථාපිත කර තිබූ අතර ඔවුන්ට ඉතා හොඳ දූරදර්ශී බවක් තිබූ බව මා විශ්වාස කරමි.

පාසලේ ස්ථාපිත දර්ශනයේ සඳහන් වන්නේ: “සමාජයේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට, කාලානුයෝගී අභියෝග භාර ගැනීමට සහ ඉදිරි පරම්පරාවට නායකත්වය දීමට උසස් ප්‍රායෝගික හැකියාවන්ගෙන් සහ නිර්මාණශීලීත්වයෙන් හෙබි ව්‍යවහාරික තොරතුරු තාක්‍ෂණ විශේෂඥයින් බිහි කිරීම”, ලෙස යි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, අපි කියෝතෝ උපාධි අධ්‍යයන විද්‍යාලයෙහි වෙබ් ව්‍යාපාර තාක්‍ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කර, කෘත්‍රිම බුද්ධිය, දත්ත විද්‍යාව, වෙබ් පද්ධති සංවර්ධනය, ජාලකරණ පරිපාලනය, ගෝලීය ව්‍යවසායකත්වය, ERP (ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය), IT මාංගා සජීවීකරණය, සහ සංචාරක තොරතුරු තාක්‍ෂණය ඇතුළු පුළුල් පරාසයක ව්‍යවහාරික තොරතුරු තාක්‍ෂණයෙන් යුත් විශේෂිකෘත ක්ෂේත්‍ර සංවර්ධනය කළෙමු. සිසුන් මෙම ක්ෂේත්‍රවලින් එකක් තෝරා ගනු ඇත. මෙම විශේෂීකෘත ක්ෂේත්‍රවලට අමතරව, සිසුන්ට සිතැඟි පරිදි පාඨමාලා තෝරාගත හැකි වරණීය පාඨමාලා සහ සංකේන්ද්‍රීය පාඨමාලා (කෘෂිකර්මය, අධ්‍යාපනවේදය, අන්තර්ගත අලෙවිකරණය, මූල්‍ය, සමුද්‍රීය, වෛද්‍ය ආදී) ඇත.

සියලුම සිසුන් තම ගුරුවරුන් සමග සමීප සන්නිවේදනයක් පවත්වා ගනිමින් තම අධ්‍යයන කටයුතු සිදු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. ප්‍රශ්න ඇසීමෙන් විෂය කරුණු වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට ඔබට හැකි වන අතර, ගුරුවරුන්ට තම පන්තිවල ඉගෙනුම් අන්තර්ගතය සමාලෝචනය කිරීමට ද එය උපකාරී වනු ඇත. මූලික විෂයයන්වල වැදගත්කම අවබෝධ කර ගැනීම ද වැදගත් වේ. ඔබට මෙම පාසලේ දී විවිධ තාක්‍ෂණික ක්‍රම පිළිබඳව ඉගෙන ගත හැකි අතර ඒවා ගැන ඉගෙන ගැනීමට ශක්තිමත් මූලික දැනුමක් අවශ්‍ය වේ. විශේෂයෙන්ම රේඛීය වීජ ගණිතය, කලනය සහ සංඛ්‍යානය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වේ. අපගේ බොහෝ සිසුන් ලිබරල් කලා පසුබිම්වලින් පැමිණේ. මූලික විෂයයන් හොඳින් අධ්‍යයනය කිරීමට අපි මෙම සිසුන්ව දිරිමත් කරමු.

ප්‍රධාන ව්‍යාපෘතිය (MP) මෙම පාසලේ අනිවාර්ය වැඩසටහනක් වන අතර එමගින් සිසුන්ට තමාගේම පර්යේෂණ මාතෘකා සොයා ගැනීම, පර්යේෂණ ප්‍රවණතා විමර්ශනය කිරීම සහ නව දැනුම ලබා ගැනීම කළ හැක. ලොව පුරා සිටින පර්යේෂකයන් සමග තරඟ කිරීමට ඔබට හැකි වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. මෙම පර්යේෂණය ඔබට ඉතා ප්‍රියජනක වනු ඇති බව මා විශ්වාස කරමි.

උසස් පර්යේෂණ ජයග්‍රහණවලට හිමිකම් කියන අප පාසලේ ගුරුවරුන්ට අමතරව, හිටපු CIOවරුන් සහ ව්‍යවසායකයින් මෙන්ම ජපන් ජාතික නොවන ගුරුවරුන් ආදී සැබෑ ලෝකයේ අත්දැකීම්වලින් සන්නද්ධ බොහෝ ගුරුවරුන් අප සතුව ඇති අතර, එබැවින් සිසුන්ට තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ න්‍යායයන් සහ භාවිතයන් පිළිබඳ මනා සමතුලිත ඉගෙනුමක් ලබා ගත හැක.

තොරතුරු තාක්‍ෂණයෙන් සමාජයට ඇති බලපෑම මනාව වටහාගෙන, එය අධ්‍යයනය හරහා සමාජය නිවැරදි දිශානතිය කරා මෙහෙයවන උසස් නිපුණතා සහිත වෘත්තිකයන් බිහි කිරීම අපගේ බලාපොරොත්තුව යි. වයස, පසුබිම, ජාතිකත්වය සහ මානව ශාස්ත්‍ර හෝ විද්‍යාවන්ගේ පසුබිම නොසලකා අනාගතය පිළිබඳ ඉහළ අභිලාෂයන්ගෙන් යුත් ඕනෑම අයෙකුට අපගේ දොරටු විවෘත ය. අලුත උපාධි ලැබූ විශ්වවිද්‍යාල උපාධිධාරීන්, තම වෘත්තීන් උසස් කර ගැනීමේ අපේක්‍ෂාවෙන් පසුවන රැකියාවේ නියුතු වෘත්තිකයන් සහ විදේශ රටවල ජීවත් වන අතරතුර ජපානයේ අධ්‍යාපනය ලැබීමට උනන්දුවක් දක්වන ජාත්‍යන්තර සිසුන් ඇතුළු සියලුම සිසුන් අපි සාදරයෙන් පිළිගනිමු.

## KCG සමූහයේ වර්ණය

### KCG රතු
(කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලයේ පාසල් වර්ණය (KCGI))

The Kyoto College of Graduate Studies for Informatics

පාසල් කළමනාකාරිත්වය හැර, KCG සමූහයේ නිර්මාතෘ, සිජියෝ හාසේගාවා, තමන් තරුණ අවධියේ සිටියදී කිරීමට නොහැකි වූ අධ්‍යාපනයට අභියෝග කිරීම සඳහා හාවර්ඩ් විශ්ව විද්‍යාලයේදී ඔහුගේ පසුකාලීන වසරවල නැවතත් අධ්‍යයනය කරන ලදී. ඔහු බොස්ටන් හී අනුනිවාසයක් කුලියට ගෙන තරුණ සිසුන් සමඟ සාහිත්‍ය සහ දර්ශණය පිළිබඳ පන්තියකට සහභාගී විය. නිර්මාතෘ ඉගෙන ගත් හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ පාසල් වර්ණය වන තද රතු වර්ණය මත පදනම් වී, KCGI හි පාසල් වර්ණය KCG නිල් වර්ණයට ප්‍රතිවිරෝධී වර්ණයක් ලෙස KCG රතු ලෙස ස්ථාපිත කර ඇත. මෙයින් වයස හෝ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ නොසලකා උද්යෝගයෙන් අභියෝග කිරීමට සහ අලුත් දෙයක් ඉගෙන ගැනීමේ ආකල්පය ප්‍රකාශ කරයි.

### KCG තැඹිලි
(කියෝතෝ කොම්පියුටර් ගැකුයින්ඔටෝමොබයිල් පාසලේ පාසල් වර්ණය (KCGM))

Kyoto Computer Gakuin Automobile School

කියෝතෝ කොම්පියුටර් ගකුයින් මෝටර් රථ කාර්මික පාසලෙහි පාසල් වර්ණය 2013 දී තීරණය කරන ලද්දේ පාසල KCG සමූහයට ඇතුල් වූ විට යි. තැඹිලි වර්ණය මගින් ගතික, ධනාත්මක ප්‍රතිරූපයක් විදහා දක්වන අතරම, එය ආරක්ෂාව සඳහා වූ දැෂ්‍යතාව ඉහළ නැංවීමට භාවිතා වේ. ඒ නිසාම එය මෝටර් රථවලින් පිරුණු වත්මන් සමාජයේ ආරක්ෂාව ලුහුබැඳීම මෙන්ම දුෂ්කරතා මඟහරවා ගැනීමට සිසුන් දරන දැඩි ප්‍රයත්නයන් සංකේතවත් කරයි.

### KCG නිල්
(කියෝතෝ කොම්පියුටර් ගැකුයින් (KCG) සහ KCG සමූහයේ පාසල් වර්ණය)

Kyoto Computer Gakuin

KCG ස්ථාපිත කිරීම තුළ එහි මුල් සාමාජිකයින් සියලූම දෙනා උපාධිධාරීන් සහ කියෝතෝ විශ්ව විද්‍යාලයේ උපාධි සිසුන් වූ නිසා, KCG සහ KCG සමූහයේ වර්ණය තද නිල් පැහැ ගත් කියෝතෝ විශ්ව විද්‍යාලයේ පාසල් වර්ණය මත පදනම් වී තෝරා ගෙන ඇත. මෙම වර්ණය 1970 සිට භාවිතා කිරීම ආරම්භ කර ඇත. 1998 දී 35 ස් වැනි සංවත්සරයේදී “KCG නිල්” ලෙස වර්ණයක් අපි අර්ථවක් කැළෙමු.

### KCG කොළ
(කියෝතෝ ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථානයේ පාසල් වර්ණය (KJLTC))

Kyoto Japanese Language Training Center

අන්තර් ජාතික සිසුන් සඳහා, මෙම මධ්‍යස්ථානය KCG සමූහයේ පළමු ප්‍රවේශය වේ. මෙම මධ්‍යස්ථානය අධිකරණ අමාත්‍යංශය විසින් දැනුම් දෙන ලද ජපාන භාෂා අධ්‍යාපනික පහසුකමක් වන අතර, අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යංශය විසින් ප්‍රාරම්භක අධ්‍යාපනික විෂයමාලාවක් ලෙස පවරන ලදී. මහාද්වීප හතේ හරිත භූමියේ ප්‍රතිරූපයකින්, ඉහත සඳහන් KCG නිල් සහ KCG රතුවලට ප්‍රතිවිරෝධී වර්ණයක් ලෙස පාසල් වර්ණය ලෙස කොළ වර්ණය තෝරා ගන ලදී.

# KCGI හි ලක්ෂණ

## සැබවින්ම සමාජය හට ප්‍රයෝජනව ප්‍රායෝගික හැකියාවන් ප්‍රගුණ කිරීම.

**■ කර්මාන්තයේ අවශ්‍යතා සහ තොරතුරු තාක්ෂණයේ උන්නතීන් වලට අනුරූප ලෙස සැකසූ විෂයමාලා සැලසුම්**

KCGI හි විෂයමාලා, පාඨමාලා සැලසුම් සහ උපදේශාත්මක සැලසුම් කර්මාන්තයේ අවශ්‍යතා අනුව අනුවර්තනය කරන ලද අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල තුල සහ බාහිර විශේෂඥයින්ගෙන් උපදෙස් ලබා ගැනීමෙන් නිර්මාණය කරනු ලබයි. මීට අමතරව තොරතුරු තාක්ෂණයේ (ICT) වේගවත් වෙනස්කම්වලට සරිලන පරිදි එක්සත් ජනපදයේ රෝචෙස්ටර් තාක්ෂණික ආයතනය සමඟ වන සහයෝගීතාවයන් පදනම්ව ලොව විශිෂ්ටතම තොරතුරු තාක්ෂණ අධ්‍යාපන විෂය මාලා ආනයනය කර ඒකාබද්ධව සංවර්ධනය කර ඇත.

**■ පුහුණුව හොඳින් පදනම් වූ විෂයමාලා සංයුතිය**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) හා කළමනාකරණ කුසලතා ඇති මානව සම්පත් වර්ධනය කිරීම අරමුණු කොටගෙන, සිසුන් තුල තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා පමණක් නොව, කළමනාකරණ හා ආර්ථික විද්‍යාව වැනි එම ව්‍යාපාරයට සම්බන්ධ අනෙකුත් විෂයන් සඳහා ද තිබිය යුතු නිපුණතා පිළිබඳව KCGI අවධානය යොමු කරයි. KCGI හි සිසුන් ඔවුන්ගේ අවසන් වසර තුළ ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය වෙනුවට ඔවුන් විසින් සැලසුම් කරගත් ප්‍රධාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනුයේ ඔවුන්ගේ වෘත්තීය ජීවිතය සනාථ කරගැනීමට අවශ්‍ය කරන උසස් මට්ටමේ නිපුණතා වලින් සන්නද්ධ වෙමිනි.

**■ ඉ-ඉගෙනුම් සහ පන්ති කාමරයේ ඉගෙනීම තුලින් ඵලදායි අධ්‍යාපන ක්‍රම අනුගමනය කිරීම**

KCGI එහි ආරම්භයේ සිටම සෑම විටම නවතම ඉ-ඉගෙනුම් පද්ධති ක්‍රියාවට නංවා ඇත. පසු කලෙක සිසුන් වෙනුවෙන් සප්පොරො සහ තෝකියෝ චන්ද්‍රිකාව පාසල්වල දොරටු විවෘත විය. මීට අමතරව, KCGI ලොව පුරා ඇති විශ්ව විද්‍යාල කියෝතෝ ප්‍රධාන පාසල සමග සම්බන්ධ කරමින් තථ්‍ය කාලීනව සිදු කරන ඔන්ලයින් පන්ති පිරිනමනු ලබයි. KCGI නිරතුරුව යාවත්කාලීනව සිටීමට සහ ඔන්ලයින් පන්තිකාමර තාක්‍ෂණය පිළිබඳ සාර්ථක ක්‍රියාකාරිත්වයක් පවත්වා ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරයි. ගුරුවරයා පැමිණ උගන්වන සාම්ප්‍රදායික පන්ති කාමරය තරමටම ඵලදායී ඔන්ලයින් පන්ති සාර්ථකව සිදු කර ගැනීමට ද අපි මහත් ප්‍රයත්නයක් දරන්නෙමු.

KCGI දැනට පාඩම් කටයුතු සඳහා ආකෘති හතරක් ඉදිරිපත් කරයි:

1) සාම්ප්‍රදායික පන්ති කාමරයක් තුළ සිදු කරන සම්මුඛ පන්ති

2) ඔන්ලයින් සම්මන්ත්‍රණ මෙවලම් සහ ඉ-ඉගෙනුම් පද්ධති හරහා ද්විදිශානතික සන්නිවේදනයට ඉඩ සලසමින් සිදු කරන තථ්‍ය කාලීන ඔන්ලයින් පන්ති

3) ගුරුවරුන් පන්ති කාමරයක හෝ දුරස්ථ ස්ථානයක සිට පාඩම් කටයුතු සිදු කරන, සිසුන් පන්ති කාමරයට පැමිණෙන්නේ ද නැතහොත් නිවසේ සිට හෝ පන්ති කාමරයෙන් පරිබාහිර වෙනත් ස්ථානයක සිට පාඩමට සහභාගී වන්නේ ද යන්න තෝරාගත හැකි හයිබ්‍රිඩ් පන්ති

4) ශිෂ්‍යයාට නිශ්චිත කාල රාමුවක් තුළ පාඩම් අන්තර්ගතය බැලීමට සහ සවන් දීමට හැකි, ඉල්ලුම අනුව පාඩම් ලබාගත හැකි අසමමුහුර්තක පන්ති. මෙම ආකෘති තෝරා ගැනීම හරහා, සිසුන් තමාට නිශ්චිත ස්ථානයකට පැමිණීමට හෝ විශේෂිත මෙවලමක් භාවිතා කිරීමට බල කරනු ලැබීමකින් තොරව පන්තිවලට සහභාගී වේ.

පෙර දී මෙන්ම ඉදිරියටත්, KCGI හි ඉගෙනුම ලබන සිසුන්ට තම අධ්‍යයන කටයුතු ඵලදායීව මෙන්ම ආරක්ෂිතව සහ සැහැල්ලු මනසකින් සිදුකර ගැනීමට හැකි වන පරිදි, වසංගත තත්ත්වයක් යටතේ වුව ද තමාට ගැලපෙන පන්ති ආකෘතිය තෝරා ගැනීමේ හැකියාව ඇත.




හයිබ්‍රිඩ් පන්ති: ඔබට පන්ති කාමරයේ, නිවසේ හෝ වෙනත් ස්ථානයක සිට ඉගෙනීමට තෝරාගත හැකි අධ්‍යයන ක්‍රමය යි

## තොරතුරු තාක්‍ෂණය (ICT) සහ කළමනාකරණය හැදෑරීම සහ එය විවිධ කර්මාන්තවල යොදා ගැනීම.

**■ තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය වැනි විවිධ ක්ෂේත්‍රවල සේවයේ යෙදිය හැකි වෘත්තිකයන් බිහිකිරීම**

අන්තර්ජාල තාක්ෂණය මුඛ්‍ය ප්‍රතිෂ්ඨාව කොටගෙන තොරතුරු තාක්ෂණ (ICT) කුසලතා සහ කළමනාකරණ උපාය මාර්ග නිර්මාණය කිරීම වැනි කළමනාකරණ කුසලතා යන දෙඅංශයේම දක්ෂතා ඇති පුද්ගලයින්ට, වර්තමානයේ ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ ඉල්ලුම ඇත. KCGI තුලින් තොරතුරු සහ කළමණාකරණය වැනි විශේෂිත ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව අවබෝධය සහිත වෘත්තිකයින් බිහි කරයි. ඔවුනොවුන්ගේ පුද්ගලික පසුබිම්වලට ගැලපෙන පරිදි ඉතා හොඳ සමබරතාවකින් යුතුව තොරතුරු සහ කළමනාකරණය ඉගෙනීම සඳහා පාඨමාලා සකස් කර ඇත.

**■ ආයතනික හා වෙනත් තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සහිත උපදේශකයින් ගණනාවක් පත් කිරීම**

වෘත්තිකයන් බිහි කිරීම සඳහා KCGI විසින් ඉහල පෙලේ සමාගම්වල ප්‍රධාන තනතුරු දරන්නන් ලෙස සේවය කරන අත්දැකීම් සහිත උපදේශකයන් වැනි ප්‍රායෝගික පළපුරුදු ගුරු භවතුන් රැසක් පත් කරනු ලබයි. අපගේ එම ගුරු කාර්ය මණ්ඩලය ඔවුන්ගේ සැබෑ අත්දැකීම් මත පදනම්ව පාඨමාලා තුලින් සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා බිහි කරන ලබයි ප්‍රායෝගික භාවිතයට සෘජුවම සම්බන්ධ වූ නවීන න්‍යායන් හා තාක්ෂණය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වැඩි කර ගනිමින් සිසුන් විසින් පුළුල් වෘත්තීය නිපුණතා අත්කර ගනී.

## වෘත්තීය මාර්ග වෙනස් කර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ජය ගන්න.

**■ මානව ශාස්ත්‍ර හෝ විද්‍යා ආදී පුළුල් පරාසයක ක්ෂේත්‍රයන් වල සිසුන්ට ඇතුල් විය හැකිය**

KCGI හි එක් පරමාර්ථයක් වනුයේ පුළුල් පරාසයක පසුබිම් වලින් සන්නද්ධ උසස් තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සංවර්ධනය කිරීමයි. ඔවුන් උපාධිය ලැබීමට අපේක්ෂා කරන දෙපාර්තමේන්තු හෝ ප්‍රධාන අධ්‍යයන අංශ වලට සීමා පැනවීමකින් තොරව මානව ශාස්ත්‍රයන් මෙන්ම විද්‍යා අංශ වලද විවිධ ක්ෂේත්‍රයන්ගෙන් විවිධ පරාසයක අයදුම්කරුවන් අපි බඳවා ගන්නෙමු. KCGI පුළුල් පරාසයක පසුබිම් සහිත සිසුන්ට සහාය වන්නේ දැනට ඔවුන් සතු දැනුම, කුසලතා සහ අවශ්‍යතාවන්ට සරිලන තෝරා ගත හැකි පාඨමාලා ඔවුන් වෙත පිරිනමමිනි. රැකියාවක නියුතු වැඩිහිටියන්ට රැකියාවේ යෙදී සිටියදී දිගටම ඉගෙනීමේ අවස්ථාව ලබා දීම සඳහා, KCGI විවිධාකාර ඉගෙනුම් විකල්පයන් වල පහසුකම ලබාදේ. මෙතෙක් ජපානයේ උපාධි පාසල් විසින් සාම්ප්‍රදායිකව නිසි අයුරින් ලබා නොදුන් වෘත්තීය මාර්ග වෙනස් කිරීම සඳහා මඟපාදන අවස්ථාවන් අපි නිර්මාණය කර දෙන්නේ අභිමානයෙනි.

**■ ඔබ KCGI වෙත ගෙන එන දැනුමට ගැළපෙන පාඨමාලා තෝරා ගන්න**

KCGI හි තොරතුරු තාක්ෂණ අධ්‍යයනයේ ශිෂ්‍යයින්ගේ කුසලතා මට්ටම් විවිධාකාර වන අතර, පරිගණක පිළිබඳ අල්ප දැනුමක් සහිත මානව ශාස්ත්‍ර උපාධිධාරීන් මෙන්ම තොරතුරු තාක්ෂණ අංශයේ සේවයේ නියුතු පද්ධති ඉංජිනේරුවන්ද ඒ අතර වේ. මේ එක් එක් ශිෂ්‍යයාට ඇති තොරතුරු තාක්ෂණ හැකියාවන් සහ අනාගත ඉලක්ක මත පදනම්ව KCGI විසින් ප්‍රශස්ත පඨමාලා රටාවන් පිරිනමනු ලබයි. ක්ෂේත්‍රය පිලිබඳ පසුබිමකින් තොර සිසුන් හටද මෙමගින් අදියර කිහිපයක් තුලදී ඉතා පහසුවෙන් ඔවුන්ගේ අරමුණු කරා ළඟා වීමට හැකියාව ඇත. සාමාන්‍ය ජපන් උපාධි පාසලක සිසුන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ගැනීම සඳහා ඒකක 32ක් සම්පූර්ණ කරයි. නමුත් KCGI තුළ ශාස්ත්‍රපති උපාධියක් සඳහා ඒකක 44ක් සම්පූර්ණ කළ යුතු අතර, එනම් සාම්ප්‍රදායික උපාධි පාසලකට වඩා ඒකක 12ක් වැඩි ය. මෙසේ කරන්නේ ඇයි? එයට හේතුව KCGI හි අපගේ ඉලක්කය වන්නේ සිසුන් තමා තෝරාගත් ක්‍ෂේත්‍රය පිළිබඳ විශේෂීකෘත ගැඹුරු මෙන්ම පුළුල් දැනුමක් සහිත, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ කුසලතා සහ දැනුම පිළිබඳ මනා දැනුමක් ඇති පුද්ගලයින් පමණක් නොව ඒවා ප්‍රායෝගිකව යොදාගත හැකි පුද්ගලයින් බවට පත් කිරීම යි.

## අප ඉලක්ක කරන්නේ ගෝලීය මට්ටමේ සක්‍රිය භූමිකාවකි

**■ ලොව පුරා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නායකයින් විසින් පවත්වනු ලබන පාඨමාලා**

තොරතුරු තාක්ෂණ ව්‍යාපාරය ගෝලීයව හා ජාතික මායිම් හරහා සංවර්ධනය වන ක්ෂේත්‍රයකි. KCGI විසින් සිසුන්ගේ ජාත්‍යන්තර අපේක්ෂාවන් අත්පත් කර ගැනීමට උපකාර කිරීමට උතුරු ඇමරිකාව හා ආසියාව ඇතුළු ලොව පුරා කලාපයන්ගෙන් උසස් තත්වයේ විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් හට ඇරයුම් කරනු ලබයි. KCGI ඇමෙරිකාවේ රෝචෙස්ටර් තාක්ෂණික ආයතනය හා තොරතුරු ආරක්ෂණය පිලිබඳ ලොව ඉහල පෙලේ වැඩසටහනක් වන කොරියානු විශ්ව විද්‍යාලයේ තොරතුරු ආරක්ෂාව පිළිබඳ උපාධිධාරී පාසල ඇතුළු ලොව පුරා විශ්ව විද්‍යාල සමඟ සහයෝගිතා ගිවිසුම් හා ව්‍යාපාර සහයෝගීතාවයන් නිමා කරයි. KCGI හවුල් පර්යේෂණ හා අන්තර්ජාතික දාර්ශනිකයින්ගේ සම්මන්ත්‍රණ වැනි ජාත්‍යන්තර සබඳතා වර්ධනයට ද සහභාගී වීම සඳහා අවධානය යොමු කොට ඇත.



**■ විදේශීය අධ්‍යයනය සහ එතෙර යැවීමේ පන්ති**

KCGI හට එක්සත් ජනපදයේ නිව්යෝක්හි රොචෙස්ටර් නගරයේ රොචෙස්ටර් තාක්‍ෂණ ආයතනය ඇතුළුව රටවල් ගණනාවක විවිධ විද්‍යාල සහ විශ්වවිද්‍යාල සමග හවුල්කාරිත්වයන් ඇත. KCGI මෙම හවුල්කාර ආයතනවල විදේශ අධ්‍යාපනය ලැබීමට සිසුන් යවන අතරම ජාත්‍යන්තර අධ්‍යයන සම්මන්ත්‍රණවලට ද සහභාගී වේ. අපි විදේශීය සීමාවාසික වැඩසටහන් ද සක්‍රියව භාවිතා කරන අතර, විදේශ රටවල හවුල්කාර පාසල්වල පන්තිවලට ඉගැන්වීම් සහායකයින් (TA) ලෙස සහභාගී වීමට අවස්ථාව ලබා දීම එයට එක් උදාහරණයකි.

## සමාජය තුළ වැජඹීමට ඔබේ අධ්‍යයන කටයුතු උපයෝගී කර ගන්න.

**■ තනි මාර්ගෝපදේශයක් යටතේ ඔබට සුදුසු රැකියාව යථාර්තයක් බවට පත්කර ගැනීම උදෙසා**

KCGI හි අරමුණ වන්නේ සියලුම සිසුන්ට උපාධිය ලැබෙන අවස්ථාව වනවිට රැකියා සොයා ගැනීමට අවස්ථාව ලබා දීමයි. මේ සඳහා සිසුන් භාර උපදේශකයින් සිසුන් වෙනුවෙන් කාර්මික හා වෙනත් ප්‍රජාවන් තුළ තමන් සතු අත්දැකීම් සහ පුද්ගලික ජාලයන් උපයෝගී කරගනී. එක් එක් ශිෂ්‍යයා සමඟ වෙන වෙනම සාකච්ඡා කිරීමෙන් උපදේශකයින් සිසුන්ට ඔවුන්ගේ සිහින වෘත්තීන් සොයා ගැනීමට උපකාර කරයි. මීට අමතරව, KCGI ආයතනය තම ව්‍යාපාර ආරම්භ කිරීමට බලාපොරොත්තු වන සිසුන් සඳහා ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම, කළමනාකරණය කිරීම හා මෙහෙයවීම වැනි අංශ තුල අවශ්‍යය දැනුම ලබා දීම මගින් පුළුල් වූ සහයක් ලබා දෙයි.

**■ උපාධිධාරීන් අතර ව්‍යාපාරික ජාල වර්ධනය කිරීම**

සෑම වසරකම KCGI විසින් තොරතුරු තාක්ෂණයේ ප්‍රධාන අංගයන් කෙරෙහි අවධානය යොමු කරමින් බොහෝ සහ විවිධත්වයෙන් යුත් උපාධිධාරීන් බිහිකරනු ලබන අතර මෙම උපාධිධාරීන්ගෙන් සමන්විත ව්‍යාපාරික ජාලයක් වර්ධනය කිරීම කෙරෙහි KCGI අවධානය යොමු කරයි. ශිෂ්‍ය කාලය තුළදී කණ්ඩායම් කටයුතුවල නිරත වීමට සිසුන්ට අවස්ථා ගණනාවක් ලබා දීම මගින් උපාධි ලබා ගැනීමෙන් පසු එකිනෙකා සතු සුවිශේෂී නිපුණතා වර්ධනය කර ගැනීමටත්, ව්‍යාපාර සංවර්ධනය හා ව්‍යාප්තිය සඳහා සහය දැක්වීමටත් KCGI කටයුතු කරයි.

# ඉංග්‍රීසි මාදිලියේ පරිපූර්ණ පන්ති මාලාවක් හරහා ගෝලීය

*We train students to become global players through a full roster of classes in English Mode.*

# භූමිකාවක් සහිත වෘත්තිකයින් වීමට අපි සිසුන් පුහුණු කරන්නෙමු.

• • •

KCGI විසින් "ඉංග්‍රීසි මාදිලියේ" බොහෝ දේශන පිරිනමන අතර එමගින් සිසුන්ට ඉංග්‍රීසියෙන් පන්තිවලට සහභාගී වීමට සහ KCGI ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසියෙන් ලබා ගැනීමට හැකි වේ. මෙම දේශන සමහරක් විදේශ රටවල ඉහළ පෙළේ ආරාධිත උපදේශකයන් විසින් උගන්වනු ලැබේ. දැනට KCGI රටවල් 15ක සහ කලාපවල විදේශීය සිසුන්ට සත්කාරකත්වය සපයන අතර (2022 මාර්තු මාසයේ දී තම පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් ඇතුළුව), ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඉංග්‍රීසි දේශනවලට සහභාගී වීමට තෝරා ගෙන ඇත. මෙය KCGI තුළ අධ්‍යාපනය ලැබීමේ ඇති ප්‍රධාන වාසියකි.

මෙම විකල්පය විදේශීය සිසුන් සඳහා පමණක් නොවේ. තම ඉංග්‍රීසි ප්‍රවීණතාව යෝග්‍ය මට්ටමට ළඟා වී ඇත්නම් ජපන් සිසුන්ට ද ඉංග්‍රීසි භාෂාවෙන් දේශනවලට සහභාගී විය හැකි ය. KCGI සිය ජපන් සිසුන්ට ICT හදාරන අතරතුර තම ඉංග්‍රීසි ප්‍රවීණතාව ඔප්නංවා ගැනීමට කදිම අවස්ථාවක් ලබා දෙන්නේ ඔවුන්ට විවිධත්වයෙන් යුතු ජාත්‍යන්තර අධ්‍යයන පරිසරයක් ලබා දෙමිනි.

තොරතුරු තාක්‍ෂණ කර්මාන්තය මිනිසුන්ව නවතම තොරතුරුවලින් අඛණ්ඩව යාවත්කාලීනව සිටීමට පොළඹවයි. සාර්ථක අනාගත ව්‍යාපාරිකයන් බවට පත් වනුයේ ප්‍රයෝජනවත් තොරතුරු සංවර්ධන හෝ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගත හැකි පුද්ගලයින් වේ. තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රය සෑම දිනකම නව තාක්‍ෂණයන් ජනනය කරන අතර, එබැවින් නවතම තොරතුරුවලින් යාවත්කාලීන වී සිටීමේ හැකියාව ඉතා වැදගත් වේ. ඇත්තෙන්ම මෙම ප්‍රමුඛ පෙළේ තාක්‍ෂණයන් බොහොමයක් ජපානය වෙත පැමිණෙන්නේ එක්සත් ජනපදයෙන් සහ අනෙකුත් විදේශීය රටවල් සහ කලාපවලින් බැවින් ඒවායේ තාක්ෂණික තොරතුරු සෑම විටම පාහේ ලියා ඇත්තේ ඉංග්‍රීසි බසිනි. නිල භාෂාව ලෙස ඉංග්‍රීසි භාවිතා වන රටවල ඉංජිනේරුවන් ප්‍රමාණය ජපන් ඉංජිනේරුවන් ප්‍රමාණයට වඩා බෙහෙවින් විශාල බැවින් උසස් තත්ත්වයේ තොරතුරු සහ ලිපි බොහෝ අවස්ථාවල ලියනු ලබන්නේ ඉංග්‍රීසි බසිනි. ඔබේ රාජකාරි ඉටු කිරීමට සහ ඔබේ කුසලතා වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා තොරතුරු ඔබට ඉක්මනින් සපුරා ගත හැකි නම්, එම හැකියාව ඔබේ කාර්යයන් ඉටුකර ගැනීමේ දී සැලකිය යුතු වාසියක් වනු ඇති බව නිසැකවම ඔබට පෙනී යනු ඇත.



තම කර්මාන්තයේ ඉහළමටම යාමට අපේක්‍ෂා කරන සිසුන්ට (නිදසුනක් ලෙස විදේශීය අනුබද්ධිත තොරතුරු තාක්‍ෂණ සමාගමක හෝ උපදේශන සමාගමක), KCGI හි ඉංග්‍රීසි මාදිලියේ ඉගෙනුමෙන් ලැබෙන මෙම වාසිය යහපත් වෙනසක් සඳහා භාවිතා කළ හැක.

## ඉංග්‍රීසි මාදිලියේ පාඨමාලාවේ අනුග්‍රාහකයාගේ පණිවුඩ

**සහායක මහාචාර්ය බද්ර් මොචිසුකි Badr Mochizuki**

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ දී ගෝලීය ශ්‍රම බලකායක් වර්ධනය කිරීම සහ සිසුන් තුළ ජාත්‍යන්තර මානසිකත්වයක් ඇති කිරීම අත්‍යවශ්‍ය ප්‍රමුඛතාවක් ලෙස සැලකේ. ළමා කාලයේ සිටම මා හැදී වැඩුණේ සංස්කෘතීන් සහ ආගම් අතර සාමකාමී සහජීවනයක් පැවති සහ එකිනෙකට වෙනස් සාරධර්ම හා සිරිත් විරිත්වලට ගරු කරන පරිසරයක යි. මා හැදී වැඩුණු බහු සංස්කෘතික නගරයේ විවිධ විදේශීය පාසල්වල ඉගැන්වූ විෂයයන්ට භාෂා පමණක් නොව විවිධ ජාතීන්ගේ සංස්කෘතීන් සහ දෘෂ්ටීන් ද ඇතුළත් විය. එම අත්දැකීමෙන් මා ඉගෙනගත් දෙය නම්, විවිධ පසුබිම්වල මිනිසුන් සිතන ආකාරය තේරුම් ගැනීමට සහ ඔවුන් සමග පුළුල් වශයෙන් අදහස් හුවමාරු කර ගැනීමට නම්, මා හට විශේෂීකෘත දැනුමෙන් සහ භාෂා කුසලතාවෙන් ඔබ්බට ගිය යමක් අවශ්‍ය වන බව යි. එවන් වැදගත් කරුණු මෙන්ම, මට මා සිතන ආකාරය විධිමත්ව සන්නිවේදනය කිරීමේ හැකියාව, එනම් තර්කානුසාරී සංවිධාන කුසලතාව අවශ්‍ය වේ. එම නිපුණතාව ශිෂ්‍යයින් තුළට කාවැද්දීම සඳහා, ඉදිරිපත් කිරීමේ තරඟවලට සහභාගී වීම, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණවල කතා කිරීම යනාදී අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට මම සිසුන් දිරිමත් කරමි.




මගේ සංකේන්ද්‍රීය ක්ෂේත්‍රය AI තාක්‍ෂණය භාවිතයෙන් සන්නිවේදනය යි. මම ඉංග්‍රීසි බසින් විශේෂීකෘත මාතෘකා පිළිබඳ දේශන පවත්වමි. ඉංග්‍රීසි කතා කරන පරිසරයක අධ්‍යාපනය ලැබීමේ එක් වාසියක් නම් ගෝලීය මානසිකත්වයකින් හෙබි පුද්ගලයෙකු ලෙස ඔබට රැකියා වෙළඳපලේ තරඟ කිරීමට වඩාත් හොඳ හැකියාවක් ලැබීම යි. ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමෙන් ඔබට ජාත්‍යන්තර දැනුම සහ තොරතුරු වෙත ප්‍රවේශය ලැබෙන අතර, විවිධ සංස්කෘතීන් සහ සාරධර්ම පිළිබඳ අවබෝධයක් ද ලැබේ.

එපමණක් නොව, ඔබේ ඉංග්‍රීසි දැනුම වැඩිදියුණු කර ගැනීමෙන් ඔබ විදේශීය විශ්වවිද්‍යාලවල පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු කරගෙන යාමට සහ ජාත්‍යන්තර කටයුතුවලට සහභාගී වීමට ශක්තිමත් පදනමක් ගොඩනඟා ගනී. ඉංග්‍රීසි භාෂාවෙන් උගන්වනු ලබන පන්තිවලට සහභාගී වීම පුද්ගලයෙකු ලෙස වැඩිදියුණු වීමටත් ඔබේ කලාපයේ සහ රටේ සංවර්ධනයට දායක වීමටත් උපකාරී වේ. කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI) මගින් ඉංග්‍රීසි සහ ජපන් යන භාෂා දෙකෙන්ම පුළුල් පරාසයක පාඨමාලා පිරිනමනු ලබන්නේ ඔබට අදාළ විෂය පිළිබඳ සුළු දැනුමක් සහිතව හෝ දැනුමකින් තොරව ඉගෙනුම් ආරම්භ කළත් ඔබට ප්‍රමුඛ පෙළේ, විශේෂීකෘත අන්තර්ගතයන් හැදෑරීමට හැකියාව ලබා දෙමිනි. ලොව පුරා සමාගම් විසින් පිළිගත් යෝග්‍යතා පරීක්ෂණ සඳහා සූදානම් වීමට ද ඔබට පාඨමාලා හැදෑරිය හැක.

KCGI වෙත ප්‍රවේශය ලබන සෑම කෙනෙකුටම වසර දෙකක් පුරාවට විශේෂීකෘත දැනුමක් එක්රැස් කර ගැනීමට පමණක් නොව ලොව පුරා රටවල පුද්ගලයින් සමග සම්බන්ධ වී මිතුදම් ඇති කර ගැනීමට ද ඉඩප්‍රස්ථාවන් බොහොමයක් ලබා ගත හැක.



# ක්‍රියාකාරී ක්ෂේත්‍ර

සාම්ප්‍රදායික තොරතුරු තාක්ෂණයේ සංකීර්ණත්වය වැඩි වීමත් සමඟම (ICT) තොරතුරු තාක්ෂණ (IT) හඳුන්වාදීම (විශේෂයෙන් අන්තර්ජාල ව්‍යාපාර තාක්ෂණය ව්‍යාප්ත වීමත් සමඟ) මේ වන විට කර්මාන්ත ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝගයක් වී ඇත. සාමාන්‍යය ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍යයක් ලෙස පමණක් භාවිතා කිරීමට වඩා, අද වන විට තොරතුරු තාක්ෂණය ඉහළ මට්ටමේ ව්‍යාපාරික උපාය මාර්ග නිර්මාණය කිරීම සඳහාද භාවිත කිරීමේ නැඹුරුවක් ඇත. මෙයින් අදහස් වන්නේ ව්‍යාපාර කළමනාකරණයෙහි ඉහළ මට්ටම් වලට තොරතුරු තාක්ෂණය හඳුන්වා දීමයි; මේ සඳහා සම්බන්ධ වන මානව සම්පත හට ඉහළ මට්ටමේ දැනුමක් හා නිපුණතාවයන් මෙන්ම ඉහළ මට්ටමේ කළමනාකරණ අවබෝධයක් ද අවශ්‍ය වේ.

ක්ෂේත්‍රයට අවශ්‍ය උසස් මට්ටමේ තොරතුරු තාක්ෂණ හැකියන් බිහි කිරිම පිණිස KCGI විසින් විෂය මාලා නිර්මාණය කර ඇත. KCGI හි උපාධිධාරින් පහන වෘත්තීන් වැනි තොරතුරු තාක්ෂණ හා සම්බන්ධ රැකියාවන්හි නිරත වේවි කියා බලාපොරොත්තු වේ.

### CIO (ප්‍රධාන තොරතුරු නිලධාරී)

සමාගම්වල තොරතුරු තාක්ෂණ යෙදුම් වර්ධනය වෙමින් පවතින අතරතුර ව්‍යාපාර කළමණාකරණයෙහි පදනම හට තොරතුරු තාක්ෂණය වැඩි වැඩියෙන් උපයෝගී කරගැනීමට සිදුවන හෙයින්, සමාගම් විසින් කළමණාකරණ ක්‍රමෝපායන් සැලසුම් කිරීමෙහි හැකියාව ඇති සහ ව්‍යාපාර කළමණාකාරිත්වයේ කොටස්කරීත්වය ගත හැකි ප්‍රධාන තොරතුරු නිලධාරීන් ඉල්ලුම් කිරීමේ වර්ධනයක් දක්නට ඇත. ප්‍රධාන තොරතුරු නිලධාරීන් යනු සමාගම් කළමණාකරණ ක්‍රමෝපායන් සැලසුම් කිරීමෙහි ලා ඉහළ මට්ටමේ වෘත්තිකයන් වන අතර සමාගමේ කළමනාකාරිත්වයේ කොටසක් ලෙස කටයුතු කරනු ලබන, ඉහත කී කළමනාකරණ සැලසුම් සාක්ෂාත් කරගැනීමෙහිලා අවශ්‍යය පසුබිම් සකස් කරන්නාවූ මෙන්ම ආයතනයක් සතු ඇති විශාල වූ කළමනාකරණ දැනුම් සම්භාරය ඵලදායී තොරතුරු පද්ධතියක් බවට හරවනු ලබන පුද්ගලයින් වේ.

### ව්‍යාපෘති කළමනාකරු

තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘති නායකයෙකු වශයෙන් ව්‍යාපෘති කළමනාකරුගේ කාර්යභාරය වැදගත් වේ. ව්‍යාපෘති කළමනාකරුවන් යනු අභ්‍යන්තර කළමණාකරණ සම්පත් ඵලදායීව උපයෝගී කරගැනීම පිළිබඳව සැලකිලිමත් වන, කළමනාකරණය පුළුල් ලෙස සිදුකිරීමට මෙන්ම ප්‍රශස්තකරණයට හැකියාව ඇති සහ නවීන තොරතුරු තාක්ෂණය නිසි අයුරින් හඳුන්වා දෙන උසස් වෘත්තිකයන් වේ. එබැවින් තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ව්‍යාපෘති කළමනාකරුවන්ට පුළුල් දැනුමක් තිබිය යුතු වේ. මීට අමතරව, ව්‍යාපෘති කළමනාකරුවන් විශාල පුද්ගලයින් ප්‍රමාණයක් හා විවිධ තනතුරු ගණනාවක් හා සම්බන්ධ වන අන්තර්-දෙපාර්තමේන්තු ව්‍යාපෘතිවලට සහභාගී වන බැවින් ඔවුන් හට උසස් මට්ටමේ සන්නිවේදනය සහ නායකත්ව හැකියාවන් ද අවශ්‍යය වේ.

### කෘත්‍රිම බුද්ධි නිර්මාණ ශිල්පී

කෘත්‍රිම බුද්ධිය (AI) යනු Society 5.0 විසින් ප්‍රකාශ කරන පරිදි අනාගතයේ මිනිසුන් කේන්ද්‍ර කොටගත් සමාජය යථාර්ථයක් කර ගැනීම උදෙසා වන ප්‍රධාන තාක්‍ෂණයකි. AI නිර්මාණ ශිල්පියෙකු යනු හුදෙක් යන්ත්‍ර ඉගෙනීම සහ අනෙකුත් AI තාක්‍ෂණයන් පිළිබඳ ප්‍රවීණයෙකු නොව, ඉලක්කගත රාජකාරි සහ යෙදුම් ක්ෂේත්‍ර විශ්ලේෂණය කිරීමේ දී සහ පුළුල් පරාසයක ක්ෂේත්‍රවල ගැටළු නිරාකරණය සහ ප්‍රශස්තකරණය සඳහා AI පද්ධති වැඩිදියුණු කිරීමේ දී සහ ප්‍රායෝගිකව යෙදවීමේ දී තම කුසලතා යොදාගත හැකි උසස්, විශේෂීකෘත වෘත්තිකයෙකි. AI නිර්මාණ ශිල්පීන් විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්‍ෂා කරන අතර, ඒ ඔවුන් සමාජ පද්ධති ගොඩනැගීමේ සහ අනාගත කාර්මික ව්‍යුහයන් පවත්වාගෙන යාමේ මූලික රාජකාරීන් භාරව සිටින වෘත්තිකයන් වන බැවිනි.

### පද්ධති ඒකාබද්ධ කිරීමේ උපදේශක

ගෘහස්ථ තොරතුරු තාක්ෂණ කුසලතා නොමැති වීම නිසා ජපන් සමාගම්වල තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම සඳහා බාහිර උපදේශකයන්ගේ ඉල්ලුම වැඩිවෙමින් පවතී. පද්ධති ඒකාබද්ධ කිරීමේ උපදේශක යනු සේවාලාභී සමාගමේ කළමනාකරණ සැලසුම් වලට අනුව ව්‍යාපාරික පද්ධති සැලසුම් කිරීම සම්බන්ධව උපදේශනය සපයන සහ වර්තමානයේ දැඩි තරඟකාරීත්වයකින් යුතු ජාත්‍යන්තර ව්‍යාපාර පරිසරය තුල සාර්ථකත්වයට පත් වීමට උර දෙන ආයතන අතර ඵලදායී ලෙස සබඳතා ඇති කිරීමට අවශ්‍ය කුසලතා වලින් හෙබි උසස් වෘත්තිකයන් වේ. පද්ධති ඒකාබද්ධ කිරීමේ උපදේශකවරුන් විසින් සේවාලාභීන්ගේ අවශ්‍යතා හොඳින් තේරුම්ගෙන ඒවාට ප්‍රතිචාර දැක්විය යුතු බැවින් ඔවුන් හට ශක්තිමත් තොරතුරු තාක්ෂණ, කළමනාකරණ සහ සන්නිවේදන කුසලතා තිබිය යුතුය.

### ව්‍යවසායක

ව්‍යවසායකයෙකු යනු මුල සිටම ව්‍යාපාරයක් ආරම්භ කරන අයෙකි. නව ව්‍යාපාරයක හෝ ව්‍යාපෘතියක ආරම්භකයා ලෙස, සමාගමේ ආරම්භක මූලධර්මවලට දැඩිව අනුගත වීමේ ප්‍රබල අභිලාෂයක් මෙන්ම සමස්ත සංවිධානය අපේක්ෂිත දිශානතිය ඔස්සේ මෙහෙයවීමට අවශ්‍ය නායකත්වයක් ව්‍යවසායකයා තුළ තිබිය යුතු ය. ආයතනයේ ව්‍යාපාර කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් විශාල වගකීමක් ව්‍යවසායකයා සතු වන අතරම, සෑම විටම ව්‍යාපාරයේ තත්ත්වය සහ වැඩබිමේ ඇති ගැටළු පිළිබඳව මනා අවබෝධයක් ද තිබිය යුතු ය. මෙම හේතූන් නිසා ව්‍යවසායකයාට විශිෂ්ට කළමනාකරණ කුසලතා අත්‍යවශ්‍ය වේ.

### තොරතුරු තාක්ෂණ ශිල්පි

තොරතුරු තාක්‍ෂණ නිර්මාණ ශිල්පියා යනු තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති උසස්, විශේෂීකෘත වෘත්තිකයෙකි. IT නිර්මාණ ශිල්පියා සතු වගකීම්වලට, කළමනාකරණ හෝ රාජකාරී ගැටළු නිරාකරණය සඳහා තොරතුරු තාක්‍ෂණ උපාය මාර්ගයක් යෝජනා කර විශිෂ්ට තොරතුරු තාක්‍ෂණ සැලසුමක් කෙටුම්පත් කිරීමේ සිට තොරතුරු තාක්‍ෂණ සැලසුම්කරණය සහ පසු දියුණුව සහ ක්‍රියාවට නැංවීම දක්වා වූ සම්පූර්ණ රාජකාරි මාලාවම ඇතුළත් වේ. IT නිර්මාණ ශිල්පියා විසින් තොරතුරු තාක්‍ෂණ විශේෂඥයාගේ රාජකාරියට කළමනාකරණ ඉදිරිදර්ශනයක් එක් කරන අතර, ඒ පද්ධති සංවර්ධනය මෙන්ම පද්ධති සඳහා ඉලක්කගත තත්ත්වයන්ට අදාල පොදු පිරිවිතර සහ අවශ්‍යතා පිළිබඳ විග්‍රහයන් පරීක්ෂා කිරීම සහ යෝජනා කිරීම සිදු කරමිනි. සමස්ත පද්ධති දිශානතිය සහ සැකැස්ම මත පදනම්ව, පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා වූ අවශ්‍යතා නියම කිරීමේ කුසලතා IT නිර්මාණ ශිල්පියා සතු විය යුතු ය.

### තොරතුරු ආරක්ෂක උපදේශක

තොරතුරු තාක්ෂණ ජාලයන් ඉ-වාණිජය හා අයි.ඕ.ටී. යථාර්ථයක් කිරීම සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වේ. කෙසේ වෙතත්, මෙම ජාල සඳහා ආරක්ෂක අවදානම තවදුරටත් පුළුල් වෙමින් පවතී. තොරතුරු ආරක්ෂණ උපදේශකයකු විසින් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සැකසීම සහ තොරතුරු වත්කම් සුරක්ෂිත කිරීම සඳහා පාරිභෝගිකයින්ට උපදෙස් සහ සහාය ලබා දෙයි. පාරිභෝගිකයා මුහුන දී ඇති තත්වයන් තේරුම් ගැනීමට සහ ඒවාට සුදුසු පරිදි ප්‍රතිචාර දැක්වීම සඳහා තොරතුරු ආරක්ෂක උපදේශක හට කළමනාකරණ හා සන්නිවේදන හැකියාවන් අවශ්‍ය වේ.

### අන්තර්ගත නිෂ්පාදන කළමනාකරු

අන්තර්ගත නිෂ්පාදන කළමනාකරුවන් විසින් චිත්‍රපට කණ්ඩායම්, සජීවිකරණය සහ ක්‍රීඩා මෘදුකාංග වැනි මාධ්‍ය අන්තර්ගත නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘති කණ්ඩායම් අධීක්ෂණය කරයි. පළමුව, යෝජනාවක් කෙටුම්පත් කරන අතර, කණ්ඩායමේ සහයෝගිත්වය ඇතිව සමාගම සමඟ නිෂ්පාදන සාකච්ඡා ඇරඹීමත්, සංයුක්ත අයවැය සුරක්ෂිත කිරීමත් සිදු කරයි. එසේම, නිෂ්පාදන කළමනාකරුවන් විසින් නිසි නිෂ්පාදන භාවිතා කිරීමෙන් මෙම අරමුදල් ආපසු ලබාගත හැකි වන පරිදි මෙම සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු ය. අතීත ව්‍යාපෘති කාර්ය සාධනය සහ වත්මන් වෙළඳපල තත්ත්වයන් විශ්ලේෂණය කිරීමටත්, සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කණ්ඩායමක් සංවිධානය කිරීමටත් මේ සඳහා හැකියාව අවශ්‍යය වේ.

### දත්ත විද්‍යාඥයා

දත්ත විද්‍යාඥයා විසින් Big Data අති විශාල ප්‍රමාණයක් අතරින් අවශ්‍ය තොරතුරු රැස්කිරීම, උපුටා ගැනීම සහ විශ්ලේෂණය සිදු කර එම තොරතුරු ව්‍යාපාරයක තත්ත්වය උසස් කිරීම අරමුණු කොටගත් ක්‍රියාමාර්ග යෝජනා කිරීමට භාවිතා කරයි. තොරතුරු තාක්‍ෂණ සේවක පිරිස්වල නවතම ප්‍රවණතා සහ ප්‍රක්ෂේපණ සම්බන්ධයෙන් METI හි සමීක්‍ෂණ ප්‍රතිඵලවල Big Data ප්‍රසාරණය පිළිබඳ උපුටා දක්වා ඇත්තේ ඉදිරියේ දී දත්ත විද්‍යාඥයින් සඳහා ඇති ඉල්ලුම ඉහළ යාමට නියමිත බව අඟවමිනි. මෑත වසරවල දී කෘෂිකර්මාන්තය සහ වෛද්‍ය විද්‍යාව වැනි ක්ෂේත්‍රවල Big Data ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීම ඉහළ ගොස් ඇත්තේ එම දත්ත යොදාගන්නා ක්ෂේත්‍ර පුළුල් කරමිනි. අලෙවිකරණය සහ කළමනාකරණය පිළිබඳ දැනුමට අමතරව, දත්ත විද්‍යාඥයින්ට සංඛ්‍යානමය විශ්ලේෂණය සහ දත්ත කැණීම වැනි තොරතුරු තාක්‍ෂණ කුසලතා මෙන්ම කල්පිතයන් සහ සනාථ කිරීමේ පරීක්ෂණ පදනම් කොටගෙන තාර්කිකව සිතීමේ හැකියාව ද අපේක්‍ෂා කෙරේ.

# අධ්‍යාපනික පරිසරය සහ පද්ධති

ලෝක මට්ටමේ ව්‍යාපාර පද්ධති ඇතුළත් අධ්‍යාපනික SAP පද්ධතිය ඇතුලත් ප්‍රායෝගික අධ්‍යාපන පරිසරයක්

## අධ්‍යාපනය සඳහා SAP විසින් නිමැවූ ERP පද්ධති

**■ SAP විසින් නිමැවූ ERP පැකේජ ක්‍රියාත්මක කිරීමෙන් ව්‍යාපාරික සේවක පිරිස් සංවර්ධනය**

තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රයේ උසස් තොරතුරු තාක්‍ෂණ කුසලතා ඇති ව්‍යාපාරික සේවක පිරිස් වැඩිදියුණු කිරීම සඳහා, KCGI විසින් ප්‍රායෝගික ඉගෙනුම් සහ පර්යේෂණ පරිසරයක් නිර්මාණය කිරීම පිණිස ලොව විශාලතම ERP පැකේජ මෘදුකාංග වෙළෙන්දා වන ජර්මනියේ SAP GmbH විසින් නිපදවනු ලැබූ ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතියක් වන SAP S/4HANA ක්‍රියාවට නංවා ඇත. පද්ධති සංවර්ධනය ඇතුළු ERP පිළිබඳ සියලු සුදුසුකම්වලින් පරිපූර්ණ විශේෂඥයින් සංවර්ධනය කිරීම සඳහා එවැනි පද්ධතියක් හඳුන්වා දී ඇති ජපන් ආයතනය KCGI වේ.

**■ කළමනාකරණය ඵලදායීව සිදු කිරීම**

SAP හි නිෂ්පාදිත ERP පද්ධති සුවිසල් මෙන්ම සංකීර්ණ පද්ධති වේ. KCGI හිදී සිසුන් හට උගන්වන්නේ හුදෙක් SAP ERP පද්ධති ක්‍රියාත්මක කරන ආකාරය පමණක් නොවේ. එහි දී සිසුන් සමාගම්වල වැඩ ක්‍රියා පටිපාටි අනුපිළිවෙල ද ඉගෙන ගන්නා අතර, වැඩ ක්‍රියාවලීන්ට සහාය වීම සඳහා SAP පද්ධති අභිරුචිකරණය කිරීම සහ සමාගම්වලට ERP පද්ධති හඳුන්වාදීම පිළිබඳ උපදේශනය වැනි උසස් ප්‍රායෝගික කුසලතා ද ලබා ගනී.

**■ උසස් ප්‍රායෝගික කුසලතා වැඩිදියුණු කිරීම**

KCGI හිදී සිසුන් SAP S/4HANA ක්‍රියා කරන ආකාරය සහ එය වැඩ ක්‍රියාවලීන්ට සහාය විය හැකි ආකාරය විවිධ දිශානතීන්ගෙන් පරීක්ෂාවට ලක් කරයි. ප්‍රායෝගික අධ්‍යයනය හරහා, ERP ක්‍රියාවට නැංවීම මගින් මිලදී ගැනීමේ ඉන්වෙන්ටරි කළමනාකරණය, නිෂ්පාදනය, විකුණුම් සහ බෙදා හැරීම, ගිණුම්කරණය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළු සමස්ත වැඩ ක්‍රියාවලීන් වෙනස් වන ආකාරය සිසුන් ඉගෙන ගනී. KCGI තුළ ඇති විශේෂඥ ERP පාඨමාලා හරහා, උපාධිධාරී සිසුන් සහතිකලත් SAP උපදේශක සඳහා වූ යෝග්‍යතා විභාගය සමත් වී ඇත.

**■ ඉහළ ක්‍රියාකාරීත්වයක් සහිත පරිගණක පද්ධති**

KCGI හි සිසුන් AI/යන්ත්‍ර ඉගෙනුම, Big Data විශ්ලේෂණය, පරිගණක චිත්‍රක, සමායුක්ත ප්‍රශස්තකරණය සහ ක්වොන්ටම් පරිගණකකරණය ආදී අති විශාල පරිගණක බලයක් අවශ්‍ය ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කරයි. මෙම අධ්‍යයනයන්ට සහාය වීම සඳහා 2022 අධ්‍යයන වසරේ දී KCGI විසින් නවතම ඉහළ පෙළේ GPU එකක් වන NVIDIA RTX A6000 ඇතුළත් ඉහළ ක්‍රියාකාරීත්වයක් සහිත පරිගණකකරණ පද්ධති 16ක් හඳුන්වා දෙන ලදී. මෙම පරිගණකවල ටෙරාෆ්ලොප් 620ක (620 TFLOPS) උපරිම කාර්ය සාධනයක් ඇති බවට ගණන් බලා ඇත. මෙම සෑම පද්ධතියක්ම පරිගණක සේවාදායක හතරකින් සමන්විත වන අතර, සමගාමී වැඩසටහන් කිහිපයක් එකවර ක්‍රියාත්මක කිරීමේ හැකියාව මෙම සේවාදායකවලට ඇත.

## ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය

**■ KCGI නවීන අධ්‍යාපනය සඳහා පන්ති ආකෘති තුනකින් පරිපූර්ණ අධ්‍යයන සහාය ලබා දෙන අතර, ඒවා නම්: තථ්‍ය කාලීන ඔන්ලයින් පන්ති (සමමුහුර්ත ඉ-ඉගෙනුම්), ඉල්ලුම අනුව සිදු කරන පන්ති (සමමුහුර්ත නොවන ඉ-ඉගෙනුම්) සහ හයිබ්‍රිඩ් පන්ති (ඔන්ලයින් අන්තර්ගතය සමග ඒකාබද්ධ කළ සම්මුඛ පාඩම්).**

KCGI එහි ආරම්භයේ සිටම තම අධ්‍යයන පරිසරය තුළට තොරතුරු තාක්‍ෂණය ඇඳාගෙන ඇත. එම ප්‍රයත්නයේ එක් කොටසක් වන්නේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් වන KING-LMS හඳුන්වා දීම යි.

කියෝතෝ ප්‍රධාන පාසලේ හයකුමන්බෙන් සරසවිය මණ්ඩපය, කියොතෝ එකිමාර් වන්ද්‍රිකාව, සප්පොරො වන්ද්‍රිකාව සහ තෝකියෝ වන්ද්‍රිකාව ආදී ස්ථානවල සිට, නිවසේ සිට හෝ ඕනෑම තැනක සිට පරිගණකය හෝ ස්මාර්ට් ජංගම දුරකථනය හරහා KING-LMS වෙත ප්‍රවේශ විය හැක. මෙම අධ්‍යයන පරිසරය සිසුන්ට පාඩම් අන්තර්ගතය පිරික්සීම, පැවරුම් ඉදිරිපත් කිරීම සහ උපදේශකයින් සම්බන්ධ කර ගැනීම වැනි කාර්යයන් සිදු කර ගැනීමට හැකියාව ලබා දෙයි. අනුපූරක KING-LMS යනු හයකුමන්බෙන් මණ්ඩපයේ ප්‍රධාන ගොඩනැගිල්ලෙහි සපයා දී ඇති නම්‍යශීලී හයිබ්‍රිඩ් (“hy-flex”) පන්ති කාමර වේ. සිසුන්ට විශේෂ හෝ වෙනම සැලකීමකින් තොරව ඕනෑම ස්ථානයක සිට මෙහි පැවැත්වෙන පන්තිවලට සහභාගී වීමේ හැකියාව ඇත.

නම්‍යශීලී හයිබ්‍රිඩ් පන්ති කාමර තුළ, උපදේශකයින් සෑම කාමරයකම ගමන් කරන විට ඔවුන් පසුපසින් ගමන් කරන කැමරා මගින් ඔන්ලයින් පන්තිවලට සහභාගී වන සිසුන්ට තමා පන්තියේ සිටින ආකාරයෙන්ම උපදේශකයාගේ මුහුණ දැකගත හැකි ය. ඒ අතරම, දුරස්ථව සහභාගී වන සිසුන්ගේ පින්තූර පන්ති කාමරයේ ඇති විශාල මොනිටරයකින් පෙන්වන අතර, එබැවින් සිසුන්ට දිශානුගත මයික්‍රොෆෝන සහ ස්පීකර් භාවිතයෙන් ප්‍රශ්න ඇසීමට සහ සංවාදයේ යෙදීමට හැකි වේ. මෙම නවෝත්පාදනයන්ට ස්තුති වන්නට, දුරස්ථ සිසුන්ට තමන් පන්ති කාමරය තුළ සිටින ආකාරයෙන්ම පන්තියට සහභාගී විය හැකි ය.




*KING-LMS (KCG තොරතුරු ජාල ගැලැක්සි-ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය): KCGI විසින් හිමිකම් දරන අධ්‍යයන කළමණාකරණය හා ආධාරක පද්ධතිය අවශ්‍යය පරිදි නිදහස් ලෙස අන්තර්ගතය අධ්‍යයනය සිදු කිරීමට හැකියාව ලබා දේ.

## පුස්තකාල සහ ඉලෙක්ට්‍රොනික පුස්තකාල

හයකුමන්බෙන් සරසවිය ප්‍රධාන ගොඩනැගිල්ලේ පුස්තකාලය මගින් සිසුන්ට තමා විසින්ම පොත් ලබා ගැනීමේ සහ ආපසු භාර දීමේ සේවය පිරිනමයි.

ප්‍රධාන මණ්ඩපයේ දී, KCGI යනු එක්සත් ජනපදයේ ඇති පරිගණකකරණ යන්ත්‍රෝපකරණ සංගමයේ (ACM) ඉලෙක්ට්‍රොනික පුස්තකාලවල සහ ජපානයේ තොරතුරු සැකසුම් සංගමයේ (IPSJ) ග්‍රාහකයෙකි. මෙම ඉලෙක්ට්‍රොනික පුස්තකාල හරහා සිසුන්ට මෙම සංගම් දෙකේ සහ වෙනත් සංගම්වල අති විශාල ශාස්ත්‍රීය සඟරා ප්‍රමාණයක සම්පූර්ණ අන්තර්ගතය ද ඇතුළු ප්‍රකාශනවලට ප්‍රවේශ විය හැක. බොහෝ අවස්ථාවන්වල සිසුන්ට දශක ගණනාවකට පෙර කාලය දක්වා විහිදුණු නාමාවලි නැරඹීමේ හැකියාව ඇත. ජාතික තොරතුරු විද්‍යා ආයතනයේ අධ්‍යයන තොරතුරු ජාලය වැනි සම්පත් ද සිසුන්ට භාවිතා කළ හැකි ය. සමීක්‍ෂණ සහ පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට ද මෙම සම්පත් ඉතා ප්‍රයෝජනවත් වේ.

# කියෝතෝ ප්‍රධාන පාසලේ හයකුමන්බෙන් සරසවිය මණ්ඩපයේ නව අධ්‍යාපනික ගොඩනැගිල්ල

නව පාසල් ගොඩනැගිල්ලක් ඉදිකර එය 2022 ගිම්හානයේ දී කියෝතෝ ප්‍රධාන පාසලේ හයකුමන්බෙන් සරසවිය එක් කරන ලදී. ජපානයේ පාණ්ඩිත්‍යය පිළිබඳ පුරාණ අගනගරය වන නව පරිශ්‍රය KCGI හි තොරතුරු තාක්‍ෂණ අධ්‍යාපනයේ සහ ජාත්‍යන්තර සිසු හුවමාරුවේ නව කේන්ද්‍රස්ථානය ලෙස බහුලව භාවිතා වේ. නව ගොඩනැගිල්ල සහ එහි භූමිය එක් කිරීමත් සමග, හයකුමන්බෙන් සරසවිය වපසරිය තුන් ගුණයකින් වැඩි විය. බිම් මට්ටමට ඉහළින් වූ මහල් හතරකින් සහ පහළින් වූ එක් මහලකින් සමන්විත නව ගොඩනැගිල්ල මගින් උසස්, විප්ලවීය සහ ගෝලීය අධ්‍යාපනය සඳහා සංසදයක් ලබා දෙනුයේ, KCGI සතු පුළුල් අත්දැකීම් සහ න්‍යායික අවබෝධයේ පිටුබලය ද ඇතිව යි.

2004 වසරේ දී KCGI විවෘත කරන ලද්දේ ජපානයේ තොරතුරු තාක්‍ෂණය පිළිබඳ විශේෂඥතාව සහිත එකම උපාධි පාසල ලෙස යි. එතැන් පටන් KCGI අධ්‍යාපන ප්‍රතිඵල සම්බන්ධයෙන් ආකර්ෂණීය නමක් හිමි කරගෙන ඇත. ජපානය පුරා සහ ලොව වටා සිටින අධ්‍යාපන විශේෂඥයින් විශාල සංඛ්‍යාවක් අද KCGI හි ඉගැන්වෙන කාලීන අවශ්‍යතාවලට ගැලපෙන පරිදි සැකසූ විෂයමාලාවන්හි නියැලී සිටී. සිසුන් 80 දෙනෙකුගේ (සම්පූර්ණ ධාරිතාව 160ක්) ධාරිතාවෙන් ආරම්භ කළ පාසල අද වන විට 700 දෙනෙකු (සම්පූර්ණ ධාරිතාව 1,300) දක්වා එනම් නව ගුණයකින් පුළුල් වී ඇති අතර, ධාරිතාව සැලකීමේ දී එය ජපානයේ විශාලතම තොරතුරු තාක්‍ෂණ උපාධි පාසල්වලින් එකක් ලෙස සැලකේ. KCGI අද අනෙකුත් ආසියානු රටවල්, උතුරු ඇමරිකාව සහ යුරෝපය පමණක් නොව අප්‍රිකාව සහ මධ්‍යම සහ දකුණු ඇමරිකාව ආදී රටවල්වලින් පැමිණෙන ජාත්‍යන්තර සිසුන් සිය ගණනකට සත්කාරකත්වය සපයයි.



විශාල දේශන ශාලාව



නවෝත්පාදන කාමරය



පුහුණු කාමර



තනි වැඩ කුටි





## විශාල දේශන ශාලාව

විශාල දේශන ශාලාව හුදෙක් දේශන සඳහා පමණක් නොව සම්මන්ත්‍රණ, ප්‍රසංග, නාට්‍ය, චිත්‍රපට ප්‍රදර්ශන සහ තවත් බොහෝ කාර්යයන් සඳහා ද භාවිතා කළ හැකි ය. පරිශ්‍ර සැලසුම් අවධියේ සිටම විශේෂිත ධ්වනි උපදේශන සමාගමක් සමග සමීපව කටයුතු කරමින්, KCGI එහි සියළුම භාවිත ක්‍රම සඳහා ප්‍රශස්ත සවන්දීමේ පරිසරයක් සහතික කිරීමට අනුකරණයන් (simulations) සිදු කරන ලදී. සෑම ආසනයක්ම බල සැපයුමකින් සමන්විත වන අතර, එමගින් නෝට්බුක් පරිගණක සහ අනෙකුත් උපාංග පහසුවෙන් භාවිත කිරීමට රැහැන් සහිත සහ රැහැන් රහිත අන්තර්ජාල සම්බන්ධතා ලබා දේ. ශාලාව තුළ 200 දෙනෙකුට අසුන් ගත හැක.







## නම්‍යශීලී හයිබ්‍රිඩ් පන්ති කාමර

නම්‍යශීලී හයිබ්‍රිඩ් (“hy-flex”) පන්ති කාමර සැලසුම් කර ඇත්තේ පුළුල් පරාසයක පාඩම් මාදිලි සඳහා නම්‍ය ශීලී සහය ලබා දීම සඳහා වේ. කණ්ඩායම් වැඩ සහ වෙනත් පාඩම් උපායමාර්ග හරහා පාඩමේ ප්‍රධාන කාරකයින් ලෙස සිසුන් සක්‍රීයව සහභාගී වන ක්‍රියාකාරී ඉගෙනීමට මෙම පන්ති කාමර සහාය වේ. පන්තියට පැමිණ සිදු කරන සහ ඔන්ලයින් පාඩම් ඒකාබද්ධව සිදු කෙරෙන හයිබ්‍රිඩ් පාඩම් සඳහා ද මෙම පන්ති කාමර මනාව ගැලපේ. ස්මාර්ට් ඩිස්ප්ලේ සහ දිශානුගත මයික්‍රොෆෝන් සහ ස්පීකර් වැනි උපකරණවලින් සන්නද්ධ නම්‍යශීලී හයිබ්‍රිඩ් පන්ති කාමර ඉගෙනුම් සහ අධ්‍යයන කටයුතු සඳහා බාධාවකින් තොර පරිසරයක් ලබා දේ. ඒවායින් පන්ති කාමරයේ සිටින සිසුන්ට සහ ඔන්ලයින් සම්බන්ධ වන දුරස්ථ සිසුන්ට එකිනෙකාගේ වටපිටාවෙන් කිසිදු බාධාවක් සිදු වීමෙන් තොරව එකසේ සහභාගී වීමට ඉඩ සලසයි. කාමරයේ සෑම බිත්තියක්ම ලියන පුවරුවක් ලෙස භාවිතා කළ හැකි අතර ඒවා අදහස් පුවරු ලෙස ක්‍රියා කරයි.





## පුස්තකාලය

පුස්තකාලයේ ප්‍රධාන වශයෙන් තොරතුරු තාක්ෂණය ආශ්‍රිත විෂයයන් පිළිබඳ ජපන්, ඉංග්‍රීසි සහ චීන භාෂාවලින් රචිත පොත් 10,000ක් පමණ ඇත. පොත් බැහැර දීම සුමට සහ ස්වයංක්‍රීය ක්‍රියාවලියක් වන අතර, ඔබ කළ යුත්තේ පොත සහ ඔබේ ශිෂ්‍ය හැඳුනුම්පත ස්වයංක්‍රීය පොත් බැහැර දෙන යන්ත්‍රයේ ස්කෑනරයට අල්ලා සිටීම පමණි. කියවීම සහ අධ්‍යයනය සඳහා තනි පුද්ගල අවකාශ ඇති අතර කණ්ඩායම් භාවිතය සඳහා මේස ලබා දී ඇත.















## නවෝත්පාදන කාමරය

නවෝත්පාදන කාමරය යනු විවිධ ක්ෂේත්‍රවල සිසුන්ට සහ උපදේශකයින්ට සාකච්ඡා, ප්‍රසිද්ධ ඉදිරිපත් කිරීම් සහ වෙනත් ක්‍රියාකාරකම් හරහා එකිනෙකා හමුවීමට සහ නව්‍යකරණයන් පිළිබඳ කතාබහ කළ හැකි අවකාශයකි. මෙම කාමරය නිර්මාණය කර ඇත්තේ නිර්මාණශීලීත්වය දිරිගැන්වීම සඳහා වේ. නම්‍ය ශීලී හයිබ්‍රිඩ් පන්ති කාමරවල මෙන් නවෝත්පාදන කාමරයේ ද බිම් මට්ටමේ සිට සිවිලිම දක්වා සෑම බිත්තියක්ම ලියන පුවරුවක් ලෙස භාවිතා කළ හැකි ය. නවෝත්පාදන කාමරය සිසුන් සහ රැකියාවේ නියුතු වැඩිහිටියන් අතර සහයෝගීතාව වර්ධනය සඳහා වූ සංසදයක් ලෙස ද (උදාහරණයක් ලෙස කර්මාන්ත-රාජ්‍ය-ශාස්ත්‍රීය හවුල්කාරිත්ව වැඩසටහන් හරහා) භාවිතා කිරීමේ අරමුණින් නිර්මාණය කර ඇත. විශාල දේශන ශාලාවේ පැවැත්වෙන උත්සව සහ දේශන සඳහා ආලින්දයක් ලෙස ක්‍රියා කරන විවෘත අවකාශයක් නිර්මාණය කර ගැනීමට වීදුරු කොටස් විවෘත කොට තැබිය හැක.



## පුහුණු කාමර

පරිගණක පුහුණුවීම් කටයුතු සඳහා නවීන ක්‍රියාකාරිත්වයෙන් යුතු පරිගණකවලින් සමන්විත පුහුණු කාමර විශේෂයෙන් AI ක්‍රමලේඛනය, දත්ත සමුදා සංවර්ධනය සහ ERP සඳහා යොදා ගැනේ. සිසුන්ට තනි තනිව අධ්‍යයන කටයුතු කිරීමට සහ පැවරුම් වැඩ කිරීමට ද මෙම පරිගණක භාවිතා කළ හැක.







## තනි වැඩ කුටි

දෙවන හා තෙවන මහල්වල තනි වැඩ කුටි සපයා දී ඇත. ඉතා ඵලදායි ධ්වනිවාරක තාක්ෂණයෙන් සපිරි මෙම කුටි දුරස්ථ ස්ථානවල සිටින පුද්ගලයින් සමග සන්නිවේදනය කිරීම සඳහා සුවපහසු පරිසරයක් සපයයි. සෑම කුටියක්ම විශාල මේසයකින් සහ අන්තර්ජාල සම්බන්ධතාවකින් සමන්විත වන බැවින් පරිශීලකයින්ට ඒ හරහා ඔන්ලයින් පන්තිවලට සහභාගී වීම, කණ්ඩායම් වැඩ කිරීම, අධ්‍යයන කටයුතු කිරීම, පැවරුම්වල වැඩ කිරීම, ඔන්ලයින් සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වීම සහ තවත් බොහෝ දේ කළ හැක.



# විෂයමාලා ප්‍රතිපත්ති

අපගේ මෙහෙවර හා අරමුණු වලට අනුකූලව වෙමින්, තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණ කුසලතා වලින් අනූන මෙන්ම ඔවුන් විසින් තෝරාගනු ලබන තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රයක් සක්‍රියව වැඩිදියුණු කළහැකි විශේෂඥ වෘත්තිකයින් පුහුණු කිරීම සඳහා අපි විෂය මාලාවක් පිරිනමන්නෙමු.

**1. විෂයමාලා වැඩසටහන් පහත කාණ්ඩවලට වර්ග කර ඇත:**

• සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර - විශේෂිත අධ්‍යාන ක්ෂේත්‍ර පිළිබඳ ගැඹුරු දැනුමක් ලබාගැනීම සඳහා ක්‍රමානුකූලව පෙළගැස්වූ පාඨමාලා.

• කර්මාන්ත - සිද්ධි අධ්‍යයන සහ ව්‍යාපෘති පදනම් කරගත් ඉගෙනුම් භාවිතා කරමින් ව්‍යාපාර හා තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සමඟ නිශ්චිත කර්මාන්තයක තාක්‍ෂණය හා කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කෙරෙන පාඨමාලා.

• ආධාරක වරණීය පාඨමාලා - තාක්‍ෂණික ප්‍රවණතා, ඉහළ මට්ටමේ න්‍යායාත්මක පාඨමාලා මෙන්ම සංකේන්ද්‍රණ හා කර්මාන්ත ක්ෂේත්‍රයන්ට ඌනපූරණය කරන කුසලතා දියුණු කරන වැඩසටහන් ඇතුළත් පාඨමාලා.

**2. පාඨමාලා ලියාපදිංචි කිරීමේ මාදිළි සහ ක්‍රමය ස්ථාපිත කිරීම**

තම ඉගෙනීම් අරමුණු හා රුචිකත්වයන්ට අනුකූලව, සිසුන් විසින් එක් "සංකේන්ද්‍රණයක්", එනම් මූලික පදනම් දැනුම ලබාගැනීමේ සිට එම දැනුම පුළුල් පරාසයක් තුළ විහිදුණු විශේෂිත තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ක්ෂේත්‍රයක් තුළ යොදා ගැනීමට හා පුහුණු වීමට උපකාරී වන පුළුල් හා ගැඹුරු විශේෂඥතාව පිළිබඳ අවධාරණය කෙරෙන පාඨමාලා කට්ටලයක් තෝරාගනු ලබයි.මීට අමතරව, බෙස්පෝක් විෂයමාලාව මඟින් සිසුන්ට ඔවුන්ගේ විවිධ වූ අවශ්‍යතා මෙන්ම පුද්ගලික අධ්‍යයන හා පර්යේෂණ අරමුණු වලට අනුකූල වන පරිදි පාඨමාලා තෝරා ගැනීමට ඉඩ සලසයි.

ඔවුන් ඉගෙනගත් දේ වෘත්තීය මට්ටමින් යෙදවීම දක්වා පුළුල් කිරීමට, විෂය මාලාව මඟින් පුළුල් කාර්මික ක්ෂේත්‍ර පරාසයක් පුරා විහිදෙන තාක්‍ෂණය ප්‍රායෝගිකව යෙදවීම පිළිබඳ අවධානය යොමු කෙරෙන කර්මාන්ත පාඨමාලා ද ඉදිරිපත් කරයි. ශිෂ්‍යයන් තම දැනුම විශේෂිත ගැටළු නිරාකරණය කිරීමට ප්‍රායෝගිකව යොදවන අතරම විවිධ කර්මාන්තවලට අදාල සැලසුම් නිර්මාණය ද සිදු කරයි. කර්මාන්ත පාඨමාලා සකසා ඇත්තේ සිසුන්ගේ ප්‍රධාන සංකේන්ද්‍රණ පාඨමාලා සඳහා අනුපූරකයක් වශයෙනි.

**3. ප්‍රධාන ව්‍යාපෘතිය**

පාඨාලාවේ කටයුතු සමඟම, පීඨයේ මඟ පෙන්වීම යටතේ ප්‍රධාන ව්‍යාපෘතියක් නිම කිරීම හරහා ඔවුන්ගේම අභිලාෂයන් හඹා යාමෙන් සිසුන්ගේ ප්‍රායෝගික හා ව්‍යවහාරික හැකියාවන් වර්ධනය කිරීම සඳහා අපගේ විෂය මාලාව සැලසුම් කර ඇත.

**4. වෙනස්වීම් වලට ප්‍රතිචාර**

අපගේ විෂය මාලාව තොරතුරු තාක්ෂණ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සිදුවන ශීඝ්‍ර වෙනස්කම් වලට ඉක්මන් ප්‍රතිචාර දක්වයි. ජපානයේ සහ විදේශයන්හි ඉහළ නිපුණතා සහිත වෘත්තිකයින් සඳහා අවශ්‍ය වන කර්මාන්ත හා සමාජීය වෙනස්කම් වලට අනුකූලව පාසල් විෂය මාලාව නිරන්තර සමාලෝචනයට හා වෙනස්කම් වලට බඳුන් කෙරේ.

# ඩිප්ලෝමා ප්‍රතිපත්ති

පහත සඳහන් අවශ්‍යතා සපුරාලන පුද්ගලයන්ට පාසල විසින් ශාස්ත්‍රපති උපාධියක් ප්‍රදානය කෙරේ.

**1) නියම කළ කාල සීමාව තුළ පූර්වනිශ්චිත පාඨමාලා කටයුතු නිම කිරීම (උදා: සමාසික 4)**

**2) උපාධිය සඳහා වන පූර්වනිශ්චිත සම්මාන ප්‍රමාණය සම්පූර්ණ කිරීම**

සිසුන් තමා තුල පහත ගුණාංග ඇතිකරගනු ඇතැයි පාසල අපේක්ෂා කරයි:

**අ. ලබාගත් මූලික දැනුම තම වෘත්තියට ආධාර කරගනු පිණිස පුළුල් කරගැනීම.**

**ආ. උසස් මට්ටමේ නිපුණතා සහිත වෘත්තිකයන් බවට පත්වීම සඳහා සිසුන් තමා විසින් තෝරාගත් ක්ෂේත්‍රය තුළ මෙම දැනුම යෙදවීම.**

තම වෘත්තිය තුළ ගෞරවනීය සාමාජිකයන් බවට පත්වීම සඳහා උසස් ආචාරධර්ම සහිතව කටයුතු කිරීම.









# KCGI තුළ ඉගෙනුම ලැබීම

## ඉහළ සුදුසුකම් සහිත තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සංවර්ධනය සඳහා ඒකාබද්ධ වැඩසටහන්

KCGI හි පාසල් දර්ශනය තුළ ඇති එක් ඉලක්කයක් වන්නේ ඉහළ සුදුසුකම් සහිත තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයින්ගේ සංවර්ධනය කර උපාධිධාරීන් බිහි කිරීමයි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, KCGI විසින් සිසුන්ගේ විවිධ අධ්‍යාපනික අරමුණු වලට සරිලන අයුරින් පාඨමාලා ලියාපදිංචි කිරීමේ මාදිලි රාශියක් ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ විෂයමාලාවන් සිසුන් වෙත ලබා දේ.

**■ විශේෂීකරණය ලබා ගැනීම**

ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයෙකු ලෙස තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රය තුල ඇති සමස්ත දැනුම පරාසය ආවරණය කිරීමට අපේක්‍ෂා කිරීම තාත්වික නොවේ. සිසුන්ට විශේෂීකරණය ලබාගැනීම සඳහා, KCGI විසින් විශේෂිත ක්ෂේත්‍ර ගණනාවක් හඳුනාගෙන එම ක්ෂේත්‍ර සඳහාම වැඩිදියුණු කළ විෂයමාලා හඳුන්වා දෙයි. මෙම සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර හරහා සිසුන්ට තමා තෝරාගත් ක්ෂේත්‍රවල මූලික දැනුමේ පටන් ව්‍යවහාරික තාක්‍ෂණයන් සහ ප්‍රායෝගික කුසලතා දක්වා වන පුළුල් හා ගැඹුරු දැනුමක් ලබා ගත හැකිය.

**■ සමාජයීය අවශ්‍යතා වලට අනුකූල වීම**

අතිවිශාල වපසරියකින් යුත් නවීන කර්මාන්ත ක්ෂේත්‍රය පුරා, කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට, දැනුම රැස් කිරීමට සහ නැතහොත් ගැටළු වලට පිළියම් සෙවීම සඳහා ව්‍යවහාරික තොරතුරු තාක්ෂණයේ අවශ්‍යතාවය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. මෙම අවශ්‍යතාවයන්ට KCGI විසින් ප්‍රතිචාර දක්වන්නේ කර්මාන්ත පාඨමාලා සංවිධානය කර, සිසුන්ට කර්මාන්ත ක්ෂේත්‍රයක් තෝරාගෙන එම ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත පුහුණුව ලැබීමටත්, සිද්ධි අධ්‍යයනයන් තුළින් ඉගෙනීමටත්, ගැටලු විසඳීමටත් ඉඩහසර ලබා දීමෙනි.

**■ නිර්මාණාත්මක සහ ප්‍රායෝගික කුසලතා නිරූපනය කිරීම**

ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයෙකුටම තමා හැදෑරූ සෑම පාඨමාලාවක් තුළම ලබා ගත් දැනුම ප්‍රායෝගිකව යොදාගනිමින් සැබෑ ලෝකයේ ගැටළු සඳහා විසඳුම් ලබා දීමට හැකි විය යුතුය. වෘත්තිකයන් තමාගේම මුලපිරීමෙන් අදාළ ගැටලුව සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මාලාව සැලසුම් කර නිර්මාණය කිරීමටත්, එම විසඳුම්වල ප්‍රතිලාභ අන් අයට ලැබීමට සැළැස්වීමටත් හැකිවිය යුතුය. සිසුන් අවශ්‍ය දැනුම ලබාගැනීම සහතික කිරීම සඳහා, ඔවුන් ව්‍යාපෘති අනුග්‍රාහකයකුගේ මඟ පෙන්වීම යටතේ ඕනෑම පුළුල් පරාසයක තේමාවන්ගෙන් එකක් මෙන්ම ඒ පිළිබඳ පරීක්ෂණ ව්‍යාපෘති/ස්වාධීන අධ්‍යයනයක් ඇතුළත් ප්‍රධාන ව්‍යාපෘතියකින් සමන්විත විෂය මාලාවක් අනුගමනය කරයි.

**■ වෘත්තිමය හැඩගැස්වීම**

ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයන් සැබෑ ගැටළු විසඳීමට සහ සැබෑ කාර්මික ක්‍ෂේත්‍රයන්හි ප්‍රායෝගික විසඳුම් ලබා දීමට හැකියාව ඇති ඉහළ පුහුණුව ලත් වෘත්තිකයන් ලෙස ඔවුන්ගේ කාර්යභාරයන් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සීමාවාසික පුහුණු මගින් ප්‍රායෝගික අත්දැකීම් හරහා සිසුන්ගේ තාක්ෂණික කුසලතාවන් ඉහල නංවමින් ඒ ඔස්සේ ගැටළු නිරාකරණය කිරීමේ කුසලතාවන් ඇතිකර ගැනීමට අවස්ථා සලසා දේ.

කාර්මික ආකෘතියක් තෝරා ගැනීම, ව්‍යාපෘති පැවරුම් වැනි දෑ සියල්ලම සිසුන්ට එකම අකාරයෙන් සිදු කල යුතු නැත. තම තමන් කැමති ක්ෂේත්‍ර යටතේ, ඔවුන්ගේ රුචිකත්වය මත සහ කෙතරම් දුරකට එය හැදෑරීමට අවශ්‍යද යන කාරනා මත පුළුල් පරාසයක් ඔස්සේ මෙම තෝරාගැනීම් සිදු කල හැක. KCGI විසින් ඉහළ සුදුසුකම් ලත් තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයෙකු තුල තිබිය යුතු හා සුදුසු දැනුම හා ශිල්පීය ක්‍රම ගවේෂණය සහතික කරන අතරම, සිසුන්ට සිය අභිමතය පරිදි තමා තෝරාගත් ක්ෂේත්‍රයක අධ්‍යයන කටයුතු සිදු කිරීමට ඇති නිදහසට ගරු කරමින් විෂයමාලා නිර්මාණය කරයි.

## අධ්‍යාපනික අරමුණු ව්‍යවහාරික තොරතුරු තාක්‍ෂණ උපාධි පාසල වෙබ් ව්‍යාපාර තාක්‍ෂණය පිළිබඳ විශේෂීකරණය

මෙම විශේෂීකරණයේ අරමුණ වන්නේ තොරතුරු තාක්‍ෂණය සහ ඒ ආශ්‍රිත ක්‍ෂේත්‍රවල වර්ධනයන්ට ඉක්මන් ප්‍රතිචාර දැක්විය හැකි; භෞතික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කළමනාකරණය යනාදිය හා ඒවායේ ව්‍යවහාරික තාක්‍ෂණයන්ට අදාළ විෂයයන් ආශ්‍රිත න්‍යාය පිළිබඳ අධ්‍යයනය සහ පර්යේෂණ තුළින් පුළුල් දෘෂ්ටියකින් පිටුබලය ලැබූ මූලික විශ්ලේෂණ හැකියාව යොදාගත හැකි; සහ ඉහළ මට්ටමේ විශේෂීකරණයක් අවශ්‍ය වන වෘත්තීන්හි සාර්ථකත්වයට පත් වීමට අවශ්‍ය උසස් තාක්‍ෂණික කුසලතාවලින් අනූන උසස්, විශේෂඥ වෘත්තිකයන් පුහුණු කිරීම යි.

## අධ්‍යාපනික ඉලක්ක

සිසුන්ට අධ්‍යාපනය ලබා දීම පිළිබඳ අප පාසල සතු මෙහෙවර හා අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා, වෙබ් ව්‍යාපාර තාක්‍ෂණය පිළිබඳ උසස් උපාධිය සඳහා වන අපගේ අධ්‍යාපන ඉලක්ක පහත සඳහන් පරිදි සකසා ඇත.

**1) මූලික සාක්ෂරතාවය ලබා ගැනීම**

සිසුන් විසින් ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා පදනම් ලෙස ක්‍රියා කරන සමාජ හා සන්නිවේදන කුසලතා ඉගෙනගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසුන් විසින් තොරතුරු තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි මූලිකාංග ලෙස ක්‍රියා කරන මෘදුකාංග හා දෘඩාංග ජාල වැනි ප්‍රධාන තාක්ෂණයන් පිළිබඳ අවබෝධයක් ලබාගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**2) සැලසුම් හා නිර්මාණ හැකියාව වැඩි දියුණු කරගැනීම**

සිසුන් විසින්: 1) ව්‍යාපාර ක්ෂේත්‍රයේ වර්තමාන සහ අනාගත ප්‍රවණතා සහ එයට ආධාර වන තොරතුරු තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පුළුල් ලෙස පර්යේෂණය සහ විශ්ලේෂණය කිරීම; සහ 2) වැදගත් ආයතනික හා සමාජීය අභියෝගයන්ට තාර්කික විසඳුම් සැලසුම් කිරීම සහ යෝජනා කිරීම ආදිය සම්බන්ධ නිපුණතාවන් වැඩිදියුණු කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, යෝජිත සැලසුම් ක්‍රියාවට නංවන විවිධ පද්ධති සහ අන්තර්ගතයන් සැලසුම් කිරීමේ හැකියාව සිසුන් විසින් ඉහළ නංවාගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**3) වැඩිදියුණු කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ හැකියාව දියුණු කරගැනීම**

සිසුන් විසින් මෘදුකාංග යොදාගැනීම හරහා සැලසුම් කර නිර්මාණය කරන ලද පද්ධති සහ අන්තර්ගතයන් පුද්ගලිකව භාවිතයට ගැනීමේ හැකියාව හෝ ඒවා අවසන් පරිශීලකයින් වෙත ලබා දීමේ හැකියාව දියුණු කරගනු ඇතැයි අපේක්ෂා කරයි. මෙම ක්‍රියාවලියේදී, සිසුන් විසින් මෙම පද්ධති සහ අන්තර්ගතයන් වැඩිදියුණු කිරීම හා ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කරන විවිධ මෙවලම් සහ කේතීකරණ නීතිවලට අදාළ ප්‍රායෝගික දැනුම ගැඹුරින් ගවේෂණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**4) වෘත්තීය දැනුවත්භාවය සහ ආචාරධර්ම පෝෂණය කරගැනීම**

සිසුන් විසින් ව්‍යාපාරික ක්‍රියාවලීන් වගකීමෙන් යුතුව හැසිරවීමේ හැකියාව වර්ධනය කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපාර ක්‍රියාවලීන් අඛණ්ඩව වඩා වර්ධනය කිරීම සඳහා, ඔවුන් ඉහළ වෘත්තීය දැනුමකින් සහ සදාචාරාත්මක ඉදිරිදර්ශනයකින් සන්නද්ධ වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. මෙම කරුණු දෙක සංයෝජනයෙන් සිසුන් තමන් තුළ ප්‍රායෝගික නායකත්ව කුසලතා සහ සංවිධාන කළමනාකරණ ක්‍රම වර්ධනය කරගනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

# KCGI හි විෂයමාලා ව්‍යුහය

KCGI විසින් ICT ක්ෂේත්‍රයේ සිසුන්ට අවශ්‍ය මූලික තාක්‍ෂණික ක්‍රම සහ දැනුම සපයන විෂයමාලා එකම තැනකින් ලබා දේ. අනිවාර්‍ය පාඨමාලා ව්‍යාපාරිකයන්ට අවශ්‍ය මූලික කුසලතා මෙන්ම වෘත්තීය ක්ෂේත්‍රවල භාවිතා වන ප්‍රායෝගික කුසලතා උගන්වන පාඨමාලාවලින් සමන්විත වේ. සංකේන්ද්‍රීය පාඨමාලා යනු විශේෂිත වෘත්තීය ක්ෂේත්‍රයක් පිළිබඳ විවිධ අන්තර්ගතයන් අඩංගු පාඨමාලා වේ. කර්මාන්ත පාඨමාලා ඉහළ ඉල්ලුමක් ඇති ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ පාඨමාලාවලින් සමන්විත වේ. ආධාරක වරණීය පාඨමාලා යනු විශේෂිත සංකේන්ද්‍රීය ක්ෂේත්‍ර සහ කර්මාන්තවලට පරිබාහිරව පුළුල් දැනුමක් වර්ධනය කිරීමේ අරමුණින් ලබා දෙන ලබන පාඨමාලා වේ. අනිවාර්ය පාඨමාලා ව්‍යාපාරිකයන්ට අවශ්‍ය මූලික කුසලතා මෙන්ම වෘත්තීය ක්ෂේත්‍රවල භාවිතා වන ප්‍රායෝගික කුසලතා උගන්වන පාඨමාලාවලින් සමන්විත වේ. KCGI හි පන්තිවල ඉගැන්වීම් කටයුතු සිදු කරන්නේ අදාළ ක්ෂේත්‍රවල ඉදිරි පෙළේ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන විශිෂ්ටයින් විසිනි. එක් එක් පාඨමාලා කාණ්ඩයෙහි අඩංගු පාඨමාලාවලින් නවීන කර්මාන්ත ප්‍රවණතා පිළිබිඹු කරන අතර එම පාඨමාලා කාලානුරූපීව යාවත්කාලීන කරනු ලබයි.

### සංකේන්ද්‍රීය පාඨමාලා

පුළුල් පරාසයක් පුරා පැතිරුණු තොරතුරු තාක්ෂණය ආශ්‍රිත දැනුමින් එක් නිශ්චිත විශේෂ ක්ෂේත්‍රයක් තෝරාගෙන ඒ විෂය පථය අදාත් ගැඹුරින් අධ්‍යනය කිරීම මෙමගින් සිදුවේ. විශේෂිත එමෙන්ම වඩාත් පුළුල් පරාසයක දැනුම ලබාගැනීමට සිසුන්ට පහසුවන ලෙස පාඨමාලා විවිධ ක්ෂේත්‍ර වලට වර්ග කර තිබේ.

- කෘතිම බුද්ධිය (AI)
- දත්ත විද්‍යාව
- වෙබ් පද්ධති සංවර්ධනය
- ජාලකරණ පරිපාලනය
- ගෝලීය ව්‍යවසායකත්වය
- ERP
- IT මැංගා සහ සජීවිකරණය
- සංචාරක තොරතුරු තාක්ෂණය

### කර්මාන්ත පාඨමාලා

මෙම පාඨමාලා මඟින් විශේෂිත ක්ෂේත්‍රයන් තුළ වෘත්තීය දැනුම හා තාක්‍ෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. පාඨමාලා එක් එක් කර්මාන්තය සඳහා විශේෂිත වේ. මෙම දේශන පවත්වනු ලබන්නේ එක් එක් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සිටින විශිෂ්ට ඉදිරි පෙළ ක්‍රියාකාරීන් විසිනි.

- මූල්‍ය
- කෘෂිකර්මයය
- සාමුද්‍රිකය
- සෞඛ්‍ය සහ වෛද්‍ය
- අන්තර්ගත අලෙවිකරණය
- අධ්‍යාපනයය

### ආධාරක වරණීය පාඨමාලා

මෙම විෂය මාලාව සමන්විත වන්නේ, කර්මාන්ත හෝ සංකේන්ද්‍රණ ක්ෂේත්‍ර ලෙස විශේෂණය නොකර, පොදුවේ වෘත්තිකයන් ලෙස සිසුන්ට අවශ්‍ය වන මූලික කුසලතා වන සන්නිවේදනය හෝ කළමනාකරණය ආදිය ඉගැන්වෙන පාඨමාලා වලින් සහ ප්‍රමුඛ පෙළේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ යෙදුම් සහ තාක්‍ෂණික ප්‍රවණතා පිළිබඳ සිද්ධි අධ්‍යයනයන් ආවරණය කෙරෙන පාඨමාලා වලිනි. මන්දයත් මෙමඟින් මූලික දැනුමේ සිට ව්‍යවහාරික භාවිතය දක්වා පුළුල් පරාසයක ඉදිරිදැක්මක් සහිත පාඨමාලා එකට සංයෝජනය කරන හෙයින්, මෙම විෂය මාලාව සිසුන්ගේ ඉගෙනීමේ පෘථුල බව ඉහළ නංවයි.

### අනිවාර්ය

වෘත්තිකයන් උපාධිය ලබා ගත් අධ්‍යයන අංශය කුමක් වුවත්, KCGI විවිධත්වයෙන් යුත් පසුබිම් පරාසයක සිසුන් බඳවා ගනී. මෙම විවෘත ප්‍රවේශය බොහෝ වෘත්තිකයන්ට තම වෘත්තීන් වෙනස් කිරීමට ඉඩහසර ලබා දෙන අතර, ඒ හරහා සැලකිය යුතු සමාජ කාර්යභාරයක් ඉටු වේ. මේ හේතුවෙන්, අනිවාර්ය පාඨමාලා සකසා ඇත්තේ ශිෂ්‍යයාගේ විශේෂීකරණ ක්ෂේත්‍රය කුමක් වුවත් උසස් විශේෂීකෘත ව්‍යාපාරිකයෙකු වෙතින් අපේක්‍ෂා කෙරෙන ශක්තිමත් සහ තාර්කික සන්නිවේදනයේ මූලික කුසලතා පෝෂණය කිරීමේ අරමුණිනි.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය
- නායකත්ව න්‍යාය
- ව්‍යාපෘති පදනම්
- ප්‍රධාන ව්‍යාපෘතිය

### ◆ පාඨමාලා සංයුතිය

**ඇතුළත් වීම**

**අනිවාර්ය**

- තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය
- නායකත්ව න්‍යාය
- ව්‍යාපෘති පදනම්

**සංකේන්ද්‍රීය පාඨමාලා**

- කෘතිම බුද්ධිය (AI)
- දත්ත විද්‍යාව
- වෙබ් පද්ධති සංවර්ධනය
- ජාලකරණ පරිපාලනය
- ගෝලීය ව්‍යවසායකත්වය
- ERP
- IT මැංගා සහ සජීවිකරණය
- සංචාරක තොරතුරු තාක්ෂණය

ඉහත සංකේන්ද්‍රණ ක්ෂේත්‍රයන්ගෙන් එකක් තෝරන්න

**කර්මාන්ත පාඨමාලා**

- මූල්‍ය
- කෘෂිකර්මය
- සාමුද්‍රික
- සෞඛ්‍ය සහ වෛද්‍ය
- අන්තර්ගත අලෙවිකරණය
- අධ්‍යාපනය

**ආධාරක වරණීය පාඨමාලා**

හෝ

**බෙස්පෝක් විෂයමාලාව**

ඔබේ පුද්ගලික අධ්‍යාපන අරමුණු වලට ගැලපෙන පරිදි අනිවාර්ය නොවන පාඨමාලා වලින් විෂයයන් තෝරා ගනිමින් ඔබේම විෂය මාලාවක් ගොඩනගාගන්න.

**ප්‍රධාන ව්‍යාපෘතිය**

**තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති (වෘත්තීය උපාධිය)**

## ප්‍රධාන ව්‍යාපෘතිය

KCGI හි සිටින බොහෝ උපදේශකයින්ට කියෝතෝ විශ්ව විද්‍යාලයේ සහ අනෙකුත් කීර්තිමත් ජපන් විශ්ව විද්‍යාල වල සිසුන්ට උපදේශනය සැපයීම පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති අතර, නැතහොත් ඔවුන් ගෝලීයව මෙම ව්‍යාපාරයන්ගේ ඉදිරි පෙළ ක්‍රියාකාරීන් ලෙස කටයුතු කර ඇත. KCGI සිසුන්ට ඔවුන්ගේ ප්‍රධාන ව්‍යාපෘති පිළිබඳව මෙම උපදේශකයින්ගෙන් සෘජුවම මග පෙන්වීම ලබාගැනීමේ හැකියාව ඇත.

### ◆ සමාලෝචනය

තොරතුරු තාක්‍ෂණයේ ප්‍රායෝගික යෙදීම් සහ තාක්‍ෂණයන් කෙරෙහි අවධානය යොමු කරන KCGI හි ප්‍රධාන ව්‍යාපෘති යනු, අනිවාර්යයෙන් ගත යුතු පාඨමාලා වන අතර, ගැටලුවලට අදාළ තම අවබෝධය මත පදනම්ව ගැටලු ගලපා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ විසඳීම සඳහා සිසුන් යොමුකිරීම මෙහි මූලික අරමුණයි. KCGI ප්‍රධාන ව්‍යාපෘතිවල දී, සිසුන් විශේෂිත මෙවලම්වලට (වේදිකා, මෘදුකාංග, සේවා, රාමු සැකිලි සහ ව්‍යාපාර ආකෘති ඇතුළුව) අවධානය යොමු කරමින් ගැටළු විශ්ලේෂණය කර ඒවාට විසඳුම් ඉදිරිපත් කරනුයේ, ඔවුන් තම අධ්‍යයන කටයුතුවල දී ලබාගත් ක්ෂේත්‍ර සහ කර්මාන්ත පිළිබඳ විශේෂීකෘත දැනුම මනාව උපයෝජනය කරමිනි.

මූලික වශයෙන් පර්යේෂණ මත කේන්ද්‍රගත වූ සාම්ප්‍රදායික උපාධි පාසල්වල ශාස්ත්‍රපති නිබන්ධන මෙන් නොව, KCGI හි ශාස්ත්‍රපති නිබන්ධනය ලිඛිත ශාස්ත්‍රපති නිබන්ධනයකින් සමන්විත විය හැකි ය, නැතහොත් එය නව දැනුම ගවේෂණයකින් හෝ ව්‍යාපෘතියකට දැනට පවතින මෙවලම් යෙදීමෙන් සමන්විත නිබන්ධනයක් විය හැකි ය. සිසුන්ට තම අභිමතයන් සහ අභිලාෂයන් අනුව ඔවුන්ගේම තේමා සහ ප්‍රවේශයන් තෝරා ගැනීමේ නිදහස ඇත.

ප්‍රධාන ව්‍යාපෘතිය ශිෂ්‍යයාගේ අධ්‍යයනවල අග්‍ර ඵලය යි. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය ප්‍රායෝගික භාවිතය තුළින් සැබෑම ප්‍රජාවන්ගේ සහ මිනිසුන්ගේ ජීවිත වඩා වර්ධනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම මෙහි අරමුණ යි.

### ◆ ක්‍රියාත්මක කිරීමේ ක්‍රම

ව්‍යාපෘති අනුග්‍රාහකයෙකුගේ මගපෙන්වීම යටතේ සිසුන් තම ප්‍රධාන ව්‍යාපෘති ස්වකීය මුලපිරීමෙන් ඉදිරියට කරගෙන යයි. ප්‍රධාන ව්‍යාපෘතිය විශේෂීකෘත තාක්‍ෂණය ප්‍රායෝගිකව යොදවන ව්‍යාපෘතියක් හෝ ගැඹුරු අධ්‍යයන පර්යේෂණයකින් සමන්විත ව්‍යාපෘතියක් විය හැකි ය. පුහුණුව සකසා ඇත්තේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගෝලීය මුදුන් මල්කඩ වන එක්සත් ජනපදයේ කොලොම්බියා විශ්ව විද්‍යාලය අනුසාරයෙනි. සිසුන්ට තමා සතු කාලය සහ ව්‍යාපෘතියේ ස්වභාවය මත පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති ආකාර හතරෙන් ඕනෑම එකක් තෝරාගත හැකි නම්‍යශීලී ප්‍රවේශයක් ඇත.

#### ප්‍රධාන වාර්තාව

**1 වර්ගය** ශිෂ්‍යයා තම විශේෂීකරණ ක්ෂේත්‍රයෙන් එක් පාඨමාලාවක් තෝරාගෙන එම පාඨමාලාවට අදාළ තේමාවක් පිළිබඳ පර්යේෂණයක් සිදු කර වාර්තාව සම්පූර්ණ කරයි.

#### ප්‍රධාන ව්‍යාපෘතිය

**2 වර්ගය** ශිෂ්‍යයා තමාගේම නිදහස් සංකල්පන තේමාවක් තීරණය කර තම අරමුණු සහ රුචිකත්වයන් අනුව ව්‍යාපෘතියක් සිදු කරයි.

#### ගෞරව ප්‍රධාන ව්‍යාපෘතිය

**3 වර්ගය** ශිෂ්‍යයා ප්‍රධාන වශයෙන් සංකීර්ණ අන්තර්ගතයක් හෝ අසාමාන්‍ය ලෙස විශාල තේමාවක් සහිත ව්‍යාපෘතියක් සිදු කරයි. ශිෂ්‍යයා තමන් විසින්ම තේමාව තීරණය කරන අතර එය ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය කාලය වැය කරයි.

#### ගෞරව ප්‍රධාන නිබන්ධනය

**4 වර්ගය** මෙම වර්ගය ලෝකයේ ශ්‍රේෂ්ඨ විශ්වවිද්‍යාලවලට සමාන මට්ටමේ ශාස්ත්‍රපති නිබන්ධනයක් නිර්මාණය කිරීමට ඉලක්ක කරන සිසුන් සඳහා වේ. ශිෂ්‍යයා තමන් විසින්ම තේමාව තීරණය කරන අතර එය ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය විශාල කාලයක් වැය කරයි.









# KCGI හි අධ්‍යයනය සඳහා සංකේන්ද්‍රීය ක්ෂේත්‍ර අටක් තිබේ

සංකේන්ද්‍රීය ක්ෂේත්‍ර යනු විශේෂීකෘත සහ පුළුල් පදනමක් සහිත විශේෂිත විෂය පථයක දැනුම් සම්භාරයක් ගොඩනඟා ගැනීමට සිසුන්ට තෝරාගත හැකි පාඨමාලා ක්ෂේත්‍ර වේ. KCGI තුළ කර්මාන්ත ක්ශේත්‍රය මගින් සමීපව නිරීක්ෂණය කරනු ලබන සහ ICT ආශ්‍රිත දැනුම සහ කුසලතා සඳහා ඇති ඉල්ලුම විශේෂයෙන් ඉහළ මට්ටමක පවතින වෘත්තීය විෂයපථ වර්ග අටක් අපි හඳුනාගෙන ඇත. අපි අරමුණු අනුව පාඨමාලා තෝරා වර්ග කරන්නෙමු. සෑම ශිෂ්‍යයෙක්ම තම අභිලාෂයන් සහ ඉලක්කවලට අනුකූලව එක් සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයක් තෝරා ගෙන එම ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. (එක් එක් සංකේන්ද්‍රීය ක්ෂේත්‍රය පිළිබඳ විස්තර සඳහා 19 පිටුව බලන්න.)

## කෘතිම බුද්ධිය (AI)

සිසුන් කෘත්‍රිම බුද්ධිය (AI) සහ ඒ ආශ්‍රිත දත්ත විද්‍යාව වැනි තාක්‍ෂණික ක්ෂේත්‍ර පිළිබඳ ඉගෙන ගනී. සැබෑ ලෝකයේ නිදසුන් අනුසාරයෙන් ව්‍යවහාරික ක්ෂේත්‍රවල AI භාවිතා වන ආකාරය අධ්‍යයනය කිරීමෙන් පසු, සිසුන් AI සම්බන්ධ මෘදුකාංග යෙදුම් රාශියක ප්‍රවීණයන් බවට පත් වේ. AI ඵලදායී ලෙස භාවිතා කළ හැකි වෘත්තිකයන් සංවර්ධනය කිරීම මෙහි අරමුණ යි. මෙම පාඨමාලාවලට තමන්ගේම AI යෙදු මෘදුකාංගයක් සංවර්ධනය කළ හැකි උසස් ඉංජිනේරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ඇතුළත් වේ.

## දත්ත විද්‍යාව

ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍ර තුළ සමුච්චිත දත්ත පරිමාවන් ඵලදායී ලෙස භාවිතයේ අවශ්‍යතාව පුළුල් ලෙස හඳුනාගෙන ඇත. මේ සඳහා දත්ත කළමනාකරණ තාක්‍ෂණය සහ දත්ත විශ්ලේෂණ ක්‍රම පිළිබඳව පර්යේෂණ සහ ඉගෙනුම් කටයුතු සිදු කෙරේ. KCGI විසින් ව්‍යාපාරික ලෝකයට බෙහෙවින් ආදේශ කළ හැකි අධ්‍යයන ඉලක්ක සහිතව, තොරතුරු තාක්‍ෂණයේ විවිධ ක්ෂේත්‍රයන් සඳහා අත්‍යවශ්‍ය විශේෂඥ දැනුම ඉගැන්වීමේ පාඨමාලා රාශියක් පිරිනමනු ලබයි.

## වෙබ් පද්ධති සංවර්ධනය

වෙබ් පද්ධති සංවර්ධකයින් වෙබ් අඩවි කේතනය කිරීමට ක්‍රමලේඛන භාෂා සහ HTML5 වැනි සංලක්‍ෂණ භාෂා භාවිතා කරයි. අන්තර්ගත කළමනාකරණ පද්ධතියක් (CMS) භාවිතා කිරීම ඔවුන්ගේ රාජකාරිවලට ඇතුළත් අංගයකි. වෙබ් පද්ධති ක්‍රමලේඛනයට සහ කේතනයට අමතරව, මෙම පාඨමාලා හදාරන සිසුන් ජාලවලට ආධාරක වන මූලික තාක්‍ෂණයන් අධ්‍යයනය සිදු කරයි.

## ජාලකරණ පරිපාලනය

ජාල යනු තොරතුරු පද්ධති දරා සිටින අත්‍යාවශ්‍යක සම්බන්ධතා සමූහය යි. ජාල සේවා පරිපාලනයට පරිගණක ජාල සහ සේවාදායක පද්ධති වින්‍යාස කිරීම, දෝෂ නිරාකරණය, සහාය කළමනාකරණය සහ බිඳවැටීම් ප්‍රකෘතිමත් කිරීම සහ බිඳවැටීමක් සිදු වූ විට දත්ත සුරැකීම ඇතුළත් වේ. මෙම හේතූන් නිසා, සිසුන්ට මෙම පාඨමාලා මගින් ජාල පද්ධති ක්‍රියාකාරිත්වය සහ තොරතුරු ආරක්ෂණය පිළිබඳ දැනුම ලබා දෙයි.

## ගෝලීය ව්‍යවසායකත්වය

මෙම පාඨමාලාවල අරමුණ වන්නේ නායකත්ව සහ ව්‍යවසායකත්ව මානසිකත්වය වර්ධනය කිරීම සහ ගෝලීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ව්‍යවසායකයෙකු වීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දීම යි. මෙහි අධ්‍යයන කටයුතු මගින් ඉ-වාණිජ්‍යය සහ ඔන්ලයින් ව්‍යාපාර ඇතුළු ගෝලීය ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කෙරේ. කෙසේ වෙතත්, මීට අමතරව සිසුන් මූල්‍ය සහ කළමනාකරණය පිළිබඳ මූලික කරුණු මෙන්ම වර්ධක ඉඟි සහ වර්ධක අලෙවිකරණය වැනි නවතම ප්‍රායෝගික අලෙවිකරණ ප්‍රවේශයන් පිළිබඳ සංක්ෂිප්ත දැනුමක් ලබා ගනී.

## ERP

කර්මාන්තයේ දැවැන්තයෙකු වන SAP හි අධ්‍යාපනය සඳහා වන ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය කෙරෙහි අවධානය යොමු කරමින්, සිසුන් ව්‍යාපාර සමෝධානය සඳහා වූ ප්‍රවේශයන්, සහ මූල්‍ය ගිණුම්කරණය සහ විකුණුම් කාර්‍ය සම්පාදනය වැනි කාර්යයන් සඳහා වන ක්‍රියාවලීන් පිළිබඳව ප්‍රායෝගික අධ්‍යයනයක නියැලීම සිදු කරයි. මෙහි දී සිසුන් ව්‍යාපාර මුහුණ දෙන පුළුල් පරාසයක ගැටළු සහ ERP ක්‍රියාවට නැංවීම පිළිබඳ සමීක්‍ෂණ නිදසුන් ද විශ්ලේෂණය සිදු කරයි.  අභ්‍යන්තර-මතක දත්ත සමුදායන් සහ IoT වැනි නවීන ව්‍යවසාය යටිතල පහසුකම් වෙත ERP සම්බන්ධ කිරීම පිළිබඳව ද පර්යේෂණ සිදු කෙරේ.

## IT මැංගා සහ සජීවිකරණය

මාංගා සහ ඇනිමෙ ආදී අන්තර්ගත සහ නිර්මාණාත්මක කර්මාන්තවල දී ICT හි ප්‍රවීණතාව අත්‍යවශ්‍ය වේ. මූලික තාක්‍ෂණයන්ට අමතරව, මෙම ක්ෂේත්‍රවල වෘත්තිකයින් පුළුල් පරසයක ඩිජිටල් මෙවලම්වල ප්‍රවීණයන් විය යුතු අතරම, ඔවුන්ට තත්ත්වානුකූලව විසඳුම් සෙවීමේ හැකියාව තිබිය යුතු ය. මෙම පාඨමාලා මඟින් අන්තර්ගත නිර්මාණය කිරීමට පමණක් නොව පුළුල් පරාසයක අභියෝගවලට නිර්මාණශීලීව ප්‍රතිචාර දැක්වීමට මෙම පුළුල් කුසලතාව යොදාගත හැකි පුද්ගලයින් බිහි කිරීම ද සිදු කරයි.

## සංචාරක තොරතුරු තාක්ෂණය

මෙම පාඨමාලාවල දී නව සංචාරක සේවා සහ සංචාරක ව්‍යාපාර ආකෘති නිර්මාණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය භාවිතා කිරීම පිළිබඳව සිසුන් ඉගෙන ගනී. නිදසුන් ලෙස විවිධ භාෂා සහ මාධ්‍යවලින් සංචාරක තොරතුරු සැපයීම; සංචාරකයින්ගේ ක්‍රියාකාරකම් ඉතිහාසය, අත්දැකීම් සහ හැඟීම් පිළිබඳ ඩිජිටල් ලේඛනාගාර නිර්මාණය කිරීම; සහ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සහ පුරෝකථනය කිරීම දැක්විය හැක. මෙම පාඨමාලා මගින් සංචාරක DX භාවිතා කිරීම, අතථ්‍ය සංචාරක ව්‍යාපාරය වැනි ඩිජිටල් සම්පත් නිර්මාණය කිරීම සහ යෙදවීම ආදිය හරහා සංචාරක ප්‍රදේශ පුනර්ජීවනය කිරීමට විසඳුම් යෝජනා කළ හැකි පුද්ගලයින් නිර්මාණය කරයි.

### බෙස්පෝක් විෂයමාලාව

ICT ක්ෂේත්‍රය දිනෙන් දින ඉදිරියට යමින් පවතී. මෙම නිරන්තර ප්‍රගතියට ප්‍රතිචාර දැක්වීම සඳහා, යමෙකුට එක් සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවී තමාගේම විෂය මාලාවක් සම්පාදනය කර අධ්‍යයනය කිරීමට අවශ්‍ය විය හැකි ය. ශිෂ්‍යයෙකුට තමාගේම අධ්‍යයන අරමුණුවලට අනුව උපදේශකයෙකු සමග සාකච්ඡා කර, පුළුල් පරාසයක දැනුම සහ යෙදුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මුල් විෂය මාලාවක් ගොඩනඟා ගැනීම සඳහා අනිවාර්ය පාඨමාලාවලට අමතරව අනෙකුත් පාඨමාලා කාණ්ඩ අතරින් පාඨමාලා තම සිදැඟි පරිදි තෝරා ගත හැකි ය. අපි මෙම ප්‍රවේශය “බෙස්පෝක් විෂයමාලාවක්” ලෙස හඳුන්වමු.

# කාර්මික යෙදුම්

ICT ආශ්‍රිත පරිසරය පෙර නොවූ විරූ ආකාරයෙන් වෙනස් වෙමින් පවතින බැවින් ICT ප්‍රායෝගිකව භාවිතා වන ක්ෂේත්‍ර ශීඝ්‍රයෙන් විවිධාංගීකරණය වෙමින් පවතී. KCGI හි එක් එක් සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට ඇතුළත් කර ඇති පාඨමාලා හැඩසවා ඇත්තේ විශේෂඥ දැනුම අවශ්‍ය කරන විශේෂිත කර්මාන්ත සහ ව්‍යාපාර වර්ගවල එම අධ්‍යයනයන් ප්‍රායෝගිකව යෙදවීම සඳහා ICT ප්‍රායෝගිකව භාවිතයට ගැනීමේ අභිප්‍රායෙනි. කර්මාන්තමය අපේක්‍ෂාවන් ඉහළ මට්ටමක පවතින පහත සඳහන් කර්මාන්ත සහ ව්‍යාපාර වර්ග හය කෙරෙහි අපි විශේෂයෙන් අවධානය යොමු කරනුයේ ICT භාවිතයෙන් ඒවාට විසඳුම් ලබා ගැනීමේ අරමුණිනි. එක් එක් කර්මාන්තය තුළ ක්‍රියාකාරී භූමිකාවන් ඉටු කළ හැකි සේවක පිරිස් සංවර්ධනය කිරීමේ අරමුණින් පාඨමාලා තෝරාගෙන කාණ්ඩගත කෙරේ. තෝරාගත් සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට සමගාමීව මෙම පාඨමාලා අධ්‍යයනය කළ හැක. (එක් එක් කර්මාන්ත පාඨමාලාව පිළිබඳ විස්තර සඳහා 24 සහ 25 පිටු බලන්න.)

## මූල්‍ය

මූල්‍ය ක්ශේත්‍රය තුල තොරතුරු තාක්ෂණයේ උපයෝගිතාව මෙමගින් අධ්‍යනය කෙරේ. මෙම පාඨමාලා මගින් බැංකුවල සිදුවන මූලික මෙහෙයුම් කටයුතු මෙන්ම ඉලෙක්ට්‍රොනික මුදල් වල වත්මන් තත්වය, අතත්‍ය මුදල් සහ අනෙකුත් මූල්‍ය තාක්ෂණයන් පිළිබඳව සිසුන්ව දැනුවත් කරයි.

## කෘෂිකර්මය

කෘෂිකර්මාන්තයේදී තොරතුරු තාක්ෂණයේ භාවිතය පිළිබඳව මෙහිදී සිසුන් අධ්‍යනය කරනු ලැබේ. වගා කිරීමේදී අවශ්‍ය පරිසර තත්ත්ව පාලනය කිරීම (පැල සැකසුම් කර්මන්තශාලා වල මෙන්), ඵලදාව බෙදාහැරීම වැනි මාතෘකා මේ යටතේ සිසුන් ඉගෙන ගනියි.

## සාමුද්‍රික

නැව් තැනීම හා සාමුද්‍රික ප්‍රවාහනයෙහිලා තොරතුටු තාක්ෂණයේ උපයෝගීතාව මේ විෂයමාලාව යටතේ අධ්‍යනය කෙරේ. නැව් යාත්‍රණය පාලනය කිරීම, මෙන්ම මුහුදු ජලජීවී වගාව පිළිබඳවද මෙහිදී අවධානයට ලක් කරයි.

## සෞඛ්‍ය සහ වෛද්‍ය

වෛද්‍ය ක්ෂේත්‍රය තුල තොරතුරු තාක්ෂණයේ උපයෝගිතාව පිළිබඳව සිසුන් මෙහිදී අධ්‍යනය කරයි. විද්‍යුත් වෛද්‍ය වාර්ථා වල දත්ත කළමනාකරණය, රෝග විනිශ්චය සඳහා කෘතීම බුද්ධිය සහ දත්ත දෘෂ්‍යකරණය උපකාර කරගැනීම යන මාතෘකා මේ යටතේ සිසුන් ඉගෙන ගනී.

## අන්තර්ගත අලෙවිකරණය

මන්ගා, ඇනිම්, වීඩියෝ, සංගීතය සහ අනෙකුත් මාධ්‍ය වල තොරතුරු තාක්ෂණික යෙදවුම් පිළිබඳව සිසුන් අධ්‍යනය කරයි. මේ යටතේ අධ්‍යනය කරන මාතෘකා අතර නිෂ්පාදන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම, බුද්ධිමය දේපළ හිමිකම් කළමනාකරණය, ප්‍රවර්ධන උපායමාර්ග යන විෂයන්ද වේ.

## අධ්‍යාපනය

මෙම පාඨමාලාව යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රය තිළ තොරතුරු තාක්ෂණයේ භාවිතය පිළිබඳව සිසුන් අධ්‍යනය කරයි. මෙහිදී, ඉ-ඉගෙනුම් ක්‍රියාවලි සඳහා අවශ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම සහ නිෂ්පාදනය කිරීම, පුළුල් පරාසයක විහිදුනු සන්නිවේදන පද්ධති ඇතුළු තවත් බොහෝ දෑ පිළිබඳව සිසුන් ඉගෙනුම ලබයි.



# සංකේන්ද්‍රණ ක්ශේත්‍ර

## කෘතිම බුද්ධිය (AI)

▶ මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 28 පිටුව බලන්න.

20 වැනි සියවසේ අග භාගයේ කෘත්‍රිම බුද්ධිය (AI) ලෝකයේ අවධානය දිනා ගැනීමට පටන් ගත් දා සිට එය තොරතුරු විද්‍යාවේ ප්‍රධාන ක්ෂේත්‍රයක් බවට පත්ව ඇත. අද එය සමාජය ගැඹුරු පරිවර්තනයකට ලක් කරන ප්‍රධාන තාක්‍ෂණයකි. ස්වභාවික භාෂා, කටහඬ සහ රූප හඳුනා ගැනීම, සෙවීම සහ නිශ්චය කිරීම ආදිය මූලික තාක්‍ෂණයන් ලෙස ඉස්මතු වීමත් සමග, යන්ත්‍ර පරිවර්තනය, ස්වයංක්‍රීය ලඝුලේඛනය, මුහුණු හඳුනාගැනීම, ස්වයංක්‍රීය රිය ධාවනය, වෛද්‍ය තොරතුරු සැකසීම, හෙද සත්කාර සඳහා රොබෝවරුන් යෙදවීම සහ ගෝ සහ චෙස් වැනි ක්‍රීඩා සහ ඉ-ක්‍රීඩා වැනි විනෝදාස්වාද ආදී වෙනත් යෙදුම් ඇතුළු AI ප්‍රායෝගිකව යොදා ගන්නා ක්ෂේත්‍ර ශීඝ්‍ර ලෙස පුළුල් වෙමින් පවතී. මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රය මගින් සිසුන් AI හි මූලික න්‍යාය සහ දත්ත විද්‍යාව වැනි අදාළ ක්ෂේත්‍ර අධ්‍යයනය කරන අතර, සිද්ධි අධ්‍යයනයන් හරහා මෙම තාක්‍ෂණයන් ප්‍රායෝගිකව යොදා ගන්නා ආකාරය ඉගෙන ගනී. මීළඟට සිසුන් AI තාක්‍ෂණය ප්‍රායෝගික භාවිතයට ගැනීමේ හැකියාව ඇති විශේෂඥයින් බවට පත් වීමේ අරමුණ ඇතිව AI හා සම්බන්ධ බොහෝ මෘදුකාංග යෙදුම් ගැන පළපුරුද්ද ලබා ගනී. KCGI විසින් AI සඳහා ව්‍යවහාරික මෘදුකාංග සංවර්ධනය කළ හැකි උසස් ඉංජිනේරුවන් සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ද පිරිනමයි.

### ඉලක්කගත වෘත්තීය මාර්ග

- ඉදිරියට පැමිණීමට නියමිත AI මූලික සමාජය තුළ ඉහළට යා හැකි වන අයුරින් මූලික සහ ව්‍යවහාරික AI තාක්‍ෂණය හදාරන පුද්ගලයන්
- මහා පරිමාණ Python වැඩසටහන් සංවර්ධනය කිරීමේ කුසලතා ඇති සහ දැනට පවතින AI ආශ්‍රිත මෘදුකාංග ඵලදායි ලෙස භාවිතා කළ හැකි පුද්ගලයන්
- රටා හඳුනාගැනීමේ දී (රූප, හඬ, භාෂාව ආදිය) සහ ව්‍යාපාර තුළ නවෝත්පාදක AI යෙදුම් සඳහා මෘදුකාංග සංවර්ධනය කළමනාකරණය කළ හැකි උසස් ඉංජිනේරුවන්



### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

මහාචාර්ය **ෂින්ජි ටොමීටා Shinji Tomita**

AI අධ්‍යයනය සඳහා ගණිතයේ මූලික සිද්ධාන්ත අතිශය වැදගත් වේ. සැබවින්ම ගණිතය යනු අංක එකේ අවශ්‍යතාව පමණක් නොව, දෙවන සහ තෙවන අවශ්‍යතා ද වේ. අවාසනාවකට මෙන් බොහෝ සිසුන් ගණිතයට කැමැත්තක් නොදක්වයි. එය ඇත්තෙන්ම ලැජ්ජාවට කරුණකි, මන්ද යත් මෙම රසවත් විෂය එහි ඵල නෙලාගනු ඇතැයි ආශාවෙන් බලා සිටින නමුත් සිසුන් දැනටමත් එයට අකමැති නිසාවෙන් එම රස ඵල ගිලිහී යන නිසාවෙනි.

ඇතැමුන් විශ්වාස කරන පරිදි AI විසින් මිනිසුන්ගේ තැන අත්පත් කරගන්නා “Singularity” සංසිද්ධිය 2045 දී සිදුවනු ඇතැයි මම විශ්වාස නොකරමි. නමුත් AI විසින් සමාජය නොසිතූ විරූ පරිවර්තනකට ලක් කරනු ඇති බව නම් නිසැක ය. අප විසින් ඉදිරියට එළඹෙන AI සහයෝගී සමාජය තුළ දියුණු වීමට අවශ්‍ය කුසලතාවලින් මිනිසුන්ව සන්නද්ධ කළ යුත්තේ එබැවිනි. මිනිසුන් තමාට අවශ්‍ය මූලික න්‍යාය අධ්‍යයනය කර තේරුම් ගත් පසු, ඔවුන් කැමති නම් ඔවුන්ට එම මූලික න්‍යාය අමතක කර දැමිය හැක. නමුත් පළමුව ඔවුන් AI තාක්‍ෂණය තමා විසින්ම අත්විඳිය යුතු ය.

## දත්ත විද්‍යාව

▶ මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 28 පිටුව බලන්න.

දත්ත විද්‍යාව යනු තොරතුරු විද්‍යාවේ මෑතකාලීනව සැලකිය යුතු අවධානයක් දිනාගත් ශාඛාවකි. එය උපුටා දක්වා ඇත්තේ විවිධ තොරතුරු තාක්‍ෂණ ව්‍යවහාරික ක්ෂේත්‍රවල මහා පරිමාණ සමුච්චිත දත්ත භාවිතය සඳහා වූ අත්‍යවශ්‍ය රීතියක් ලෙස යි. මේ හේතුවෙන් KCGI ඊට අදාළ දත්ත කළමනාකරණ තාක්‍ෂණයන් සහ දත්ත විශ්ලේෂණ පිළිබඳ පර්යේෂණ සහ ඉගැන්වීම් කටයුතු සිදු කරයි. දත්ත විද්‍යාව, දත්ත කළමනාකරණය සහ විශ්ලේෂණය සිදු කළ මුල් කාලයේ සිටම දත්ත විද්‍යාඥයින් දත්ත සමුදා තාක්‍ෂණය සහ සංඛ්‍යාන විශ්ලේෂ පුළුල් ලෙස භාවිතයට ගෙන ඇත. කෙසේ වෙතත්, අති විශාල Big Data පරිමාවල ශීඝ්‍ර වර්ධනය හසුරුවා ගැනීමට මෙම පැරණි තාක්‍ෂණ ක්‍රමවලට නොහැකි බව මෑතකාලීනව සනාථ වී ඇත. දෘඩාංග සහ මෘදුකාංග යන දෙ අංශයෙන්ම වඩාත් දියුණු දත්ත සැකසුම් තාක්‍ෂණයන් අත්‍යවශ්‍ය වේ. දත්ත විද්‍යාව සහ AI අතර පවතින්නේ ඉතා සමීප සම්බන්ධතාවකි. පුළුල් අර්ථයෙන් ගතහොත්, මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයන්ගේ අධ්‍යයන අරමුණු ව්‍යාපාර ක්ෂේත්‍ර හා බැඳී පවතී.

### ඉලක්කගත වෘත්තීය මාර්ග

- තොරතුරු සම්පත් නිස්සාරණය සහ භාවිතය (දත්ත කැණීම), වෙළඳපල විශ්ලේෂණය ආදිය සිදු කරන විශ්ලේෂකයින්
- නිෂ්පාදන සැලසුම්කරණය සඳහා උපදෙස් සහ ප්‍රතිපත්ති සපයන උපදේශකයින්
- දත්ත මත පදනම්ව යෝජනා සහ ආයතනික උපායමාර්ග ප්‍රවර්ධනය පිළිබඳ තීරණ ගත හැකි CIOවරුන්
- සටහන්කරණ ආකෘති සහ උපායමාර්ග මෙන්ම පාරිභෝගික වයීවන් සඳහා පුරෝකථන ආකෘති ගොඩනඟන CRM කළමනාකරුවන්



### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

මහාචාර්ය **යොයිචි ටෙරෂිටා Yoichi Terashita**

මා විසින් අධීක්ෂණය කරන ව්‍යාපෘති දත්ත සමූහනය කිරීම, කළමනාකරණය සහ විශ්ලේෂණය පිළිබඳ පර්යේෂණ සහ ප්‍රායෝගික අත්දැකීම්වලින් සමන්විත වේ. ව්‍යාපෘති සාම්ප්‍රදායික දත්ත සමුදා කළමනාකරණ තාක්‍ෂණයන් මත පදනම් වන අතරම, සිසුන් Big Data හි මෑතකාලීන ශීඝ්‍ර ප්‍රසාරණය හසුරුවා ගත හැකි නව දත්ත කළමනාකරණ තාක්‍ෂණයන් ප්‍රායෝගිකව යොදාගැනීම සම්බන්ධ අත්දැකීම් ද ලබා ගනී. මාගේ ඉලක්කය වන්නේ අද ක්‍රියාත්මක වන බොහෝ ප්‍රමුඛ පෙළේ තොරතුරු තාක්‍ෂණ සමාගම්වල ක්‍රියාකාරී භූමිකාවන් ඉටු කළ හැකි පුද්ගලයින් පුහුණු කිරීම යි. මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයේ නමින් හැඟවෙන පරිදි, මෙම දත්ත කළමනාකරණ තාක්‍ෂණයන් සාමූහිකව “දත්ත විද්‍යාව” ලෙස හැඳින්වීමට යොමු වී තිබේ. ඉදිරියේ දී තොරතුරු තාක්‍ෂණයේ පදනමක් ලෙස දත්ත විද්‍යාවෙහි වැදගත්කම ශීඝ්‍රයෙන් ඉහළ යනු ඇති බවට සැකයක් නොමැත.

## වෙබ් පද්ධති සංවර්ධනය

▶ මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 28 පිටුව බලන්න.

රීතියක් ලෙස වෙබ් පද්ධති සංවර්ධනයට, සමාගම්වල අභ්‍යන්තර භාවිතය සඳහා අන්තර්ගතයන් තබා ගැනීම සඳහා වූ ආයතන ඇතුලත ජාලයන්හි වෙබ් අඩවි නිෂ්පාදනය කිරීම සහ බාහිර භාවිතය සඳහා ප්‍රදර්ශනය කෙරෙන අන්තර්ජාලයේ වෙබ් අඩවි නිෂ්පාදනය කිරීම යන දෙකම ඇතුළත් වේ. සාමාන්‍යයෙන්, වෙබ් පද්ධති සංවර්ධකයින් ප්‍රෝග්‍රෑම් භාෂා සහ HTML5 වැනි මාර්ක්-අප් භාෂා භාවිතා කරමින් වෙබ් අඩවි කෝඩින් කරයි. කෙසේ වෙතත්, අන්තර්ගතයන් කළමනාකරණ පද්ධති (CMS) භාවිතය ද ඔවුන්ගේ රාජකාරිවලට ඇතුළත් වේ. මෙම විශේෂඥ ක්ෂේත්‍රය තුළ, සිසුන් විසින් වෙබ් පද්ධති ප්‍රෝග්‍රෑම් කරන්නේ කෙසේද සහ කෝඩින් කරන්නේ කෙසේදැයි ඉගෙන ගන්නා අතර, ජාල වල මූලික කරුණු අධ්‍යයනය කරයි.

### ඉලක්කගත වෘත්තීය මාර්ග

- පහසු සහ ප්‍රයෝජනවත් වෙබ් අඩවි නිර්මාණකරු/ක්‍රමලේඛක
- නව වෙබ් අඩවි දියත් කිරීමට සහ පවතින අඩවිවලට සහය දැක්වීමට සහ වැඩිදියුණු කිරීමට කටයුතු කරන නිර්මාණකරු
- තම සමාගමේ වෙබ් අඩවියේ විශිෂ්ටත්වයට සහ වැඩිදියුණුවට සහාය වන වෙබ් අඩවි කළමනාකරු
- යෙදුම් නිර්මාණය සඳහා, පවතින වෙබ් සේවා ක්ලවුඩ් සේවා සමග ඒකාබද්ධ කළ හැකි ඉංජිනේරුවා

### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

සහායක මහාචාර්ය **තකඕ නකගුචි Takao Nakaguchi**



වෙබ් පද්ධති සංවර්ධනය ඇදහිය නොහැකි තරම් විවිධත්වයකින් යුක්ත වේ. එහි දී සේවා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා දැනටමත් බහුලව භාවිතා වන පරිණත තාක්ෂණයන් භාවිතා කරන නමුත්, පෙර නොවූ විරූ සේවාවන් නිර්මාණය කිරීම සඳහා නවීන තාක්ෂණයන් භාවිතා කිරීම ද එහි දී සිදු වේ. එයට කාර්යාල සැකසුම් තුළ දක්නට ලැබෙන පන්නයේ පරිපාලන තිර සහිත වෙබ් පද්ධති ඇතුළත් විය හැක, එසේත් නැතහොත් ස්මාර්ට් ජංගම දුරකථන තුළ භාවිතය සඳහා AR යෙදුම් නිර්මාණය කිරීම ඇතුළත් විය හැක. සමහර ව්‍යාපෘතිවලට සංවේදක සහ කැමරා වැනි උපාංගවලින් තොරතුරු රැස් කරන අන්තර්ජාලමය අංග (IoT) ඇතුළත් විය හැකි ය. අනෙකුත් ව්‍යාපෘතිවලට කෘත්‍රිම බුද්ධිය (AI) යොදා ගැනීම සිදුවිය හැකි අතර, අසාමාන්‍යතා හඳුනාගැනීම සමග රූප හඳුනාගැනීම ඒකාබද්ධ කිරීම එයට නිදසුනකි. මෑතකාලීන පද්ධති සංවර්ධන ව්‍යාපෘති බොහොමයක් යථාර්ථයක් කරගනු ලැබුවේ වෙබ් තාක්ෂණය භාවිතයෙනි. මෙහි දී පුළුල් පරාසයක ක්‍රමලේඛන භාෂා, දත්ත සමුදායන් සහ යනාදිය ද වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

වැදගත් කරුණ වන්නේ එවැනි පුළුල් පරාසයක තාක්ෂණයන් සමග ක්‍රියා කරන විට ඔබ පද්ධතිය සංවර්ධනය කරන අරමුණ කුමක් දැයි පැහැදිලිව තහවුරු කර ගැනීම යි. පද්ධතිය භාවිතා කිරීමට අපේක්ෂා කරන්නේ කුමන ක්ෂේත්‍රයක ද? ගැටළුව කුමක් ද සහ පද්ධතියෙන් එය නිරාකරණය කරන්නේ කෙසේ ද? ඔබේ යෝජිත පද්ධතිය නිර්මාණය කිරීමට ඔබ භාවිතා කරන තාක්ෂණයන් මොනවා ද? ඔබ මෙම දේවල් තහවුරු කරගත් පසු, ඔබට ඔබේ පද්ධතිය සංවර්ධනය කර පරිශීලකයන්ට එය උත්සාහ කර බැලීමට ඉඩ සලසා ප්‍රතිඵල ඇගයීමට ලක් කළ හැක. එවැනි ව්‍යාපෘති සඳහා සහභාගී වීමෙන් සමාජයට මහෝපකාරී වන පද්ධති සැලසුම් කිරීමට සහ සංවර්ධනය කිරීමට අවශ්‍ය කුසලතා සිසුන්ට ලබා දේ. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසුව සිසුන් වෙබ් තාක්ෂණ විශේෂඥයන් ලෙස ක්‍රියාකාරී වෘත්තීන් ආරම්භ කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

## ජාලකරණ පරිපාලනය

▶ මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 28 පිටුව බලන්න.

ජාල සේවා යනු වර්තමාන තොරතුරු පද්ධතිවල තීරණාත්මක අංගයකි. ජාල පරිපාලකයින් විසින් පරිගණක ජාල සහ සර්වර් පද්ධති ගොඩනඟයි, ගැටළු නිරාකරණය කරයි, එමෙන්ම මෙම ජාල සහ පද්ධති කළමනාකරණය කිරීම සහ සහාය දැක්වීම සිදු කරයි. ජාලයක ගැටළුවක් ඇති වූ විට, ජාල පරිපාලක විසින් ගැටලුවෙන් අත්මිදීමට කටයුතු කරන අතර, ජාලයේ දත්ත ආරක්ෂා කරගනී. මෙම විශේෂඥ ක්ෂේත්‍රය තුළ, ජාල පද්ධතිවල ක්‍රියාකාරිත්වය සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ දැනුම සිසුන් විසින් ලබා ගනී.

### ඉලක්කගත වෘත්තීය මාර්ග

- අන්තර්ජාල සේවා නිර්මාණකරු/ක්‍රියාකරු/පරිපාලක
- ආයතනික අන්තඃජාල සහ ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය ව්‍යාපාරික පද්ධති සඳහා වන ආරක්ෂණ කළමනාකරු
- විවිධ සේවාදායක පරිසර (වෙබ්, දත්ත සමුදා, වීඩියෝ ආදී) ගොඩනඟන හා ක්‍රියාත්මක කරන කළමනාකරු
- ක්ලවුඩ් සේවා සහ IoT උපාංග ඇතුළුව පුළුල් පරාසයක ජාල ඒකාබද්ධ කරන හා නඩත්තු කරන උපදේශක
- ජාල පද්ධති සඳහා සේවාග්‍රාහක/සේවාදායක මෘදුකාංග සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සිදු කරන ඉංජිනේරු

### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

මහාචාර්ය **ෂොසො නයිතො Shozo Naito**



මගේ විශේෂීකරණ ක්ෂේත්‍රය තොරතුරු ආරක්ෂණය සහ ජාල වේ. තොරතුරු පද්ධතියක් තැනීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී, ජාල සහ ආරක්ෂණය යනු මෝටර් රථයක රෝද මෙන් එකිනෙකට සබැඳුණු අංග වේ. ජාලකරණය මගින් තොරතුරු පද්ධති පහසු කරවන අතරම ඊට සමානුපාතිකව එහි ආරක්ෂණ අවදානම ඉහළ නංවයි. ජාල තාක්ෂණය සහ ආරක්ෂණ තාක්ෂණය නිරතුරුවම එකිනෙක සමග තරඟකාරීව ඉදිරියට යන්නේ යුධ සංග්‍රාමයක් මෙනි. "සාර්වත්‍රිකව ජාලගත සමාජය" යනු මේ දිනවල ඔබට නිතර මුහුණනු ඇසෙන වදනකි. එයින් අදහස් වන්නේ ජාලයක් තුළ සියලු වර්ගවල දේ ශීඝ්‍රයෙන් එකිනෙකට සම්බන්ධ වෙමින් පවතින වත්මන් ප්‍රවණතාව ගැන යි. ඊට ප්‍රතිවිරුද්ධව, දැන් ක්‍රියාත්මක වෙමින් පවතින තවත් ප්‍රවණතාවක් වන්නේ දෘඩාංග සහ වේදිකාවල පටන් දත්ත සේවාදායක මත වූ මෘදුකාංග (යෙදුම්) දක්වා වූ සියලු දේ කේන්ද්‍රගත කිරීම වන අතර, එය ක්ලවුඩ් පරිගණකකරණය ලෙස හඳුන්වයි.

ඇත්තෙන්ම මා දැන් විස්තර කළ ආකාරයේ සේවා පරිසරයක් සාක්ෂාත් කර ගත හැක්කේ ශක්තිමත් තොරතුරු ආරක්ෂණයක් ඇත්නම් පමණි. පුද්ගලික තොරතුරු හෙළිදරව් වීම, පරිගණක වෛරස් ආසාදනය වීම, වෙබ් සේවාදායකවලට අනවසරයෙන් ඇතුළුවීම (හැක් වීම), වෙබ් අඩවි බිඳවැටීම සහ ඉ-වාණිජ්‍යය වංචාවන් ආදිය නිසා සිදුවිය හැකි හානියේ පරිමාණය ජාලකරණයේ පුළුල් වීමට සමානුපාතිකව ඉහළ යයි. නමුත් නැවතත් පෙර කාලයේ මෙන් ජාලගත නොවූ, සංවෘත තත්ත්වයක් කරා යාම සාර්ථක විකල්පයක් නොවේ. ඒ වෙනුවට අප වත්මන් තත්ත්වයට සාධාරණ සමතුලිතතාවක් ලබා දෙන විසඳුම් සෙවිය යුතු වේ.

න්‍යාය සහ භාවිතය අතර සමතුලිතතාවක් ඇති කර ගනිමින්, ජාල සහ තොරතුරු ආරක්ෂණය පිළිබඳ නවතම තාක්ෂණය හැදෑරීමේ අභියෝගය භාර ගන්නා මෙන් මම අලුතින් පැමිණෙන අපගේ සිසුන්ට ඇරයුම් කරමි. සමාජ පද්ධති තුළ කාර්යභාරයන් ඉටු කිරීම සඳහා, තොරතුරු තාක්ෂණය සහ එය භාවිතා කිරීමේ දී ඊට අදාළ තොරතුරු ආචාර ධර්ම පිළිබඳ සලකා බැලීමට ද මෙම විෂය මාලාව හරහා ඉඩප්‍රස්ථාවක් ලබා දේ.



## ගෝලීය ව්‍යවසායකත්වය

▶ මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 29 පිටුව බලන්න.

ගෝලීය ව්‍යවසායකයින් තමන්ගේම සහ වෙනත් අයගේ වෙන්චර් ව්‍යාපාර ආරම්භ කිරීම, සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම, සහ වෙනත් කර්මාන්තවල ව්‍යාපාර සංවර්ධනය සඳහා සහාය වීම වෙනුවෙන් ඔවුන්ගේ විශේෂඥ දැනුම යොදා ගනී. මෙම විශේෂඥ ක්ෂේත්‍රයේ පරමාර්ථය වනුයේ, ගෝලීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ව්‍යවසායක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා නිපුනතා ලබා දෙන අතරම, ව්‍යවසායකත්ව මානසිකත්වයක් සහ නායකත්වයක් සිසුන් තුළ වර්ධනය කිරීමයි. ඊ-වාණිජ්‍යත්වය සහ අන්තර්ජාලය මත පදනම් වූ ව්‍යාපාර ඇතුළුව ගෝලීය ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කරන අතරම, සිසුන් විසින් මූල්‍ය, අලෙවිකරණය සහ කළමනාකරණය පිළිබඳ මූලික සංකල්ප අධ්‍යයනය කරයි.

ගෝලීය ව්‍යවසායකත්වය තුළ, සිසුන් තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ සංකල්ප පමණක් නොව, සමාගමකට හෝ ව්‍යාපෘතියකට ක්ෂණික වත්කමක් බවට පත් වීමට නවතම අලෙවිකරණ ක්‍රම ද අධ්‍යයනය කරයි. එවැනි ක්‍රමවලට, වෙබ් අලෙවිකරණය භාවිතා කරන ගැටළුවලට විසඳුම වන growth hacking සහ පාරිභෝගිකයින් සමග සබඳතා ශක්තිමත් කර ගැනීම ඉලක්ක කොටගත් දත්ත ග්‍රහණය කර ගනිමින් ලාභදායිත්වය ඉහළ නංවා ගැනීම හා සම්බන්ධ growth marketing ඇතුළත් වේ. (UX යනාදිය වැඩිදියුණු කිරීම සඳහා කෙටි කාලයක් තුළ Big Data සහ දත්ත විද්‍යාව යොදා ගැනීම).



### ඉලක්කගත වෘත්තීය මාර්ග

- කළමනාකරණ උපදේශක
- ව්‍යවසාය කළමනාකරු
- ව්‍යවසාය විශ්ලේෂකයින් සහ ව්‍යාපාර ආයෝජකයින් සඳහා සහාය සේවක පිරිස්
- ව්‍යවසායන්හි ව්‍යාපාර සංවර්ධන නිෂ්පාදකයින්

### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

මහාචාර්ය **හොං සෙඕන්ග් කෝ Hong Seung Ko**

මා අධීක්ෂණය කරන ව්‍යාපෘතිවල දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වන්නේ අන්තර්ජාල ව්‍යාපාර ("ඉ-අලෙවිකරණය") කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ B2C අලෙවිකරණ උපායමාර්ගය වෙත යි. ඉ-අලෙවිකරණයේ පදනම වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා අතරතුර, මාගේ සිසුන් ඔන්ලයින් විකුණුම් සහ ඉපැයීම් වැඩි කිරීම සඳහා අනාගත ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ චර්යාවන් ඔන්ලයින් විශ්ලේෂණය සිදු කරයි. ඉන්පසු මෙම ප්‍රතිඵල සමූහ විශ්ලේෂණය සහ AHP විශ්ලේෂණය ආදී සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිතයෙන් උපායමාර්ග සංවර්ධනය සඳහා යොදාගනු ලැබේ.

වසරකට වරක්, මම උපදෙස් ලබා දෙන ව්‍යාපෘති පිළිබඳ ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කිරීම් සිදු කිරීමට ශිෂ්‍ය නියෝජිතයින් උතුරු ඇමරිකාවේ, යුරෝපයේ සහ වෙනත් රටවල පවත්වනු ලබන ජාත්‍යන්තර ශාස්ත්‍රීය සමුළුවලට සහභාගී වේ. පාරිභෝගික කේන්ද්‍රීය දැනුම කළමනාකරණය සඳහා ඉතා වැදගත් අලෙවිකරණ උපායමාර්ග අධ්‍යයනය කිරීමට මම ඔබට ඇරයුම් කරමි. විදේශ රටවල පැවැත්වෙන ජාත්‍යන්තර ශාස්ත්‍රීය සමුළුවකට ඉදිරිපත් වීමේ අභියෝගය ඔබ භාර ගන්නේ ද?

## IT මැංගා සහ සජීවිකරණය

▶ මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 29 පිටුව බලන්න.

මෙම පාඨමාලා මගින් ජපාන නිමැවුම් සංස්කෘතිය සහිත, සහ මාංගා සහ ඇනිමෙ ආදී වූ ලොව පුරා අවධානය දිනාගත් අන්තර්ගත කර්මාන්ත කෙරෙහි අවධානය යොමු කරයි. මෙහි දී සිසුන් නිර්මාණාත්මක කර්මාන්තවලට අදාළ පුළුල් පරාසයක සිද්ධීන් පිළිබඳ අත්දැකීම් ලබා ගන්නේ වෙබ්-පාදක ව්‍යාපාරවල ඒවා යෙදිය යුතු ආකාරය ඉගෙන ගැනීමට යි. මෙම ක්‍රියාකාරකම්වලට, දැනට පවතින අන්තර්ගතයන් සහ නිර්මාණාත්මක කර්මාන්ත සම්බන්ධ ව්‍යාපාර ආකෘතිවල පර්යේෂණ මත පදනම්ව නැවුම් ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීම, සහ ඇනිමෙ සැලසුම් කිරීම සහ නිෂ්පාදනය වැනි නිර්මාණාත්මක කර්මාන්තවල පුළුල් පරාසයක තත්වයන් පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම ඇතුළත් වේ. තනි ගැටළු හඳුනා ගැනීම සහ විසඳුම් සැකසීම පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයන්ගෙන් විෂය මාලාව සමන්විත වේ.



### ඉලක්කගත වෘත්තීය මාර්ග

- කාටූන් සහ සජීවිකරණ අන්තර්ගතයන් සැලසුම්කරණ, නිෂ්පාදන සහ ප්‍රවර්ධන කටයුතු පුළුල්ව හැසිරවීම සිදු කරන නිෂ්පාදක
- ඩිජිටල් සහ ඇනලොග් නිෂ්පාදන මෙවලම් දෙකම භාවිතයෙහි දක්ෂ අන්තර්ගත නිර්මාණකරු
- එක් එක් නිෂ්පාදනයේ අරමුණ සඳහා නිවැරදි බලපෑමක් අති කරන වීඩියෝ සංයෝජනය සහ ප්‍රයෝග භාවිතා කළ හැකි අධ්‍යක්ෂක
- කාටූන් සහ සජීවිකරණ වෙළඳපලවල, අධ්‍යාපනය, විනෝදාස්වාදය ආදියෙහි ප්‍රවණතා මුල්කොට ගෙන අන්තර්ගත සැලසුම් කළ හැකි අලෙවිකරණ අධ්‍යක්ෂ

### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

මහාචාර්ය **කෝජි උඒඩා Koji Ueda**

මගේ විශේෂීකරණ ක්ෂේත්‍ර වන්නේ ක්‍රමලේඛනය, බහුමාධ්‍ය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයමාලා සංවර්ධනය, සහ සංවර්ධනය වෙමින් පවතින රටවලට තාක්ෂණය සම්ප්‍රේෂණය කිරීම යි. සංවර්ධනය වෙමින් පවතින සහ සංවර්ධිත රටවල් සඳහා, ඉ-ඉගෙනුම් හරහා ලද හැකි විශිෂ්ට අන්තර්ගතය භාවිතා කරමින්, ලොව පුරා සිටින සෑම කෙනෙකුටම වැඩි කල් නොයා සරලව සහ ඵලදායීව අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වනු ඇතැයි මා විශ්වාස කරමි. එය යථාර්ථයක් වන විට, සෑම තැනකම දක්නට ලැබෙන ප්‍රකාශන ක්‍රමයක් වන සජීවීකරණය මෙහි දී ඵලදායී අයුරින් භාවිතා කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

ඇනිමෙ නිර්මාපකයෙකු වන්නට නම්, කලා නිර්මාණය සඳහා ඩිජිටල් මෙවලම් යොදා ගැනීමේ කුසලතා පමණක් නොව තවත් බොහෝ දේ අවශ්‍ය වේ. අන්තර්ගත සංවර්ධන ක්‍රම, පිරිවැය පාලනය කිරීම සහ කලා කෘති බෙදා හැරීම යන ක්‍රමවලින් සමන්විත වන ව්‍යාපාර ආකෘති පිළිබඳ ඇනිමෙ නිර්මාණකරුවන් දැනුවත්ව සිටිය යුතු ය. එක් එක් රටවල තත්ත්වයන් සහ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයකින් යුතුව, ලොව පුරා පහසුවෙන් හඳුන්වා දිය හැකි අන්තර්ගතයන් නිර්මාණය කිරීමට අන්තර්ගත නිර්මාණකරුවන්ට නම්‍යශීලී බවක් ද තිබිය යුතු ය. මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රය සඳහා මාගේ ඉලක්කය වන්නේ වඩාත් පුළුල් දෘෂ්ටිකෝණයකින් අන්තර්ගත නිර්මාණයට ප්‍රවේශ විය හැකි සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතයෙන් එය ලොව පුරා බෙදා හැරීමට හැකි අන්තර්ගත නිර්මාණකරුවන් බිහි කිරීම යි.

## ERP (ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය)

▶ මෙම සංකේන්ද්‍රිය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 29 පිටුව බලන්න.

ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) යනු තොරතුරු තාක්ෂණය භාවිතා කරමින්, මිනිසුන්, භාණ්ඩ, යන්ත්‍රෝපකරණ, මුදල් සහ තොරතුරු යන සමාගමේ සියලුම සම්පත් පුළුල් ලෙස කළමනාකරණය කිරීම සඳහා වූ ප්‍රවේශයකි. මෙම ප්‍රවේශය ඉෂ්ඨ කර ගත හැකි ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති (ERP පද්ධති) අවබෝධ කර ගැනීම ERP පද්ධති ක්‍රියාත්මක කිරීමේ පළමු පියවර වන අතර, එමගින් සමාගමේ ව්‍යාපාර ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකිය.

මෙම විශේෂඥ ක්ෂේත්‍රය තුළ, ව්‍යාපාර ඒකාබද්ධ කිරීම, මූල්‍ය ගිණුම්කරණ පද්ධති, විකුණුම් සහ බෙදා හැරීමේ පද්ධති ඇතුළුව SAP ERP අධ්‍යාපන පද්ධති (SAP S/4 HANA) යොදා ගනිමින් සිසුන් ප්‍රායෝගික අධ්‍යයනයක නිරත වේ. සමාගම් පරාසයක ගැටළු විශ්ලේෂණය සහ ERP ක්‍රියාත්මක කිරීම පිළිබඳ සිද්ධි අධ්‍යයනයන් ද සිසුන් විසින් සමීක්ෂණය කරනු ලැබේ. මීට අමතරව, ඉන්-මෙමොරි දත්ත සමුදායන් සහ IoT වැනි නවතම ව්‍යවසාය යටිතල පහසුකම් සමඟ ERP සම්බන්ධ කිරීම පිළිබඳ පර්යේෂණ සිසුන් විසින් පවත්වයි.

### ඉලක්කගත වෘත්තීය මාර්ග

- ERP ක්‍රියාත්මක කිරීමේ උපදේශක
- ERP අභිරුචිකරණ ඉංජිනේරු
- ERP ඇඩෝන සංවර්ධන ඉංජිනේරු

### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

මහාචාර්ය **යි ලි Yi Li**



තරඟකාරීත්වය උත්සන්න වෙමින් පවතින වර්තමානයේ බොහෝ සමාගම් තම ව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා ERP ඒකාබද්ධ කිරීමේ පැකේජ ක්‍රියාත්මක කරමින් සිටී. විවිධ වූ ව්‍යාපාර පරාසයක සමාගම් තම ව්‍යාපාර ඒකාබද්ධ කිරීම සඳහා ERP පද්ධති ක්‍රියාත්මක කරන බැවින් එක් එක් ව්‍යාපාර වර්ගවල ලක්ෂණ විශ්ලේෂණය කිරීමට සහ එක් එක් සමාගමේ මෙහෙයුම්වල අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන පද්ධති ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති ERP උපදේශකයින්ගේ අවශ්‍යතාවක් පවතී.

කළමනාකරණය සහ ගිණුම්කරණය පිළිබඳ දැනුම ලබාගෙන ක්‍රමලේඛනය වැනි මූලික තොරතුරු තාක්‍ෂණ කුසලතා ඉගෙනීමෙන් පසුව, මිලදී ගැනීමේ ඉන්වෙන්ටරි, නිෂ්පාදනය, විකුණුම් සහ බෙදා හැරීම, ගිණුම්කරණය සහ මානව සම්පත් කළමනාකරණය ආදී කටයුතු සඳහා ERP පද්ධති අභිරුචිකරණය කරන ආකාරය KCGI හි සිසුන් ඉගෙන ගනී. ප්‍රධාන ව්‍යාපෘතියේ දී, සිසුන් කර්මාන්තයට විශේෂිත වූ ERP ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කරන අතර ව්‍යාපාර ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ අරමුණින් කළමනාකරණ ගැටළු සඳහා විසඳුම් යෝජනා කිරීම ද සිදු කරයි. සිසුන් ERP පද්ධති අභිරුචිකරණය කිරීම පමණක් නොව අවශ්‍ය විට දී ඇඩෝන සහ බාහිර පද්ධති සංවර්ධනය ද සිදු කරයි.

ලෝකය ගෝලීයකරණයෙන් ඉදිරියට යන විට ජාත්‍යන්තර වේදිකාවේ කාර්යභාරයක් ඉටු කළ හැකි ERP උපදේශකයින් සඳහා ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී. KCGI ජපන් සහ ඉංග්‍රීසි යන භාෂා දෙකෙන්ම යුගයේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්විය හැකි ගෝලීය ERP උපදේශකයින් සංවර්ධනය සිදු කරයි. ඉංග්‍රීසි/ජපන් ERP පද්ධති අභිරුචිකරණයට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (IFRS) අනුකූල වන ERP පද්ධතිවල අවශ්‍යතාවට අනුගත පර්යේෂණ අපි ඉදිරියට ගෙන යන්නෙමු. විවිධ රටවල ගිණුම්කරණ පද්ධති සහ ව්‍යාපාරික භාවිතයන් සමීක්‍ෂණය කිරීම, රටට විශේෂිත වූ ERP පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද අපි පර්යේෂණ සිදු කරමු. අපගේ බොහෝ සිසුන් ගෝලීය උපදේශන සමාගම්වල ERP උපදේශකයින් බවට පත් වීමේ තම සිහිනය සැබෑ කර ගැනීමට වෙහෙස වී වැඩ කරති.

## විශේෂ වාර්තාව

# KCGI සිසුන් 270කට අධික පිරිසක් SAP සහතිකකරණ විභාගය සමත් වී ඇත!

KCGI සිසුන් 270කට අධික සමුච්චිත සිසු එකතුවක් SAP හි SAP සහතිකලත් උපදේශක විභාගය සමත් වී ඇත. 2005 දී විභාගය සමත් වූ පළමු KCGI සිසුවාගේ පටන් මෙම සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. 2017 ජූනි මාසයේ දී එම අගය 100 ඉක්මවූ අතර; 2019 ජූනි මාසයේ දී 150ක් ද; 2020 දී 200ක් ද; 2022 අධ්‍යයන වර්ෂය අවසන් වන විට සිසුන් 270කට වැඩි පිරිසක් ද මෙම විභාගය සමත් වී ඇත. 2020 නොවැම්බරයේ සාර්ථකව සමත් වූ අපේක්ෂකයින් 200 සන්ධිස්ථානය සැමරීම සඳහා, ERP සංකේන්ද්‍රිය ක්ෂේත්‍රයේ සිසුන් සහ ERP උපදේශකයින් විශේෂ උත්සවයක් පැවැත්වීමට කියෝතෝ ප්‍රධාන පාසලේ හයකුමන්බෙන් සරසවිය පන්ති කාමරයකට රැස් වූහ.



ERP සංකේන්ද්‍රිය ක්ෂේත්‍රයේ සිසුන් සහ ERP උපදේශකයින්ගේ සමරු ඡායාරූපයක්

උත්සවයේ දී, සිසුන් පුහුණු කළ මහාචාර්ය මසාකි ෆුජිවාරා විසින් උපාධිධාරීන්ට සමරු තිළිණ ප්‍රදානය කරන ලදී. මහාචාර්ය මසහිරෝ ෆුරුසාවා සිසුන්ව දිරිගන්වමින් තම සුබ පැතුම් පිරිනමන ලද්දේ මෙසේ ය: "සිසු සිසුවියනි, ඔබේ ජයග්‍රහණ ඔබේ කඩිසර බවේ සහ ඉගැන්වුම් පීඨයේ දැඩි උත්සාහයේ ප්‍රතිඵල බව මා සිතනවා. නිල SAP වෙබ් අඩවියේ පළ කර ඇති වචන හොඳින් සිත තබා ගන්න: සහතිකලත් උපදේශකයින් නිරතුරුවම 'තම කුසලතා යාවත්කාලීන කරගත යුතු අතරම තම විශේෂීකෘත දැනුම ඉහළම මට්ටමේ පවත්වා ගත යුතුයි.' අත්දැකීම් එකතු කරගෙන සමාජයේ යහපත් පරිවර්තනයක් ඇති කිරීමට ඔබත් දායක වන්න."

අවසන් වශයෙන්, මහාචාර්ය ෆුජිවාරා සමත් වූ සිසුන්ව ප්‍රබෝධමත් කළේ මේ අයුරිනි: "SAP සහතිකකරණ විභාගය යනු ගෝලීය ප්‍රමිතිය යි. ඔබ මෙම සහතිකකරණය පිළිගත් අවස්ථාවේ, ඔබ ERP උපදේශකයෙකු ලෙස ලෝකය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි වේදිකාවක් ඔබ වෙනුවෙන්ම නිර්මාණය කරගනු ලැබුවා. ඔබ උපාධිය ලැබීමෙන් පසු ඔබේ පියාපත් විහිදුවා විශිෂ්ට දේවල් කිරීමට මෙම සුබ මොහොත ඔබට ආශිර්වාදයක් වේවායි මා පතනවා."

## සංචාරක තොරතුරු තාක්ෂණය

▶ මෙම සංකේන්ද්‍රිය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා පියසටහන පිළිබඳ තොරතුරු සඳහා 29 පිටුව බලන්න.

"ජීවත් වීමට කදිම සහ සංචාරයට කදිම" නැරඹුම් ප්‍රදේශ ප්‍රසිද්ධියක් ලබමින් පවතින අතර තිරසාර සංචාරක ව්‍යාපාරයට ඉල්ලුමක් පවතී. මෙම සංකේන්ද්‍රිය ක්ෂේත්‍රය තුළ, සිසුන් නව සංචාරක සේවා සහ නව සංචාරක ව්‍යාපාර ආකෘති නිර්මාණය කිරීම පිළිබඳ ඉගෙන ගනී. නිදසුන් ලෙස විවිධ භාෂාවලින් සහ බහු මාධ්‍ය හරහා සංචාරක තොරතුරු සැපයීම; සංචාරක ක්‍රියාකාරකම් ඉතිහාසය ඩිජිටල්කරණය කිරීම, විශ්ලේෂණය සහ පුරෝකථනය කිරීම දැක්විය හැක. සංචාරක ව්‍යාපාරය අභිමුවෙහි නව ගැටළු රාශියක් ඇති බැවින් මෙම සංකේන්ද්‍රිය ක්ෂේත්‍රය මගින් නව පරම්පරාවේ ගැටළු විසඳන්නන් පුහුණු කිරීම සිදු කරයි. මොවුන් සංචාරක ව්‍යාපාරය සඳහා ඩිජිටල් පරිවර්තනය (tourism DX), ඩිජිටල් සංචාරක ව්‍යාපාරය සහ ඒ හා සමාන මෙවලම් භාවිතයෙන් ඩිජිටල් සම්පත් නිර්මාණය කිරීම සහ යෙදවීම හරහා සංචාරක ක්ෂේත්‍ර නැවත පණ ගැන්වීමට සැලසුම් යෝජනා කළ හැකි පුද්ගලයන් වේ.

### ඉලක්කගත වෘත්තීය මාර්ග

- සංචාරක පද්ධති සැලසුම් කිරීම, පද්ධති සංවර්ධනය සහ Big Data භාවිතයෙහි නියුතු ඉංජිනේරු
- IT භාවිතයෙන් සංචාරක සේවා කළමනාකරණය වඩාත් කාර්යක්ෂම කිරීමේ කුසලතා ඇති කළමනාකරු
- ඊළඟ පරම්පරාවේ සංචාරක කර්මාන්තය සඳහා ප්‍රයෝජනවත් තොරතුරු ඉක්මනින්, නිර්මාණශීලීව සහ ක්‍රියාකාරීව සොයා ගත හැකි Tourism DX සේවක පිරිස්
- සංචාරක කර්මාන්තයට නායකත්වය දිය හැකි ඉහළ පෙළේ කළමනාකරණ සේවක පිරිස්



### ව්‍යාපෘති අනුග්‍රාහකයින්ගේ පණිවුඩ

මහාචාර්ය **මෙයිහුයි ලි Meihui Li**

මගේ විශේෂීකරණය ගෝලීය සේවක පිරිස් සංවර්ධනය යි. මෑත වසරවල දී, ආර්ථිකයන්ගේ ගෝලීයකරණය ප්‍රගමනය වී ඇති අතර ජපානයට ඇතුළු වන විදේශීය අනුබද්ධ සමාගම් සංඛ්‍යාව වැඩි වී තිබේ. ඒ අතරම විදේශීය වෙළඳපොලවල් වෙන කවරදාටත් වඩා ගතිකව වර්ධනය වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදන සහ විකුණුම් කඳවුරු විදේශ රටවලට ගෙන යාමට අපේක්‍ෂා කරන ජපන් ව්‍යවසායන් සංඛ්‍යාවේ තියුණු වැඩිවීමක් දක්නට ලැබේ. එවැනි පුද්ගලයින් පුහුණු කිරීමට, රඳවා ගැනීමට සහ සුරක්ෂිත කිරීමට දැන් අධික වෙහෙසක් දරන එම සමාගම්වල ගෝලීය සේවක පිරිස් සඳහා ඇති ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. ජපානය ප්‍රධාන සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමේ ප්‍රතිපත්තිය සමඟ ජාතික රජය ඉදිරියට යද්දී, සංචාරක කර්මාන්තය ජපාන ආර්ථිකයට රුකුල් දෙන ප්‍රධාන කර්මාන්තයක් බවට වේගයෙන් පත් වෙමින් තිබේ. අභ්‍යන්තර සංචාරක ව්‍යාපාරයේ සේවය කළ හැකි පුද්ගලයින් සඳහා ඇති වත්මන් ඉල්ලුමෙහි ශීඝ්‍ර ඉහළ යාම මෙම ප්‍රවණතාවට නිසැකවම සම්බන්ධතාවක් දක්වයි.

මෙම යහපත් තත්ත්වය මධ්‍යයේ මතුවන එක් ගැටළුවක් වන්නේ අධි සංචාරක ව්‍යාපාරය යි. පොදු ප්‍රවාහනයේ අධික තදබදය සහ ජපන් ජාතිකයින් විසින් ආචාරශීලී නොවන බවට සලකනු ලබන හැසිරීම් වැනි ගැටළු ප්‍රදේශවාසීන්ට සුරක්ෂිතතාව හෝ ආරක්ෂාව අහිමි වීමක් ලෙස දැනීමට හේතු වේ. KCGI පිහිටා ඇත්තේ සංචාරක ආකර්ෂණයන්ගෙන් පොහොසත් නගරයක් වන කියෝතෝ නුවර යි. කියෝතෝ නුවර පුරා පිහිටා ඇති සාම්ප්‍රදායික පන්සල් සහ සිද්ධස්ථාන සැලකිය යුත්තේ පූජනීය ස්ථාන ලෙස ද නැතහොත් සංචාරක සම්පත් ලෙස ද? කලාපීය සංස්කෘතික උරුමයක් සංරක්ෂණය කිරීම සහ සංචාරක ඉල්ලුම අතර පවතින සට්ටනය පිළිබඳ සැබෑ ජීවිතයේ අවස්ථා අපට නිතිපතා නිරීක්ෂණය වේ.

මෙම විශේෂීකරණ ක්ෂේත්‍රය තුළ, කලාව සමග විද්‍යාව ගෝලීය වශයෙන් ඒකාබද්ධ කිරීමේ දෘෂ්ටි කෝණයෙන් මෙම ගැටළු නිරාකරණයට අවශ්‍ය පියවර ගැන කතිකාවතක් ඇති කිරීමට සහ සිතා බැලීමට අපි ක්ෂේත්‍ර වැඩ යොදා ගන්නෙමු. ලෝකයේ විශිෂ්ට නැරඹුම් නගරවලින් එකක් වන කියෝතෝ නුවර සංචාරක තොරතුරු තාක්‍ෂණයේ ඉදිරි පෙළේ වැඩ කිරීම සඳහා දැනුම, කුසලතා සහ පුළුල් ඉදිරිදර්ශනයක් සහිත සංචාරක තොරතුරු තාක්‍ෂණ විශේෂඥයින් සංවර්ධනය කිරීම අපගේ අරමුණ යි.

## මිලාන් නුවර කීර්තිමත්ම සංචාරක අධ්‍යාපන පාසල්වලින් එකක්

ඓතිහාසික මිලාන් නගරයේ පිහිටා ඇති භාෂා සහ මාධ්‍ය පිළිබඳ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය (IULM), ඉතාලියේ කීර්තිමත්ම සංචාරක අධ්‍යාපන පාසල්වලින් එකක් වන අතරම එය KCGI හි හවුල්කරුවෙකි. 1968 දී ආරම්භ කරන ලද IULM සංචාරක; ලලිත කලා; සහ භාෂාව සහ සන්නිවේදනය ලෙස පීඨ තුනකින් සමන්විත වන අතර, උපාධි අපේක්ෂක සහ උපාධිලාභී සිසුන් 7,400 ක පමණ පිරිසකගෙන් එය සමන්විත වේ.

**IULM** International University of Languages and Media
https://www.iulm.it/en/home









## ද්විත්ව උපාධි වැඩසටහන

(දෙ අවුරුදු) **KCGI + IULM** (එක් අවුරුදු)

මෙම වැඩසටහන KCGI හි සාමාන්‍ය දෙ අවුරුදු ශාස්ත්‍රපති වැඩසටහන වසර 3 දක්වා දීර්ඝ කරනුයේ, අවසන් අධ්‍යයන වර්ෂය KGCI හි හවුල්කාර පාසල වන IULM තුළ හුවමාරු වසරක් ලෙස සම්පූර්ණ කරමිනි. මෙම වැඩසටහන අවසන් වූ පසු සිසුන්ට IULM සහ KCGI යන ආයතන දෙකෙන්ම ශාස්ත්‍රපති උපාධි ලබා ගත හැකි ය. KCGI වෙතින් ජපන් භාෂාවෙන් හෝ ඉංග්‍රීසියෙන් ද, IULM වෙතින් ඉංග්‍රීසියෙන් ද උපාධිය ලබා ගත හැකි ය.

**ලොව ඉහළම ගණයේ පාසල්වලින් සංචාරක ව්‍යාපාරය පිළිබඳ ඉංග්‍රීසි බසින් ඉගෙන ගන්න!**

**වසර තුනක අධ්‍යයන කාලයක් පුරාවට ඉතාලියේ සහ තවත් බොහෝ රටවල සිසුන් සමග මුහු වන්න!**

**ජපානය, ඉතාලිය සහ තවත් බොහෝ රටවල වෘත්තීය මාර්ග විවෘත කර දෙන උපාධි හිමි කර ගන්න!**

**ඔබට ජපානය, ඉතාලිය සහ වෙනත් රටවල සීමාවාසික පුහුණුවට පවා සම්බන්ධ විය හැක!**

# කර්මාන්තයට ප්‍රතිචාර දැක්වීම

මෙම පාඨමාලා ICT ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳ විශේෂීකෘත දැනුමක් අවශ්‍ය කරන විශේෂිත කර්මාන්ත සඳහා වූ සංකේන්ද්‍රීය ක්ෂේත්‍රවල අධ්‍යයනවලින් සමන්විත වේ. මෙහි දී KCGI පහත ලැයිස්තුගත කර ඇති, විශාල පරාසයක ගැටළු රාශියකට විසඳුම් සෙවීමේ දී තොරතුරු තාක්ෂණය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කළ හැකි කර්මාන්ත සහ ව්‍යාපාර වර්ග හයක් කෙරෙහි අවධානය යොමු කර ඇත. එක් එක් කර්මාන්තය තුළ ක්‍රියාකාරී සහ ගතික කාර්යභාරයක් ඉටු කළ හැකි පුද්ගලයන් සංවර්ධනය කිරීමේ අරමුණින් පාඨමාලා තෝරාගෙන කාණ්ඩගත කර ඇත.

## මූල්‍ය

ෆින්ටෙක් (Fintech) යනු ඉලෙක්ට්‍රොනික ගනුදෙනු සහ අතථ්‍ය මුදල් වැනි නව මූල්‍ය තොරතුරු තාක්ෂණ සේවා පුළුල් පරාසයක් හැඳින්වීමට යොදා ගන්නා පදයකි. අද ෆින්ටෙක් යනු ව්‍යාපාරික සන්දර්භය තුළ වඩාත් සමීපව නිරීක්ෂණය කරනු ලබන අංශයකි.

මෙහි දී සිසුන් මූල්‍ය තොරතුරු තාක්ෂණ සේවා සඳහා පසුබිම සකස් කරන ගිණුම්කරණ සහ මූල්‍ය විධිවිධාන පිළිබඳව ඉගෙන ගන්නා අතරම ෆින්ටෙක් පද්ධති සැලසුම් පසුබිම ද අධ්‍යයනය කරයි. මෙම දැනුම ප්‍රවේශ ලක්ෂ්‍යයක් ලෙස භාවිතා කරමින්, ෆින්ටෙක් අංශය තුළ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීම සඳහා වෙබ් සහ ස්මාර්ට් ජංගම දුරකථන යෙදුම් සංවර්ධනය, සහ දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය වැනි තොරතුරු තාක්ෂණ කුසලතා පරාසයක් ඒකාබද්ධ කිරීමට සිසුන් ඉගෙන ගනී.



### ඉලක්කගත වෘත්තීය මාර්ග

- මූල්‍ය සහ ගිණුම්කරණ සාක්ෂරතාවයෙන් සහ වෙබ් ව්‍යාපාර පිළිබඳ මූලික දැනුමෙන් පිටුබලය ලබන පද්ධති ඉංජිනේරු හෝ සැලසුම්කරු
- ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික සහ මූල්‍ය තොරතුරු රැස්කර විශ්ලේෂණය කරන දත්ත විශ්ලේෂක
- අතථ්‍ය මුදල් සහ මූල්‍ය API වැනි නව තාක්ෂණයන් ආදේශ කරන යෙදුම් ඉංජිනේරු

## කෘෂිකර්මය

එළවළු කර්මාන්තශාලා සහ කෘෂිකාර්මික ආධාරක ක්ලවුඩ් සේවාවලින් තහවුරු කරන පරිදි, මෑත වසරවල දී ඉහළ ගොස් ඇති ගොවිපල අනුප්‍රාප්තිකයින්ගේ හිඟය සහ ආනයනික එළවළුවලට එරෙහිව ඇති තරඟකාරිත්වය පහත වැටීම ආදී ජපන් කෘෂිකර්මාන්තය තුළ ඇති ගැටළු නිරාකරණය කිරීමට තොරතුරු තාක්ෂණය යොදාගත හැක.

අපි නිෂ්පාදන වගා කරන, බෙදා හරින සහ පරිභෝජනය කරන රාමු පිළිබඳ පසුබිම් තොරතුරු; සහ මෙම රාමුවල නවෝත්පාදන දිශානතීන් ආදී තොරතුරු තාක්ෂණය සමග කෘෂිකර්මාන්තයේ මුහුවීම පිළිබඳ දැනට පවතින සිද්ධි අධ්‍යයනයන් පුළුල් පරාසයක් හඳුන්වා දෙන්නෙමු. කෘෂිකාර්මික තොරතුරු තාක්ෂණය තුළ, පාරිසරික සංවේදක සහ IoT ඇතුළුව ස්වාධීනව ක්‍රියා කරන පද්ධති සැලසුම් කරන ආකාරය සිසුන් ඉගෙන ගනී. මෙම දැනුම ව්‍යාපාර දත්ත විශ්ලේෂ සහ වෙබ් පද්ධති සංවර්ධනය වැනි සංකේන්ද්‍රීය විෂයන් සමග ඒකාබද්ධ කිරීමෙන් සිසුන්ට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී භූමිකාවන් ඉටුකරන ඉංජිනේරු සහ උපදේශක වෘත්තීන් සඳහා ඉලක්ක කළ හැකි ය.



### ඉලක්කගත වෘත්තීය මාර්ග

- නිෂ්පාදකයාගේ වයිඩ සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල ගුණාත්මය පිළිබඳ දත්ත රැස්කර විශ්ලේෂණය කරන දත්ත විශ්ලේෂක
- නිෂ්පාදකයින්ගේ විශේෂඥ දැනුම ග්‍රන්ථාකාරයෙන් සංරක්ෂණය කර අනුප්‍රාප්තිකයින් පුහුණු කරන ඉ-ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධක
- නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් අතර සෘජු සම්බන්ධතා සඳහා සහාය වන පද්ධති ඉංජිනේරු හෝ උපදේශක (CRM)

## සාමුද්‍රික

සමුද්‍ර හා ජලජීවී වගා කර්මාන්තයේ දියුණුව රඳා පවතින්නේ යාත්‍රා කිරීමේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමට සහ මසුන් ඇල්ලීම කාර්යක්ෂම හා තිරසාර කිරීමට තොරතුරු තාක්ෂණ භාවිතා කිරීම මත යි. අද මෙම කර්මාන්තය තුළ, චන්ද්‍රිකා නිරීක්ෂණය සහ පාරිසරික දත්ත රැස්කිරීම සඳහා පද්ධති භාවිතා කරමින් නිරික්සුම් විශේෂාංග හරහා සමුද්‍රීය සම්පත් වැනි තොරතුරු තාක්ෂණය පදනම් කොටගත් නව විසඳුම් සොයමින් සිටී. මේ අතර, බලශක්ති පරිභෝජනය අඩු කිරීම සහ නාවික ගමනාගමනයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම, හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම, සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ මුහුදෙන් ස්වාභාවික බලශක්තිය භාවිතා කිරීම ආදිය සඳහා වූ පීඩනයට සමුද්‍රීය කර්මාන්තය මුහුණ පා ඇත. KCGI මෙම කාර්මික ක්ෂේත්‍රය මගින් සමුද්‍රීය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අනාගත නායකයින් පුහුණු කිරීම සිදු කරයි.



### ඉලක්කගත වෘත්තීය මාර්ග

- යාත්‍රා කිරීමේ ආරක්ෂාවට සහය වීම පිණිස විවිධ තොරතුරු තාක්ෂණ පද්ධති තැනීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකි පද්ධති ඉංජිනේරු
- ඊළඟ පරම්පරාව පුහුණු කිරීම සඳහා ධීවරයින් සහ ජලජීවී වගා කම්කරුවන්ගේ විශේෂඥ දැනුම ලබා ගෙන ඉ-ඉගෙනුම් ද්‍රව්‍ය සැලසුම් කිරීම හා සංවර්ධනය සිදු කරන උපදේශක
- නිෂ්පාදනයේ සිට බෙදා හැරීම සහ විකුණුම් දක්වා ජලජීවී වගාවේ කායී සම්පාදන විශ්ලේෂණය සහ කළමනාකරණය සිදු කළ හැකි කළමනාකරු

## සෞඛ්‍ය සහ වෛද්‍ය

වෛද්‍ය ක්ෂේත්‍රය තුළ තොරතුරු තාක්ෂණය යොදා ගැනීම ශීඝ්‍රයෙන් ඉදිරියට යමින් තිබෙන්නේ වෛද්‍ය ලිපිකාර පද්ධති, ඇණවුම් පද්ධති, ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා පද්ධති, ප්‍රතිරූපන රෝග විනිශ්චය සහ තවත් බොහෝ දේ එයට ඇදා ගනිමිනි. මෙහි දී බෝවන රෝග වැලැක්වීම සහ ප්‍රතිකාර සැලසුම් ප්‍රශස්ත කිරීම සඳහා එක් රෝගියෙකුට ප්‍රතිකාර කිරීමට ඊට පෙර භාවිතා කරන ලද ප්‍රතිකාරවල දත්ත, වෛද්‍ය උපකරණ දත්ත යනාදිය Big Data ලෙස එක්රැස් කර විශ්ලේෂණය කරනු ලබයි. අන්තර්ජාලයේ ඇති වෛද්‍ය ප්‍රතිකාර හා සම්බන්ධ වචන සහ වාක්‍ය ඛණ්ඩ විශ්ලේෂණය, බෝවන රෝග පුරෝකථනය කිරීම සහ වැළැක්වීම සඳහා කාර්යභාරයක් ඉටු කරයි. මෙවන් බොහෝ ආකාරවලින් වෛද්‍ය විද්‍යාව තුළ තොරතුරු තාක්ෂණ භාවිතය පුළුල් වෙමින් පවතින අතර, ඒ ගැටළු රාශියක විසඳුම් සෙවීමට උසස් ගණයේ තොරතුරු තාක්ෂණ ක්‍රමවේද යොදාගත හැකි වෘත්තිකයන් සඳහා වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් නිර්මාණය කරමිනි.



### ඉලක්කගත වෘත්තීය මාර්ග

- ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා සහ දුරස්ථ වෛද්‍යකරණ පද්ධති ඇතුළුව වෛද්‍ය ක්ෂේත්‍රයේ පුළුල් පරාසයක යොදා ගන්නා තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීමට, වින්‍යාස කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති පද්ධති ඉංජිනේරු
- වෛද්‍යවරුන්ගේ රෝග විනිශ්චය කටයුතුවලට සහාය වීම සඳහා වෛද්‍ය දත්ත සහ වෛද්‍ය උපකරණ දත්ත රැස් කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ දෘශ්‍යායනය කිරීමට ප්‍රවීණත්වය සහිත දත්ත සහායක
- රෝහල් සහ ප්‍රාදේශීය වෛද්‍ය සත්කාර සඳහා තොරතුරු ජාල කළමනාකරණය කළ හැකි ඉංජිනේරු

## අන්තර්ගත අලෙවිකරණය

මෙම කාර්මික ක්ෂේත්‍රය ඕනෑම අන්තර්ගත ව්‍යාපාරයක හරය බඳු සංකල්පයක් වන බුද්ධිමය දේපල පිළිබඳ ශිෂ්‍යයාගේ අවබෝධය සහ අගය කිරීම ගැඹුරු කරයි. මෙම පාඨමාලාවල දී මාංගා සහ ඇනිමෙ සඳහා වූ ප්‍රකාශන හිමිකම්; සංගීතය, පින්තූර සහ වීඩියෝ සත්කාරක වෙබ් අඩවි හැසිරවීම; සහ මෙම අන්තර්ගත නිර්මාණය කරන කලාකරුවන්ගේ විවිධාකාර ආකෘතිවල කලා කෘත්‍යයන් සම්බන්ධයෙන් ඉගැන්වීම් සිදු කරයි. මෙහි දී සිසුන් අන්තර්ගත ව්‍යාපාරය ගැන ඉගෙන ගැනීම සහ ජනප්‍රිය චරිත භාවිතා කරන ව්‍යාපාර ආකෘති පර්යේෂණ කිරීම ද සිදු කරයි.

සිසුන් චිත්‍රකතා පොත්, සජීවිකරණ සහ අනෙකුත් අන්තර්ගතයන් සම්බන්ධයෙන් සැලසුම්කරණයේ සහ නිෂ්පාදනයේ සිට ප්‍රවර්ධනය දක්වා ක්‍රියාවලීන් කළමනාකරණය කිරීමට අවශ්‍ය දැනුම සහ ශිල්පීය ක්‍රම ලබා ගන්නා අතරම, තාක්ෂණ අංශයේ සහ ජාත්‍යන්තර වෙළඳපොලේ නවතම ප්‍රවණතා සමීක්ෂණය හා විශ්ලේෂණය ද සිදු කරයි. මෙම පර්යේෂණ පදනම් කොටගෙන, සිසුන් ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ යෝජනා සහ ව්‍යාපාර ආකෘති ඉදිරිපත් කරයි.



### ඉලක්කගත වෘත්තීය මාර්ග

- චිත්‍රකතා පොත් සහ සජීවිකරණ කාටූන් වෙළඳපලවල ප්‍රවණතා ඇතුළත් අධ්‍යාපනික, සංගීතමය සහ අනෙකුත් අන්තර්ගතයන් සැලසුම් කරන අලෙවි අධ්‍යක්ෂ
- ප්‍රකාශන හිමිකම් සහ අනෙකුත් බුද්ධිමය දේපළ හිමිකම් ඇතුළුව බුද්ධිමය දේපළ වටා ගෙතුණු නීතිමය රාමුව සැලකිල්ලට ගනිමින් අලෙවිකරණ උපායමාර්ග සංවර්ධනය කරන සැලසුම්කරු

## අධ්‍යාපනය

විවිධ ඉ-ඉගෙනුම් පද්ධති සහ ටැබ්ලට් ඇතුළු පුළුල් පරාසයක තොරතුරු තාක්ෂණ පර්යන්තයන් අද අධ්‍යාපනික අවකාශයට පිවිසී ඇත. උපදේශකයෙකුගෙන් ලැබෙන අධ්‍යාපනික ද්‍රව්‍ය වෙනත් මාධ්‍ය සහ ප්‍රකාශන ක්‍රම සමග ඒකාබද්ධ කිරීම, නව අන්තර්ගතයන් නිර්මාණය කිරීම සහ බෙදාගැනීම දැන් මූලික අධ්‍යාපන ක්‍රියාවලියකි. අධ්‍යාපනඥයින්ට පෙළ සහ පින්තූර පමණක් නොව ශ්‍රව්‍ය, දෘශ්‍ය සහ තොරතුරු ග්‍රාෆික ඇතුළත් බලගතු සහ ප්‍රවේශ්‍ය අධ්‍යාපනික සම්පත් ද නිර්මාණය කළ හැකි ය. යමෙකු සිදු කළ අධ්‍යයනවලින් ලබාගත් ප්‍රස්තාරගත දත්ත සංවිධානය කර ඉදිරිපත් කිරීම වැනි ක්‍රියාකාරකම් දැන් සාමාන්‍ය අවශ්‍යතාවකි.

අධ්‍යාපනයේ පමණක් නොව වර්තමානයේ කෘෂිකාර්මික සහ සමුද්‍රීය මෙහෙයුම් වැනි පුළුල් පරාසයක කාර්මික ක්ෂේත්‍රවල ද ප්‍රවීණ වෘත්තිකයන් තම විශේෂඥ දැනුම රැකගෙන අනාගත පරපුරට දායාද කිරීමට මාර්ග සොයා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය සිදු කළ යුත්තේ මෙම දැනුම වීඩියෝ හෝ ක්‍රියාකාරකම් දත්ත ලෙස පටිගත කිරීම සහ සංවිධානය කිරීමෙන්, සහ මෙම සම්පත්වලින් දැනුම උකහාගෙන පුළුල් ප්‍රේක්ෂක පිරිසකට ප්‍රවේශ විය හැකි අධ්‍යාපනික ද්‍රව්‍ය නිර්මාණය කිරීම යි.



සුදුසු උපදේශන සැලැස්මක් මත පදනම්ව පුළුල් පරාසයක මාධ්‍ය සහ ප්‍රකාශන ක්‍රම ඒකාබද්ධ කරන ආකාරය සිසුන් ඉගෙන ගන්නා අතර එමගින් ඉ-ඉගෙනුම් සඳහා ඵලදායී පරිසරයක් නිර්මාණය කරයි. මෙම ක්‍රියාවලිය හරහා, සිසුන් සහ උපදේශකයින් අතර සංවාදවලට අනුබල දීම සඳහා ඵලදායී ආකාරයෙන් අධ්‍යාපන මාධ්‍ය භාවිතය සහ ප්‍රායෝගිකව යෙදීම පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයක සිසුන් නිරත වේ.

### ඉලක්කගත වෘත්තීය මාර්ග

- පුළුල් පරාසයක මාධ්‍ය සහ ප්‍රකාශන ක්‍රම භාවිතා කරමින් ඉ-ඉගෙනුම් පද්ධති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමෙහි නියැලී සිටින අධ්‍යාපන වෘත්තිකයා
- ඉ-ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධනය කිරීම හරහා පුළුල් පරාසයක කාර්මික ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම භාවිතා කරන සහ එය අනාගත පරම්පරාවට ලබා දෙන අන්තර්ගත නිර්මාණකරු
- විවිධ මාධ්‍යයන් ඒකාබද්ධ කරන අධ්‍යාපනික සන්නිවේදන පද්ධති විශ්ලේෂණය සහ සැලසුම් කිරීම සම්බන්ධ ඉංජිනේරුවා

# වෙබ් ව්‍යාපාර තාක්‍ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ප්‍රධාන ක්‍රෙඩිට් පාඨමාලා

| වර්ග | වර්ගීකරණය | පාඨමාලා | ක්‍රෙඩිට් ගණන | පුහුණුව | පාඨමාලා | ක්‍රෙඩිට් ගණන | පුහුණුව | වැදගත් |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේන්ද්‍රීය පාඨමාලා | කෘත්‍රිම බුද්ධිය (AI) | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | ස්වභාවික භාෂා සැකසුම්කරණය | 2 | | මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රවලින් එකක් තෝරන්න. ඔබට කර්මාන්ත පාඨමාලා අතරින් ද පාඨමාලා තෝරාගත හැක. |
| | | AI පිළිබඳ හැඳින්වීම * | 2 | | වෛද්‍ය තොරතුරු විද්‍යාව | 2 | | |
| | | ඇල්ගොරිතම හඳුන්වාදීම * | 2 | | රොබෝ තාක්ෂණය සහ AI | 2 | | |
| | | පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) * | 3 | ○ | නව ව්‍යාපාර සහ AI | 2 | | |
| | | දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | 2 | | AI සඳහා ගණිතය * | 2 | | |
| | | පරිගණක සැකසුම් න්‍යාය | 2 | | IoT සහ AI | 3 | ○ | |
| | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | කථන පරිග්‍රහණය | 2 | | |
| | | යන්ත්‍ර ඉගෙනුම් සහ එහි යෙදවුම් * | 2 | | මූල්‍ය තාක්ෂණ මූලිකාංග | 2 | | |
| | | සංයෝජන ප්‍රශස්තකරණය * | 2 | | තාර්කික චින්තනය * | 2 | | |
| | | AI 1, 2 සඳහා මෘදුකාංග යෙදුම් * (1 පමණි) | 2 බැගින් | | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සැදීම | 4 | ○ | |
| | | දත්ත කැණීම * | 2 | | දත්ත විශ්ලේෂණය 1, 2 * (1 පමණි) | 2 බැගින් | | |
| | | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා | 4 | ○ | පරිගණක ක්‍රීඩා සහ AI | 2 | | |
| | දත්ත විද්‍යාව | දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | 2 | | අන්තර්ජාල වෙළඳාමේ උපායමාර්ග සහ අලෙවිකරණය | 2 | | |
| | | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | තොරතුරු ආචාර ධර්ම පිළිබඳ ගැඹුරු මාතෘකා | 2 | | |
| | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | ඉ-වාණිජ ක්‍රමවේද | 2 | | |
| | | පරිගණක සැකසුම් න්‍යාය | 2 | | ප්‍රායෝගික ක්ලවුඩ් පරිගණනය | 2 | | |
| | | වෙබ් වැඩසටහන්කරණය 1, 2 * (2 පමණි) | 2 බැගින් | ○ | ආයතනික හැසිරීම * | 2 | | |
| | | පරිගණක ක්‍රමලේඛනයේ මූලධර්ම | 3 | ○ | දත්ත ගබඩා සහ Big Data | 2 | | |
| | | වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම | 2 | | ව්‍යවහාරික තොරතුරු තාක්ෂණවේදය වැදගත් සාධක A අභ්‍යන්තරස්ථ-මතක දත්ත සමුදාය | 1 | | |
| | | ගුණාත්මක දත්ත: විශ්ලේෂණය සහ පරිණාමනය * | 2 | ○ | මූල්‍ය තාක්ෂණ මූලිකාංග | 2 | | |
| | | ගවේෂණාත්මක දත්ත විශ්ලේෂණය සහ දෘෂ්ටිකල්පනය | 4 | ○ | ව්‍යාපාර පරිපාලනය උසස් මාතෘකා * | 2 | | |
| | | දත්ත මිනිතය න්‍යායන් | 2 | | දත්ත විශ්ලේෂණය 1, 2 * (1 පමණි) | 2 බැගින් | | |
| | | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා * | 4 | ○ | | | | |
| | වෙබ් පද්ධති සංවර්ධනය | දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | 2 | | ජාලගතකරණ මූලිකාංග | 2 | | |
| | | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | වෙබ් තාක්ෂණය හඳුන්වාදීම | 2 | | |
| | | පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) * | 3 | ○ | වෙබ් සේවා ප්‍රවර්ධනය | 4 | ○ | |
| | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | වෙබ් වැඩසටහන්කරණය 3 * | 4 | ○ | |
| | | වෙබ් වැඩසටහන්කරණය 1, 2 * (2 පමණි) | 2 බැගින් | ○ | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සැදීම * | 4 | ○ | |
| | | AI 1 සඳහා මෘදුකාංග යෙදුම් | 2 | | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පද්ධති සැලසුම් නිර්මාණය * | 4 | ○ | |
| | | වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම * | 2 | | මෘදුකාංග ඉංජිනේරුවේදය | 2 | | |
| | | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා * | 4 | ○ | සැලසුම් නිර්මාණ චින්තනය | 4 | | |
| | | පරිගණක සැකසුම් න්‍යාය | 2 | | ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය | 2 | ○ | |
| | ජාලකරණ පරිපාලනය | දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | 2 | | ක්ලවුඩ් ජාලකරණය සහ අථත්‍යකරණය | 3 | ○ | |
| | | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | IoT සහ රැහැන් රහිත ජාලකරණය * | 3 | ○ | |
| | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | IoT සහ AI | 3 | ○ | |
| | | වෙබ් වැඩසටහන්කරණය 1 | 2 | ○ | තොරතුරු ආරක්ෂණය * | 2 | | |
| | | පරිගණක සැකසුම් න්‍යාය | 2 | | රවුටින් කිරීම සහ ස්විචනය * | 2 | | |
| | | පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) * | 3 | ○ | ජාලකරණය උසස් අධ්‍යයන * | 2 | | |
| | | ජාලගතකරණ මූලිකාංග | 2 | | වෙබ් තාක්ෂණය හඳුන්වාදීම | 2 | | |
| | | AI 1 සඳහා මෘදුකාංග යෙදුම් | 2 | | වෙබ් සේවා ප්‍රවර්ධනය | 4 | ○ | |
| | | පද්ධති පරිපාලනය | 2 | | සයිබර් ආරක්ෂණය | 4 | | |
| | | ව්‍යවසායකයා සඳහා නව නීති | 2 | | තොරතුරු ආචාර ධර්ම පිළිබඳ ගැඹුරු මාතෘකා | 2 | | |
| | | උසස් රවුටින් කිරීම සහ ස්විචයනය | 4 | | අන්තර්ජාල පාලනය | 2 | | |
| | | ගෝලීය අන්තර්ජාල කළමනාකරණ න්‍යාය | 2 | | | | | |
| | ගෝලීය ව්‍යවසායකත්වය | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | වෙළඳ නාම නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය | 2 | | |
| | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | අන්තර්ජාල වෙළඳාමේ උපායමාර්ග සහ අලෙවිකරණය * | 2 | | |
| | | වෙබ් වැඩසටහන්කරණය 1 | 2 | ○ | ඉ-වාණිජ ක්‍රමවේද * | 2 | | |
| | | තිරසාර සංවර්ධනය උදෙසා නිවැරදිව කටයුතු කිරීම | 2 | | ව්‍යවසාය කත්වය සහ ව්‍යාපාර ආකෘති * | 2 | | |
| | | ආයතනික හැසිරීම | 2 | | තොරතුරු තාක්ෂණ ව්‍යාපාරයේ කතිකාව | 2 | | |
| | | තොරතුරු සදාචාරය උසස් මාතෘකා | 2 | | පරිගණක ක්‍රීඩා න්‍යාය සහ කතිකාව | 2 | | |
| | | වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම * | 2 | | සැලසුම් නිර්මාණ චින්තනය | 4 | | |
| | | ව්‍යාපාර ආර්ථික විද්‍යාව 1, 2 * (1 පමණි) | 2 බැගින් | | ප්‍රායෝගික ක්ලවුඩ් පරිගණනය | 2 | | |
| | | බුද්ධිමය දේපල හිමිකම් නීතිය | 2 | | ව්‍යවසායකයා සඳහා නව නීති * | 2 | | |
| | | ව්‍යාපාර පරිපාලනය උසස් මාතෘකා * | 2 | | ව්‍යාපෘති කළමනාකරණය * | 2 | | |
| | | ව්‍යාපාර කළමනාකරණය ප්‍රායෝගික හැදෑරීම * | 2 | | ගෝලීය මානව සම්පත් සංවර්ධනය | 2 | | |
| | | තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වත්මන් ගැටළු | 2 | | අන්තර්ජාල පාලනය | 2 | | |
| | | ගෝලීය අන්තර්ජාල කළමනාකරණ න්‍යාය | 2 | | | | | |

උගන්වනු ලබන ප්‍රධාන පාඨමාලා පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙතැනින් සොයාගත හැක

| වර්ග | වර්ගීකරණය | පාඨමාලා | ක්‍රෙඩිට් ගණන | පුහුණුව | පාඨමාලා | ක්‍රෙඩිට් ගණන | පුහුණුව | වැදගත් |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේන්ද්‍රීය පාඨමාලා | ERP | දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | 2 | | විකුණුම් සහ බෙදාහැරීම් පද්ධති සංවර්ධනය 1, 2 | 3 බැගින් | ○ | මෙම සංකේන්ද්‍රීය ක්ෂේත්‍රවලින් එකක් තෝරන්න. ඔබට කර්මාන්ත පාඨමාලා අතරින් ද පාඨමාලා තෝරාගත හැක. |
| | | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | නිෂ්පාදන පාලන පද්ධති සංවර්ධනය | 3 | ○ | |
| | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | ද්‍රව්‍ය කළමනාකරණ පද්ධති සංවර්ධනය | 3 | ○ | |
| | | වෙබ් වැඩසටහන්කරණය 1, 2 | 2 බැගින් | ○ | මානව සම්පත් කළමනාකරණ පද්ධති සංවර්ධනය | 3 | ○ | |
| | | ව්‍යාපාර සඳහා තොරතුරු පද්ධති * | 2 | | ERP ව්‍යාපාර යෙදුම් සංවර්ධනය * | 3 | ○ | |
| | | පද්ධති එක්කිරීම සහ ඉ-ව්‍යාපාර * | 4 | ○ | ERP උපදේශනයේ උසස් මාතෘකා | 2 | | |
| | | ජාත්‍යන්තර ගිණුම්කරණය | 2 | | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සැදීම | 4 | ○ | |
| | | මූල්‍ය ගණකාධිකරණ පද්ධති සංවර්ධනය 1, 2 * | 3 බැගින් | ○ | | | | |
| | IT මැංගා සහ සජීවිකරණය | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | තිර රචනය සහ කතන්දර | 2 | | |
| | | පරිගණක සැකසුම් න්‍යාය | 2 | | අනර්ඝ මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම * | 4 | ○ | |
| | | සජීවිකරණ නිර්මාණය මූලිකාංග - A, B | 2 බැගින් | ○ | දෘශ්‍ය කථා ඉදිරිපත්කිරීම සහ සන්නිවේදනය * | 3 | ○ | |
| | | වෙබ් වැඩසටහන්කරණය 1 | 2 | ○ | සජීවිකරණය, සැලසුම්, නිෂ්පාදනය, ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා * | 2 | | |
| | | විශේෂ දෘශ්‍ය ප්‍රායෝග | 3 | ○ | පරිගණක චිත්‍රක * | 2 | | |
| | | ඩිජිටල් හඬ නිපැයුම | 2 | | ප්‍රායෝගික සජීවිකරණ නිෂ්පාදනය | 2 | | |
| | | උසස් විශේෂ දෘශ්‍ය ප්‍රයෝග | 3 | ○ | විනෝදාස්වාදය සහ තොරතුරු තාක්ෂණය | 2 | | |
| | | අන්තර්ගත කර්මාන්තයේ විශේෂ මාතෘකා | 2 | | සන්නාම සැලසුම් නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය | 2 | | |
| | | ඩිජිටල් සජීවිකරණ නිර්මාණය * | 3 | ○ | දෘශ්‍ය ජයා සැකසුම් | 2 | | |
| | සංචාරක තොරතුරු තාක්ෂණය | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | මාධ්‍ය සන්නිවේදනය | 2 | | |
| | | පරිගණක ක්‍රමලේඛනයේ මූලධර්ම | 2 | | ව්‍යාපෘති කළමනාකරණය | 2 | | |
| | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | සංචාරක තොරතුරු තාක්ෂණයේ මූලධර්ම * | 2 | | |
| | | වෙබ් වැඩසටහන්කරණය 1, 2 * (2 පමණි) | 2 බැගින් | ○ | සංචාරක ව්‍යාපාරයේ මූලධර්ම * | 2 | | |
| | | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පද්ධති සැලසුම් නිර්මාණය | 4 | ○ | ජපන් සමාජය අවබෝධ කර ගැනීම | 2 | | |
| | | අනර්ඝ මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම | 4 | ○ | සංචාරක ගමනාන්ත කළමනාකරණය | 2 | | |
| | | දෘශ්‍ය කථා ඉදිරිපත්කිරීම සහ සන්නිවේදනය | 3 | ○ | සංචාරක දත්ත විශ්ලේෂණය | 2 | | |
| | | විශේෂ දෘශ්‍ය ප්‍රායෝග | 3 | ○ | සංචාරක තොරතුරු තාක්ෂණයේ උසස් මාතෘකා | 2 | | |
| | | සජීවිකරණය, සැලසුම්, නිෂ්පාදනය, ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා | 2 | | සංචාරක ව්‍යාපාර සැලසුම් නිර්මාණය * | 2 | | |
| | | දත්ත විශ්ලේෂණය 1 | 2 | | සංචාරක තොරතුරු තාක්ෂණ සීමාවාසික පුහුණුව | 2 | | |
| | | ව්‍යාපාර ආර්ථික විද්‍යාව 1 * | 2 | | ගෝලීය මානව සම්පත් සංවර්ධනය * | 2 | | |
| | | සන්නාම සැලසුම් නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය | 2 | | ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය | 2 | ○ | |
| කාර්මාන්තික පාඨමාලා | මූල්‍ය | මුදල් සහ බැංකුකරණය | 2 | | මූල්‍ය තාක්ෂණ පද්ධති සැලසුම් නිර්මාණය | 2 | | කර්මාන්ත පාඨමාලාවලට සංකේන්ද්‍රීය පාඨමාලා සමග ඒකාබද්ධව සහභාගී විය යුතු ය. මෙහි දී ක්ෂේත්‍ර කිහිපයක් තෝරාගත හැක. |
| | | මූල්‍ය තාක්ෂණ මූලිකාංග | 2 | | | | | |
| | කෘෂිකර්මය | නූතන යුගයේ කෘෂිකාර්මික තොරතුරු විද්‍යාව | 2 | | කෘෂිකාර්මික තොරතුරු පද්ධති නිර්මාණය | 2 | | |
| | | කෘෂිකාර්මික ආර්ථිකය | 2 | | | | | |
| | සාමුද්‍රික | සාමුද්‍රික කර්මාන්තවල මූලිකාංග | 2 | | සාමුද්‍රික තොරතුරු පද්ධති නිර්මාණය | 2 | | |
| | | සමුද්‍රීය තොරතුරු තාක්‍ෂණයේ මූලධර්ම | 2 | | | | | |
| | සෞඛ්‍ය සහ වෛද්‍ය | වෛද්‍ය තොරතුරු සහ නීතිය | 2 | | වෛද්‍ය තොරතුරු පද්ධති නිර්මාණය | 2 | | |
| | | වෛද්‍ය තොරතුරු විද්‍යාව | 2 | | | | | |
| | අන්තර්ගත අලෙවිකරණය | අන්තර්ගත කර්මාන්තයේ විශේෂ මාතෘකා | 2 | | විනෝදාස්වාදය සහ තොරතුරු තාක්ෂණය | 2 | | |
| | | සංගීතය සහ තොරතුරු තාක්ෂණය | 2 | | අන්තර්ගත ප්‍රවර්ධන උපායමාර්ග | 2 | | |
| | අධ්‍යාපනය | ඉ-ඉගෙනුම් ක්‍රමයේ මූලිකාංග | 2 | | පුස්තකාල තොරතුරු විද්‍යාව | 2 | | |
| | | ඉ-ඉගෙනුම් ව්‍යාපාරවල උපදෙස් නිර්මාණය | 2 | | පාසැල් හා ආයතනික අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සංසන්දනාත්මක අධ්‍යයනය | 2 | | |
| | | ඉ-ඉගෙනුම් පාඨමාලා සටහන් සංවර්ධනය | 2 | | ඊළඟ පරම්පරාවේ උසස් අධ්‍යාපනය පිළිබඳ න්‍යාය | 2 | | |
| ආධාරක වරණීය පාඨමාලා | | ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | 2 | | ව්‍යවහාරික තොරතුරු තාක්ෂණවේදය වැදගත් සාධක A | 1 | | වම් පස ඇති පාඨමාලා ලැයිස්තුවෙන් සිසුන්ට සිතැඟි පරිදි පාඨමාලා තෝරාගත හැක. |
| | | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | 2 | | ව්‍යවහාරික තොරතුරු තාක්ෂණවේදය වැදගත් සාධක B | 2 | | |
| | | දෘශ්‍ය ජයා සැකසුම් | 2 | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාපාර සන්නිවේදනය-ගැඹුරින් අධ්‍යනය | 3 | ○ | |
| | | තාක්ෂණික සංනිවේදන හැකියාවන් | 2 | | තාක්ෂණික ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා | 2 | | |
| | | ව්‍යාපාර විස්තර ඉදිරිපත් කිරීම | 2 | | වෙබ් වැඩසටහන්කරණය 1 | 2 | ○ | |
| | | ව්‍යාපාර සන්නිවේදනය 1, 2 | 2 බැගින් | | දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | 2 | | |
| | | මාධ්‍ය සන්නිවේදනය | 2 | | පරිගණක සැකසුම් න්‍යාය | 2 | | |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාපාර සන්නිවේදනය | 3 | ○ | ජාලගතකරණ මූලිකාංග | 2 | | |
| | | පද්ධති නිර්මාණය උසස් මාතෘකා | 2 | | පරිගණක ක්‍රමලේඛනයේ මූලධර්ම | 2 | | |
| | | පද්ධති න්‍යාය උසස් මාතෘකා | 2 | | ඉදිකිරීම් තොරතුරු තාක්‍ෂණයේ මූලධර්ම | 2 | | |
| | | නිෂ්පාදන පද්ධති ඉංජිනේරුවේදය | 4 | ○ | ව්‍යවහාරික තාක්‍ෂණයේ ප්‍රවණතා අධ්‍යයනය | 2 | | |
| | | රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය | 2 | | | | | |
| අනිවාර්ය | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | 2 | | ව්‍යාපෘති පදනම් | 2 | | ☆ |
| | | නායකත්ව න්‍යාය | 2 | | ප්‍රධාන ව්‍යාපෘතිය | 0,2,4,6 | | |

- මූලික පාඨමාලා යනු "*" තරු ලකුණින් සලකුණු කර ඇති ඒවා වේ. මූලික පාඨමාලා යනු එක් එක් සංකේන්ද්‍රීය ක්ෂේත්‍රය සඳහා වැදගත් වන දැනුම සහ කුසලතා උගන්වන පාඨමාලා වේ.
- වැඩසටහන සම්පූර්ණ කිරීම සඳහා අවම වශයෙන් ක්‍රෙඩිට් 44ක් අවශ්‍ය වේ (අනිවාර්ය පාඨමාලා ඇතුළුව).
- තාක්‍ෂණයේ සහ සමාජීය අවශ්‍යතාවල වෙනස්වීම් සමග ඉදිරියට යාම උදෙසා, පිරිනමනු ලබන පාඨමාලා එක් අධ්‍යයන වර්ෂයක හෝ වාරයක සිට ඊළඟ අධ්‍යයන වර්ෂය දක්වා වෙනස් විය හැක. එසේම, ඔබ තෝරාගත් පාඨමාලා සඳහා අවම වශයෙන් පුද්ගලයන් පස් දෙනෙකුවත් ලියාපදිංචි නොවන්නේ නම් එම පාඨමාලාව පිරිනැමීම කළ නොහැක.

☆ ප්‍රධාන ව්‍යාපෘති පිළිබඳ විස්තර සඳහා 17 පිටුව බලන්න.

# සංකේන්ද්‍රීය ක්ෂේත්‍රය අනුව පාඨමාලා ගමන් මාර්ග (නිර්දේශිත අධ්‍යයන රටා)

අනිවාර්ය | හර පාඨමාලා | ව්‍යවහාරික පාඨමාලා | කර්මාන්ත පාඨමාලා / ආධාරක වරණීය පාඨමාලා | මූලික පාඨමාලා

## ◆ කෘත්‍රිම බුද්ධිය (AI)

**මෙම වැඩසටහන හදාරන සිසුන් අනාගතයේ AI-සහයෝගී සමාජය තුළ ඉදිරියට යාමට සහ AI විශේෂඥයින් ලෙස පුළුල් පරාසයක ක්ෂේත්‍ර තුළ AI තාක්ෂණය භාවිතා කිරීමට සහ ප්‍රායෝගිකව යෙදීමට හැකියාව ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉගෙනුම් කටයුතු සිදු කරයි.**

AI හි මූලික න්‍යාය සහ ඒ ආශ්‍රිත තාක්ෂණයන් හැදෑරීමෙන් පසු, සිසුන් පුළුල් පරාසයක AI ව්‍යවහාරික ක්ෂේත්‍ර තුළ එම මූලික න්‍යාය සහ තාක්ෂණය ප්‍රායෝගිකව යෙදිය හැකි ආකාරය ගවේෂණය කිරීමට සැබෑ ලෝකයේ සිද්ධි අධ්‍යයනයන් පරීක්ෂා කර බලයි. AI ක්ෂේත්‍රය තුළ බහුලව භාවිතා වන භාෂාවක් වන Python සහ AI හා සම්බන්ධ වෙනත් බොහෝ මෘදුකාංග නිෂ්පාදන අධ්‍යයනය කිරීම හරහා විවිධ ක්ෂේත්‍ර තුළ AI තාක්ෂණය භාවිතා කිරීමට සහ ප්‍රායෝගිකව යෙදීමට හැකි සිසුන් බිහි කරයි. AI යෙදුම් මෘදුකාංග සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කළ හැකි උසස් ඉංජිනේරුවන් බිහි කරන වැඩසටහන් ද අපි පිරිනමන්නෙමු.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| AI පිළිබඳ හැඳින්වීම | යන්ත්‍ර ඉගෙනුම් සහ එහි යෙදවුම් | පරිගණක ක්‍රීඩා සහ AI | මූල්‍ය තාක්ෂණ මූලිකාංග |
| ඇල්ගොරිතම හඳුන්වාදීම | සංයෝජන ප්‍රශස්තකරණය | ස්වභාවික භාෂා සැකසුම්කරණය | නව ව්‍යාපාර සහ AI |
| පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) | AI 1, 2 සඳහා මෘදුකාංග යෙදුම් | කථන පරිග්‍රහණය | |
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | AI සඳහා ගණිතය | වෛද්‍ය තොරතුරු විද්‍යාව | |
| පරිගණක සැකසුම් න්‍යාය | දත්ත කැණීම | රොබෝ තාක්ෂණය සහ AI | |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | දත්ත විශ්ලේෂණය 1 | IoT සහ AI | |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සෑදීම | AI 2 සඳහා මෘදුකාංග යෙදුම් | |
| | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා | දත්ත විශ්ලේෂණය 2 | |
| | | තාර්කික චින්තනය | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

## ◆ දත්ත විද්‍යාව

**ව්‍යාපාර දත්ත විශ්ලේෂණය කර, ව්‍යාපාර තීරණ ගැනීමේ දී එය යෙදවිය හැකි විශ්ලේෂකයෙකු බවට පත් වන්න.**

මෙම සංකේන්ද්‍රණ ක්ෂේත්‍රයේ අරමුණ වන්නේ දත්ත කැණීම සහ සංඛ්‍යානමය විශ්ලේෂණය වැනි තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් ව්‍යාපාරික දත්ත විශ්ලේෂණය කර ආයතනික උපායමාර්ග යෝජනා කිරීමට සහ ප්‍රවර්ධනයට සහාය විය හැකි විශ්ලේෂකයින් බිහි කිරීම යි. දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග සහ දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා, සිසුන් ව්‍යාපාර දත්ත රැස් කිරීමේ ක්‍රම ඉගෙන ගනී; දත්ත විශ්ලේෂණය 1, 2 සහ අනෙකුත් පාඨමාලාවල දී සිසුන් සමුච්චිත දත්තවලින් දැනුම උකහා ගැනීමේ ශිල්පීය ක්‍රම ඉගෙන ගනී.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| පරිගණක ක්‍රමලේඛනයේ මූලධර්ම | දත්ත විශ්ලේෂණය 1 | ඉ-වාණිජ ක්‍රමවේද | දත්ත ගබඩා සහ Big Data |
| වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම | වෙබ් වැඩසටහන්කරණය 2 | ගුණාත්මක දත්ත විශ්ලේෂණය සහ පරිණාමනය | ව්‍යවහාරික තොරතුරු තාක්ෂණවේදය වැදගත් සාධක A අභ්‍යන්තරස්ථ-මතක දත්ත සමුදාය |
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | ගවේෂණාත්මක දත්ත විශ්ලේෂණය සහ දෘෂ්ටිකල්පනය | අන්තර්ජාල වෙළඳාමේ උපායමාර්ග සහ අලෙවිකරණය | මූල්‍ය තාක්ෂණ මූලිකාංග |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | දත්ත මිනිතය න්‍යායන් | ප්‍රායෝගික ක්ලවුඩ් පරිගණනය | |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | තොරතුරු ආචාර ධර්ම පිළිබඳ ගැඹුරු මාතෘකා | ආයතනික හැසිරීම | |
| පරිගණක සැකසුම් න්‍යාය | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා | දත්ත විශ්ලේෂණය 2 | |
| වෙබ් වැඩසටහන්කරණය 1 | ව්‍යාපාර පරිපාලනය උසස් මාතෘකා | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

## ◆ ගෝලීය ව්‍යවසායකත්වය

**නව ව්‍යාපාරයක තොරතුරු තාක්ෂණය යොදාගන්නා ව්‍යවසායකයෙකු වීමට ඉලක්ක කරන සිසුන් සඳහා.**

මෙම සංකේන්ද්‍රණයේ සිටින සිසුන්ගේ අරමුණ වන්නේ පුද්ගලයන්, අරමුදල් සහ/හෝ තොරතුරු උපායමාර්ගිකව කළමනාකරණය කරන ව්‍යාපාරයක් දියත් කිරීමේ අභියෝගය භාර ගන්නා ව්‍යවසායකයින් වීම යි. ගෝලීය ව්‍යවසාය කත්වය සහ ව්‍යාපාර ආකෘති පාඨමාලාවට සහභාගී වීමෙන්, ශිෂ්‍යයා ව්‍යවසායක් දියත් කිරීමේ අත්‍යවශ්‍ය අංගයක් වන ව්‍යාපාර සැලැස්මක් යෝජනා කරන ආකාරය ඉගෙන ගනී. නව සමාගම ආරම්භයෙන් පසු එහි ගිණුම් කළමනාකරණය කරන ආකාරය දැන ගැනීමට, සිසුවා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වත්මන් ගැටළු පාඨමාලාවට සහභාගී වේ. ආයතනික හැසිරීම තුළින්, ශිෂ්‍යයා මානව සංවිධාන අභිප්‍රේරණය කරන ආකාරය ඉගෙන ගනී.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| ව්‍යාපාර ආර්ථික විද්‍යාව 1 | ව්‍යාපෘති කළමනාකරණය | ගෝලීය මානව සම්පත් සංවර්ධනය | පරිගණක ක්‍රීඩා න්‍යාය සහ කතිකාව |
| ව්‍යාපාර ආර්ථික විද්‍යාව 2 | ව්‍යවසාය කත්වය සහ ව්‍යාපාර ආකෘති | අන්තර්ජාල වෙළඳාමේ උපායමාර්ග සහ අලෙවිකරණය | ව්‍යාපාර පරිපාලනය උසස් මාතෘකා |
| වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම | ප්‍රායෝගික ක්ලවුඩ් පරිගණනය | ඉ-වාණිජ ක්‍රමවේද | ව්‍යවසායකයා සඳහා නව නීති |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | බුද්ධිමය දේපළ හිමිකම් නීතිය | සැලසුම් නිර්මාණ චින්තනය | තිරසාර සංවර්ධනය උදෙසා නිවැරදිව කටයුතු කිරීම |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වත්මන් ගැටළු | ව්‍යාපාර කළමනාකරණය ප්‍රායෝගික හැදෑරීම් | |
| වෙබ් වැඩසටහන්කරණය 1 | තොරතුරු ආචාර ධර්ම පිළිබඳ ගැඹුරු මාතෘකා | වෙළඳ නාම නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය | |
| | ආයතනික හැසිරීම | තොරතුරු තාක්ෂණ ව්‍යාපාරයේ කතිකාව | |
| | ගෝලීය අන්තර්ජාල කළමනාකරණ න්‍යාය | අන්තර්ජාල පාලනය | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

## ◆ ERP

**ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රශස්ත කරන උපදේශකයෙකු වීම සඳහා ERP හදාරන සිසුන් සඳහා.**

මෙම සංකේන්ද්‍රීය පාඨමාලාව ආයතනික තොරතුරු තාක්ෂණ පද්ධති හඳුන්වා දෙන සහ ප්‍රශස්ත කරන ERP උපදේශකයෙකු වීමට හෝ ERP පැකේජ සඳහා ඇඩෝන සැලසුම් කර සංවර්ධනය කරන පද්ධති ඉංජිනේරුවෙකු හෝ ක්‍රමලේඛකයෙකු වීමට ඉලක්ක කරන සිසුන් සඳහා වේ. SAP හි ERP පැකේජවලට අදාළ ව්‍යවහාරික පාඨමාලා හැදෑරීමෙන් (උදාහරණයක් ලෙස මූල්‍ය ගණකාධිකරණ පද්ධති සංවර්ධනය 1, 2), සිසුවාට ERP පද්ධති පිළිබඳව අදියර වශයෙන් ඉගෙන ගත හැක.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| ව්‍යාපාර සඳහා තොරතුරු පද්ධති | මූල්‍ය ගණකාධිකරණ පද්ධති සංවර්ධනය 1, 2 | විකුණුම් සහ බෙදාහැරීම් පද්ධති සංවර්ධනය 1, 2 | ERP උපදේශනයේ උසස් මාතෘකා |
| පද්ධති එක්කිරීම සහ ඉ-ව්‍යාපාර | ERP ව්‍යාපාර යෙදුම් සංවර්ධනය | ද්‍රව්‍ය කළමනාකරණ පද්ධති සංවර්ධනය | මානව සම්පත් කළමනාකරණ පද්ධති සංවර්ධනය |
| ජාත්‍යන්තර ගිණුම්කරණය | නිෂ්පාදන පාලන පද්ධති සංවර්ධනය | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සෑදීම | |
| වෙබ් වැඩසටහන්කරණය 1 | වෙබ් වැඩසටහන්කරණය 2 | | |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | | |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

## ◆ වෙබ් පද්ධති සංවර්ධනය

**HTML5 කේන්ද්‍ර කරගත් වෙබ් පද්ධති සංවර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන සිසුන් සඳහා.**

වෙබ් යෙදුම් සංවර්ධනය කරන ඉංජිනේරුවෙකු වීමට හෝ වෙබ් අඩවියක කළමනාකරුවෙකු වීමට, ශිෂ්‍යයාට වෙබ් වැඩසටහන්කරණය 1–3 පාඨමාලාවට සහභාගී වීමෙන් තම කුසලතා වර්ධනය කර ගත හැක. දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග සහ දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා, සිසුවාට වෙබ් පද්ධතිය මගින් ලබා දෙන දත්ත කළමනාකරණය සිදු කරන කොටස ගොඩනැගීමට ඉගෙන ගත හැක. මීට අමතරව, ශිෂ්‍යයාට ඉගෙන ගැනීමට තම විෂය මාලාවටවස්තු ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පද්ධති සැලසුම් නිර්මාණය සහ මෘදුකාංග ඉංජිනේරුවේදය එක් කරගෙන ක්‍රියාවලි තවදුරටත් ඉදිරියට සැලසුම් කිරීම ගැන ඉගෙන ගත හැක.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| වෙබ් තාක්ෂණය හඳුන්වාදීම | වෙබ් වැඩසටහන්කරණය 2 | වෙබ් වැඩසටහන්කරණය 3 | මෘදුකාංග ඉංජිනේරුවේදය |
| වෙබ් සම්බන්ධ ව්‍යාපාර හඳුන්වාදීම | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පද්ධති සැලසුම් නිර්මාණය | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පරිගණක ප්‍රෝග්‍රෑම් සෑදීම | ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය |
| පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) | දත්ත පද්ධති තාක්ෂණයේ උසස් මාතෘකා | සැලසුම් නිර්මාණ චින්තනය | වෙබ් සේවා ප්‍රවර්ධනය |
| වෙබ් වැඩසටහන්කරණය 1 | AI 1 සඳහා මෘදුකාංග යෙදුම් | | |
| ජාලගතකරණ මූලිකාංග | | | |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | පරිගණක සැකසුම් න්‍යාය | | |
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

## ◆ ජාලකරණ පරිපාලනය

**ජාල යටිතල පහසුකම් තාක්ෂණය සහ තොරතුරු ආරක්ෂණය පිළිබඳ විශේෂඥයෙකු ලෙස වෘත්තියක් ඉලක්ක කරන සිසුන් සඳහා.**

මෙම සංකේන්ද්‍රීය පාඨමාලාවේ සිටින සිසුන් සමාගම් අභ්‍යන්තර ජාල සහ සේවාදායක පිළිබඳ නඩත්තු/මෙහෙයුම් ඉංජිනේරුවෙකු හෝ ආරක්ෂණ කළමනාකරුවෙකු වැනි තොරතුරු ජාල විශේෂඥයෙකු වීමට ඉලක්ක කරයි. ජාලකරණයේ මූලිකාංග සහ ජාලකරණයේ උසස් අධ්‍යයනවටල සහභාගී වීමෙන් දැනටමත් ජාල පද්ධති අධ්‍යයනය කර ඇති සිසුවා, IoT සහ රැහැන් රහිත ජාලකරණය සහ ක්ලවුඩ් ජාලකරණය සහ අතථ්‍යකරණය ආදී පාඨමාලවලට සහභාගී වී නව තාක්ෂණයන් ඉගෙන ගැනීමේ අභියෝගය භාරගනී.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| වෙබ් තාක්ෂණය හඳුන්වාදීම | තොරතුරු ආරක්ෂණය | ජාලකරණය උසස් අධ්‍යයන | IoT සහ AI |
| පරිගණක ප්‍රෝග්‍රෑම් කිරීම (පයිතන්) | සයිබර් ආරක්ෂණය | IoT සහ රැහැන් රහිත ජාලකරණය | ක්ලවුඩ් ජාලකරණය සහ අථත්‍යකරණය |
| ජාලගතකරණ මූලිකාංග | AI 1 සඳහා මෘදුකාංග යෙදුම් | පද්ධති පරිපාලනය | උසස් රවුටින් කිරීම සහ ස්විචයනය |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | ව්‍යවසායකයා සඳහා නව නීති | රවුටින් කිරීම සහ ස්විචනය | වෙබ් සේවා ප්‍රවර්ධනය |
| දත්ත පද්ධති තාක්ෂණ මූලිකාංග | තොරතුරු ආචාර ධර්ම පිළිබඳ ගැඹුරු මාතෘකා | අන්තර්ජාල පාලනය | |
| වෙබ් වැඩසටහන්කරණය 1 | ගෝලීය අන්තර්ජාල කළමනාකරණ න්‍යාය | | |
| පරිගණක සැකසුම් න්‍යාය | | | |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

## ◆ IT මැංගා සහ සජීවිකරණය

**සජීවිකරණය, වීඩියෝ හෝ ඊට සමාන අන්තර්ගත නිර්මාණයේ ප්‍රවීණයෙකු වීමට කැමති සිසුන් සඳහා.**

මෙම සංකේන්ද්‍රීය පාඨමාලාව ඉගෙන ගන්නා සිසුන් මාංගා සහ ඇනිමෙ ක්ෂේත්‍රය ආශ්‍රිත වෘත්තීය අන්තර්ගත නිර්මාණකරුවකු වීමට අරමුණු කරයි. ඇනිමෙ පිළිබඳ විශේෂ මාතෘකා, සැලසුම්කරණය, නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය, තිර රචනය සහ කතන්දර හරහා සිසුන් උසස් මට්ටමේ මාංගා සහ ඇනිමෙ නිර්මාණ ක්‍රියාවලි ඉගෙන ගන්නා අතර, අනර්ඝ මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම සහ ඩිජිටල් සජීවිකරණ නිර්මාණය හරහා සිසුන් නිශ්චිත මෙවලම් භාවිතයෙන් ඩිජිටල් අන්තර්ගත නිෂ්පාදනය කරන ආකාරය ඉගෙන ගනී.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| අනර්ඝ මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම | ඩිජිටල් සජීවිකරණ නිර්මාණය | පරිගණක චිත්‍රක | ඩිජිටල් හඬ නිපැයුම |
| සජීවිකරණ නිර්මාණය මූලිකාංග - A | සජීවිකරණය, සැලසුම්, නිෂ්පාදනය, ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා | දෘශ්‍ය කථා ඉදිරිපත්කිරීම සහ සන්නිවේදනය | උසස් විශේෂ දෘශ්‍ය ප්‍රයෝග |
| අන්තර්ගත කර්මාන්තයේ විශේෂ මාතෘකා | තිර රචනය සහ කතන්දර | ප්‍රායෝගික සජීවිකරණ නිෂ්පාදනය | විනෝදාස්වාදය සහ තොරතුරු තාක්ෂණය |
| වෙබ් වැඩසටහන්කරණය 1 | දෘශ්‍ය ජයා සැකසුම් | විශේෂ දෘශ්‍ය ප්‍රායෝග | වෙළඳ නාම නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය |
| ව්‍යාවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | සජීවිකරණ නිර්මාණය මූලිකාංග - B | | |
| පරිගණක සැකසුම් න්‍යාය | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

## ◆ සංචාරක තොරතුරු තාක්ෂණය

**සංචාරක ව්‍යාපාර සැලසුම් කිරීමට සහ අදාළ පද්ධති යෝජනා කිරීමට හැකියාව ඇති සංචාරක තොරතුරු තාක්ෂණ විශේෂඥයින් වීමට කැමති සිසුන් සඳහා.**

සංචාරක තොරතුරු තාක්ෂණය හදාරන සිසුන් සංචාරක සම්පත් ලෙස ක්‍රියා කරන කලාපවල ලක්ෂණ සහ සංචාරකයින්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීමටත්, සේවා සහ අලෙවිකරණ උපායමාර්ග යෙදීමේ දී ICT යොදා ගැනීමටත් හැකි විශේෂඥයින් බවට පත් වීමට අරමුණු කරයි. සංචාරක තොරතුරු තාක්ෂණයේ මූලධර්ම සහ සංචාරක ව්‍යාපාරයේ මූලධර්ම වැනි පාඨමාලාවලට සහභාගී වීමෙන් සිසුන් සංචාරක කර්මාන්තයට අවශ්‍ය කරන මෙහෙයුම් දැනුම සහ මූලික කුසලතා ලබා ගනී. සංචාරක දත්ත විශ්ලේෂණය, සංචාරක ව්‍යාපාර සැලසුම් නිර්මාණය සහ සංචාරක ගමනාන්ත කළමනාකරණය වැනි පාඨමාලා අධ්‍යයන හරහා සිසුන් සමාජ ජාලා ප්‍රවර්ධන මෙවලමක් ලෙස භාවිතා කිරීමට, බහු භාෂා සහ මාධ්‍යවලින් සංචාරක තොරතුරු සැපයීමට, සංචාරකයින්ගේ ක්‍රියාකාරකම් ඉතිහාසය දත්ත බවට පරිවර්තනය කිරීමට සහ එම දත්ත විශ්ලේෂණයට හා පුරෝකථනයට යොදා ගැනීමට ඉගෙන ගනී.

| 1 වන අධ්‍යයන වාරය | 2 වන අධ්‍යයන වාරය | 3 වන අධ්‍යයන වාරය | 4 වන අධ්‍යයන වාරය |
|---|---|---|---|
| සංචාරක ව්‍යාපාරයේ මූලධර්ම | සංචාරක ව්‍යාපාර සැලසුම් නිර්මාණය | සංචාරක ගමනාන්ත කළමනාකරණය | සංචාරක තොරතුරු තාක්ෂණයේ උසස් මාතෘකා |
| සංචාරක තොරතුරු තාක්ෂණයේ මූලධර්ම | ගෝලීය මානව සම්පත් සංවර්ධනය | සංචාරක දත්ත විශ්ලේෂණය | සංචාරක තොරතුරු තාක්ෂණ සීමාවාසික පුහුණුව |
| ව්‍යාපෘති කළමනාකරණය | වෙබ් වැඩසටහන්කරණය 2 | ඔබ්ජෙක්ට් ඔරියන්ටඩ් ක්‍රමයට පද්ධති සැලසුම් නිර්මාණය | ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය |
| ජපන් සමාජය අවබෝධ කර ගැනීම | ව්‍යාපාර ආර්ථික විද්‍යාව 1 | දත්ත විශ්ලේෂණය 1 | අනර්ඝ මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කිරීම |
| පරිගණක ක්‍රමලේඛනයේ මූලධර්ම | මාධ්‍ය සන්නිවේදනය | සජීවිකරණය, සැලසුම්, නිෂ්පාදනය, ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා | විශේෂ දෘශ්‍ය ප්‍රායෝග |
| වෙබ් වැඩසටහන්කරණය 1 | | දෘශ්‍ය කථා ඉදිරිපත්කිරීම සහ සන්නිවේදනය | වෙළඳ නාම නිර්මාණය සහ ව්‍යාපාර කළමනාකරණය |
| තොරතුරු තාක්ෂණය සඳහා සංඛ්‍යානය | | | |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යාව සඳහා මූලික ගණිතය | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වෘත්තීය සංනිවේදනය | ව්‍යාපෘති පදනම් | | |
| නායකත්ව න්‍යාය | ප්‍රධාන ව්‍යාපෘතිය | | |

අනෙකුත් සංකේන්ද්‍රීය පාඨමාලා, කර්මාන්ත පාඨමාලා සහ ආධාරක වරණීය පාඨමාලාවලින් තෝරාගනු ලැබේ

# කැම්පස්

## කියෝතෝ ප්‍රධාන පාසල

කියෝතෝ ප්‍රධාන පාසල කැම්පස් දෙකකින් සමන්විත වේ. මෙම සරසවිවල විවිධාකාර වූ ශිෂ්‍ය ප්‍රජාව විසින්, ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම අධ්‍යයන උපාධිය වන තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගැනීම සඳහා පුළුල් පරාසයක අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදුකරයි. ෂටල් බස් රථය මගින් කැම්පස් දෙක අතර නොමිලේ ගමන් කල හැකිය.

### හයකුමන්බෙන් සරසවිය, සක්යෝ-කු, කියෝතෝ

2004 දී KCGI විවෘත කිරීමත් සමග, හයකුමන්බෙන් මණ්ඩපය අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කරන ලදී. 2022 දී පරිශ්‍රය පුළුල් කර නව පාසල් ගොඩනැගිල්ලක් (ප්‍රධාන ගොඩනැගිල්ල) ගොඩනඟන ලද අතර, එය වර්තමානයේ KCGI හි පන්ති බහුතරයක් පැවැත්වෙන ගුණාත්මයෙන් ඉහළ අධ්‍යාපනික පරිසරයකි. කියෝතෝ විශ්ව විද්‍යාලයට ආසන්නව පිහිටා ඇති හයකුමන්බෙන් පරිශ්‍රය කියෝතෝ නුවර ශිෂ්‍ය දිස්ත්‍රික්කයේ හදවත බඳු ප්‍රදේශයක පිහිටා ඇති අතර එය පාණ්ඩිත්‍ය සහ සිතීමේ නිදහස කෙරෙහි වූ ආශාවෙන් සිත ප්‍රබෝධමත් කරන ප්‍රදේශයකි. දකුණු ගොඩනැගිල්ල වරෙක KCG හි විශාල පරිගණක මධ්‍යස්ථානය ලෙස යොදාගත් අතර, සිසුන් පරිගණක පුහුණුවීම් සඳහා භාවිතා කළ UNIVAC Vanguard පරිගණකයක් එහි තිබිණි.

### කියෝතෝ එකිමඑ සැටලයිට්, මිනාමි-කු, කියෝතෝ

කියොතෝ එකිමාඑ චන්ද්‍රිකාව 2005 වසන්ත ඍතුවේ දී නිම කරන ලදී. විශාල මගීන් සංඛ්‍යාවක් සංක්‍රමණය වන ගමනාගමන මධ්‍යස්ථානයක් වන කියෝතෝ දුම්රිය ස්ථානයට යාබදව පිහිටා ඇති මෙම කැම්පස්එක සුවිශේෂී වූ පහසු ස්ථානයක තිබේ. විවෘත බාහිර පෙනුමෙන් කැපී පෙනෙන කියොතෝ එකිමාඑ චන්ද්‍රිකාව අති නවීන ඊ-ඉගෙනුම් කලාගාරයකින් සමන්විත වන අතර, දේශන රාශියක් මෙම ස්ථානයේ සිට ජාත්‍යන්තරයට බෙදා හැරීමට හැකිවී තිබේ. KCG හි පිහිටි කියොතෝ එකිමාඑ සරසවිය සමඟ එක්ව, නවීන තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස කියොතෝ එකිමාඑ චන්ද්‍රිකාව ක්‍රියා කරයි.






## චන්ද්‍රිකා කැම්පස්

ප්‍රධාන කැම්පස්එක මෙන්ම, චන්ද්‍රිකා කැම්පස් ද, දැනටමත් වෘතීය ලෝකයට අවතීර්ණ වූ අය ද ඇතුළුව විවිධාකාර සිසුන්ව ආකර්ෂණය කර ගනී. චන්ද්‍රිකා කැම්පස් සමඟ කියෝතෝ ප්‍රධාන කැම්පස් එක සම්බන්ධ වනු ලබන්නේ, ලබාදෙන-පන්ති (ප්‍රධාන කැම්පස්එකේ සිට පැමිණෙන උපදේශකයින් විසින් පවත්වනු ලබන පන්ති) මගින් පමණක් නොව, ප්‍රධාන කැම්පස්එක සමඟ රියල් ටයිම් සම්බන්ධ වන නවීනතම ඊ-ඉගෙනුම් පද්ධති මගින් ද වේ. කලින් පටිගත කරන ලද වීඩියෝ භාවිතා කරමින් කෙරෙන ඉගෙනීම ද ලබාදෙනු ලැබේ. තවද, සෑම සිසුවෙකුටම තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහය වීමට, එක් එක් චන්ද්‍රිකාවේ සිටින කැපවූ උපදේශකයින් විසින් ඉතා වැදගත් අධ්‍යයන උපකාර ලබා දෙයි.

### සප්පොරෝ චන්ද්‍රිකාව dGIC ඉන්කෝපරේෂන් තුළ පිහිටා ඇත

2012 අප්‍රේල් මාසයේ දී, ජපානයේ ඉතා උතුරින් පිහිටි හොක්කයිදෝ ප්‍රාන්ත මධ්‍යයේ පිහිටි සප්පොරෝ හි සප්පොරෝ චන්ද්‍රිකා කැම්පස්එක විවෘත විය. කියෝතෝ නගරයෙන් පිටත පිහිට වූ පළමු KCG කණ්ඩායම් පහසුකම මෙම කැම්පස්එක වේ.

සප්පොරෝ චන්ද්‍රිකා කැම්පස් හි කැපවී කාර්ය කරන උපදේශකයින් සියල්ලම දැනට තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ඉදිරි පෙළේ ක්‍රියාකාරීව යෙදී සිටී. තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වර්තමාන ගැටළු වලදී, උපදේශකයින් ඔවුන්ගේ අත්දැකීම් කථා සමඟ නවතම කර්මාන්ත තොරතුරු එකට සම්මිශ්‍ර කරයි. එමගින්, නුදුරු අනාගතයේ දී තොරතුරු තාක්ෂණ ව්‍යාපාරයට අවශ්‍ය දැනුම, කුසලතා සහ සන්නිවේදන හැකියාවන් පිළිබඳ පැහැදිලි විස්තර කිරීම් ලබා දෙයි. මෙම පාඨමාලාව මගින් හොක්කයිදෝ හි තොරතුරු තාක්ෂණ පුහුණුව ලබන සිසුන්ව පමණක් නොව, කියෝතෝ ප්‍රධාන කැම්පස් හි සිසුන්ව ද බුද්ධිමය වශයෙන් උත්තේජනය කරයි.

### තෝකියෝ චන්ද්‍රිකාව හිතොමීඩියා ඉන්කෝපරේටඩ් හි පිහිටා ඇත

තෝකියෝ චන්ද්‍රිකාව, තෝකියෝ හි මිනාතො නගරයේ රොප්පොන්ගි හිල්ස් අසල ස්ථානයක පිහිටා ඇත. තෝකියෝ චන්ද්‍රිකාව සප්පොරෝ චන්ද්‍රිකාවෙන් පසු ඇති වූ දෙවන ස්ථානය ලෙස 2012 ඔක්තෝම්බර් මාසයේදී විවෘත විය.

තෝකියෝ චන්ද්‍රිකාවෙ හි සිටින බොහෝ උපදේශකයින් වර්තමාන සමාජයේ වේගවත් ඩිජිටල්කරණයේ ඉදිරි පෙළ ක්‍රියාකාරීන් වේ. මේ හේතුව නිසා, තෝකියෝ චන්ද්‍රිකාව විසින් ලබාදෙන තොරතුරු තාක්‍ෂණ පුහුණුව සහ තාර්කික චින්තනයේ පන්ති, කියෝතෝ ප්‍රධාන කැම්පස් හි සිසුන් ඇතුළු සිසුන්ගේ නිරන්තර ප්‍රියතමයන් වේ. ලෝක වේදිකාවේ වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි ව්‍යවහාරික තොරතුරු තාක්ෂණයේ ඉහළ පෙළේ නායකයින් ඇති කිරීමට, තෝකියෝ චන්ද්‍රිකාවෙන් ලබා දෙන අධ්‍යාපනය බෙහෙවින් දායක වේ.





# වෘත්තීය උපාධියක් ලබා ගැනීමේ පියවර

වසන්ත සමයේ අධ්‍යයන වාරයට ඇතුළත් වන හෝ තුන්වන අධ්‍යයන වාරයේ තම ප්‍රධාන ව්‍යාපෘතිය ආරම්භ කරන සිසුන් සඳහා

### 1 පළමු වසර සිසුන් — පළමු සමාසිකය

**මූලික දැනුම පිළිබඳ තීව්‍ර අධ්‍යයනය**

- පාසලට ඇතුලත් වීමේ උත්සවය / නවක ශිෂ්‍ය දිශානතිය / අධ්‍යයන උපදේශනය
- වසන්ත සමයේ අඛණ්ඩ විභාග
- ගිම්හාන සමයේ තීව්‍ර ඉගැන්වීම් පන්ති

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- නවක සිසුන් පිළිගැනීමේ උත්සවය
- විදේශීය හවුල්කාර විශ්ව විද්‍යාලයක සීමාවාසික පුහුණුව (ආගන්තුක කථිකාචාර්ය)
- පුද්ගලික සමාගමක ව්‍යාපාර සීමාවාසික පුහුණුව
- ප්‍රසංග
- වෘත්තීය උපදේශනය


පාසලට ඇතුලත් වීමේ උත්සවය

### 2 පළමු වසර සිසුන් — දෙවන සමාසිකය

**ඉහළ විශේෂඥ දැනුමක් ලබා ගැනීම**
**ඔබේ ප්‍රධාන ව්‍යාපෘතිය සකස් කිරීම ආරම්භ කිරීම**

- ප්‍රධාන ව්‍යාපෘතිය සඳහා සූදානම් වීම ආරම්භ කිරීම
- සරත් සමයේ අඛණ්ඩ විභාග
- වසන්ත සමයේ තීව්‍ර පන්ති
- කීර්තිමත් ජපන් හා විදේශීය උපදේශකයින්ගේ විශේෂ දේශන

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- වෘත්තීය මාර්ගෝපදේශනය
- විවිධ රැකියා-සෙවුම් ආධාරක පන්ති
- නොවැම්බර් මස උත්සවය


ප්‍රධාන ව්‍යාපෘතියක් සඳහා සූදානම් වීමට උපදෙස්

### 3 දෙවන වසර සිසුන් — තෙවන සමාසිකය

**ප්‍රායෝගික හා වඩාත් උසස් විෂයයන් අධ්‍යයනය කිරීම**
**ඔබේ ප්‍රධාන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම**

- ඔබේ ප්‍රධාන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම
- වසන්ත සමයේ අඛණ්ඩ විභාග
- ගිම්හාන සමයේ තීව්‍ර ඉගැන්වුම් පන්ති

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- පුද්ගලික සමාගම් විසින් සරසවිය තුළ කෙරෙන ඉදිරිපත් කිරීම්
- විවිධ සුදුසුකම් ලබා ගැනීම
- විදේශීය හවුල්කාර විශ්ව විද්‍යාලයක සීමාවාසික පුහුණුව (ආගන්තුක කථිකාචාර්ය)
- ප්‍රසංග
- විවිධ තරඟ වලට සහභාගී වීම


ගිම්හාන දැඩි පන්ති.
තේපැන් හෝරාව හරහා ගුරුවරුන් සමඟ ගැඹුරු දැනුම් හුවමාරුව.

### 4 දෙවන වසර සිසුන් — සිව්වන සමාසිකය

**විශේෂීකරණය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් සහ අධ්‍යයනය**
**ප්‍රධාන ව්‍යාපෘතිය සඳහා තේමාව සම්පූර්ණ කිරීම**

- වාචික ඉදිරිපත් කිරීමක් හරහා කෙරෙන ප්‍රධාන ව්‍යාපෘතිය පිළිබඳ සම්මුඛ සාකච්ඡාව
- කීර්තිමත් ජපන් හා විදේශීය උපදේශකයින්ගේ විශේෂ දේශන
- KCG සම්මාන (KCG සහ KCGI හි වඩාත්ම කැපී පෙනෙන ව්‍යාපෘති නිවේදනය කිරීම)
- උපාධි ප්‍රදානෝත්සවය

**ඉසුරුමත් ශිෂ්‍ය ජීවිතයක්**

- උපාධිය නිම කිරීමේ සැමරුම්



KCG සම්මාන

මහාචාර්ය 武田 康廣

# යෂුහිරෝ ටැකීඩා

## Yasuhiro Takeda



Gainax හි සමාරම්භක සාමාජිකයින්
CEO, Gainax Kyoto Co., Ltd.

ජපානයේ විද්‍යා ප්‍රබන්ධ සහ ෆැන්ටසි ලේඛකයින්ගේ (SFWJ) සහ ජපානයේ අභ්‍යවකාශ කතුවරුන්ගේ සමාජයේ (SACJ) සාමාජික

**සමාගම ආරම්භයේ සිටම මහාචාර්ය යසුහිරෝ ටකේඩා ජපානයේ වඩාත්ම ප්‍රිය කරන සජීවිකරණ විශේෂාංග බොහොමයක නිෂ්පාදකයා වන Gainax Co., Ltd. හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇත. චිත්‍රාගාරයේ ජනප්‍රිය කෘතීන් අතර Nadia: The Secret of Blue Water, Gekijoban Tengen Toppa Gurren Lagann සහ Wish Upon the Pleiades පවතී. මහාචාර්ය ටකේඩා දැනට තෝකියෝ නුවර පිහිටුවා ඇති සමාගමේ සජීවිකරණ සැලසුම් සහ නිෂ්පාදන චිත්‍රාගාරය වන Gainax Kyoto හි නියෝජිත අධ්‍යක්ෂ ලෙස සේවය කරයි.**

### ජපන් සජීවීකරණ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය

තොරතුරු තාක්ෂණ මංගා කාටූන් සහ ඇනිමේ සංකේන්ද්‍රණ ක්ෂේත්‍රය තුළ, නව වෙළඳපල සහ ව්‍යාපාර ආකෘති නිර්මාණය කිරීමේ කටයුතු වලදී KCGI මෙම සංයෝජන භාවිතා කරයි. සජීවිකරණ සැලසුම්කරණය, නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා මහාචාර්ය යසුහිරෝ ටකෙඩා විසින් උගන්වනු ලැබේ. මහාචාර්ය ටකෙඩා යනු Nadia, the Secret of Blue Water සහ Tengen Toppa Gurren Lagann වැනි කෘති සඳහා කීර්තියක් උසුලන චිත්‍රාගාරයක් වන Gainax හි සමාරම්භකයෙකි. Gainax හි සජීවීකරණ නිෂ්පාදකයෙකු ලෙස මහාචාර්ය ටකෙඩා







Neon Genesis Evangelion: Iron Maiden වැනි ක්‍රීඩා සහ Aim for the Top 2! Diebuster, Magical Shopping Arcade Abenobashi සහ Hanamaru Kindergarten වැනි මාංගා ඇතුළු බොහෝ සජීවිකරණ කෘතිවලට සම්බන්ධ වී ඇත. Gainax සමඟ සහයෝගීත්වයෙන්, මහාචාර්ය ටකෙඩා විසින් KCG සමූහයේ 50 වන සංවත්සරය සමරමින් වෙළඳ දැන්වීමක් නිෂ්පාදනය කරන ලදී.

### ව්‍යාපාරක් යනු “ආදායම කොපමණ ද?” යන්න පිළිබඳ ප්‍රශ්නයකි

**—සජීවිකරණය ව්‍යාපාරයක් කිරීමේදී ඔබට කිව හැකි මූලිකපදය කුමක්ද?**

මේ දක්වා මාගේ ප්‍රධාන කාර්යය වී ඇත්තේ Gainax හි සජීවිකරණ කෘති සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමයි. විකාශන වාර නිර්ණය කිරීමට සහ නිශ්චිත අයවැයක් සහතික කිරීම සඳහා මම සජීවිකරණ යෝජනා නිර්මාණය කර සමාගම් සමඟ සාකච්ඡා පවත්වමි. නිෂ්පාදනයක් සිදු කළ පසු, එය කොතරම් ආදායමක් උපයාවිදැයි සිතීම වැදගත්. මම හිතන්නේ ඔයාට ඒක ව්‍යාපාරයක් කියලා කියන්න පුළුවන් කියලා.

**—සජීවිකරණය හා සම්බන්ධ වීමෙන් ඔබට ලැබුණු දේ අපට කියන්න.**

මා සැලසුම් කර ඇති කෘති අතර Wish Upon the Pleiades සහ Tengen Toppa Gurren Lagann ඇතුළත් වේ. මා දැන් නව සජීවිකරණ සැලසුම් ගණනාවක නිරත වෙමින් සිටිමි. නමුත් මම මේ ආකාරයේ රැකියාවක් කිරීමට සැලසුම් කළේ නැහැ. පාසලේදී මම සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක් ඉගෙනගත්තේ. මම ඒක දැනගන්න කලින්, පාසැලේදී කරන ලද සිද්ධීන් සහ ස්වාධීන නිපැයුම් මගේ රැකියාව බවට පත් වුණා. ඒ නිසා මම තවමත් රසවත් දේවල් කරනවා වගේ දැනෙනවා. “විනෝදජනක හා රසවත් දේවලින් මූලික පියවර ගන්න” යන මගේ ආධුනික වසර වලින් ගත් අදහස කවදාවත් අමතක නොකරන්න මම තීරණය කළා.

**—කරුණාකර සජීවිකරණය ඉගෙන ගන්න කැමති සිසුන් සඳහා අපට පණිවිඩයක් දෙන්න.**

සැළසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා විශාල ශක්තියක් අවශ්‍යයි. මීට අමතරව අරමුදල් එක්රැස් කිරීම හා සජීවිකරණ නිෂ්පාදනය කිරීම වගකීම් සහගතයි. ඔබේ සේවය දෙස බලා සිටින්නන්, විවේචන, අරමුදල් එක්රැස් කිරීම සහ ඔබේ සමාගමේ නම කැතවීම නිෂ්පාදන කාර්යට ඇතුළත් වේ. එතරම් දුර සිතීම සැලසුම්කරණයේ අවසානයයි. ඔබ නිෂ්පාදනයක් නිෂ්පාදනය කරන තාක් දුරට ඔබ විශ්වාස කරන්නේ ස්වයං තෘප්තිය පමණි. නිෂ්පාදනයක් සම්පූර්ණ වන්නේ එය විවේචනය කළ විට පමණි. විවේචනය ඔබේ නිෂ්පාදනයෙන් පමණක් නොව, ඔබ ඔබේ ක්‍රියාවන් හා වචන ඇතුළු ඔබ ලෝකයට මුදා හරින සෑම දෙයක්ම ඉලක්ක කළ හැකිය. සජීවිකරණය ඉගෙනීම පිළිබඳ උනන්දුවක් දක්වන ශිෂ්‍යයන්ගෙන් මන් ඉල්ලා සිටින්නේ ලබන විවේචන වලට මුහුණ දීමට අවශ්‍ය ආත්ම ශක්තිය සමග අධ්‍යනය කිරිම සිදුකරන්න යන්නයි.



KCG සමූහයේ 50 වන සංවත්සර වෙළඳ දැන්වීම
(https://www.kcg.ac.jp/kyocotan/cm/)





මහාචාර්ය 伊藤 博之

# හිරෝයුකි අයිතෝ

## Hiroyuki Itoh



නියෝජිත අධ්‍යක්ෂ. ක්‍රිප්ටන් ෆියුච මීඩියා,
හට්සුනි මිකි නිෂ්පාදක

**“මිරායි කරා කිටා හජිමෙටි නො ඔටෝ” (“අනාගතයෙන් පළමු හඬ”) යන ජපන් වාක්‍යයන් උද්ගතවන නමක් ඇති, හට්සුනි මිකි යනු තාත්වික ප්‍රතිමාවක් වන අතර පරිශීලකයෙක් භාවගීතය සහ ස්වර රචනයක් පරිගණකයට ඇතුළත් කළ විට ඔහු කෘතීම හඬකින් සින්දුව ගායනා කරයි. හට්සුනි මිකි ජපානයේ පමණක් නොව විදේශයන්හි පවා සජීව ප්‍රසංග පවත්වා ඇති අතර රසිකයින් සමූහයක හදවත තුළ රැඳේ. මෙම සංවේදනයේ හේතුව වන හට්සුනි මිකි කෘතීම හඬ නිර්මාණය කළ සමාගම වන, ක්‍රිප්ටන් ෆියුච මීඩියා හි නියෝජිත අධ්‍යක්ෂ හිරෝයුකි අයිටෝ මහාචාර්යවරයෙක් ලෙස KCGI හා එකතු වී ඇත. පරිගණකගත හඬවල් නිෂ්පාදනය කරන මෘදුකාංග අඛණ්ඩව සංවර්ධනය කරන මහාචාර්ය අයිටෝ අනාගතයේ තොරතුරු තාක්ෂණ කර්මාන්තය මෙහෙයවන තරුණ පරපුරට පහත සඳහන් පණිවිඩය ලබා දේ. “අපි අතරමඟ පමණක් සිටින තොරතුරු විප්ලවයේ දේශ සීමාව සීමාවක් නොමැතිව විශාල වන අතර ඔබගේ අනාගත දෘෂ්ටි කෝණ සීමාවක් නොමැතිව ඔබට පෙර විසිරී යයි. මෙම සංකල්පය දැඩිව මනසේ තබාගෙන ඔබගේ අධ්‍යයන සඳහා කැපවන මෙන් මම ඉල්ලා සිටිමී”.**

ක්‍රිප්ටන් ෆියුච මීඩියා යනු වීඩියෝ ක්‍රීඩා හෝ සක්‍රීයකරණ සමාගමක් නොවේ. අපි සංගීතය සකස් කිරීමට මැදිහත්වුවත්, එය පටිගත සමාගමක්ද නොවේ. එයට හේතුව අපි ව්‍යාපාරයක් තුළට පරිගණක සංගීත විනෝදාංශයක් සකස් කිරීමයි. මම අප ගැන හිතන්නේ අපි “ශබ්දය අලෙවිකරන්නෙක්” ලෙසයි. හට්සුනි මිකි 2007 අගෝස්තුවල අලෙවිය සඳහා පළමුවෙන් පිරිනමන ලද නමුත් නිර්මාණාත්මක කාර්යයක ජනතාව සම්බන්ධ කිරිම සඳහා මෙම මෘදුකාංගය අවස්ථාවක් බවට පත් වූ බව මම විශ්වාස කරමි.

මනුෂ්‍යත්වය එහි අතීතය තුළ පරිවර්තන තුනකට මුහුණ දී ඇතිබව කියනු ලැබේ. පළමුවැන්න වූයේ කෘෂිකාර්මික විප්ලවයයි. මෙම විප්ලවය හේතු කොට ගෙන, දඩයම්කිරීම මත ඔවුන්ගේ විශ්වාසය නිසා ඔබමොබ යාමට බලකරන ලද මනුෂ්‍ය වර්ගයා ක්‍රමානුකූලව ආහාර නිෂ්පාදනය කළ අතර, ඒවා ගබඩා කිරීම කරා පැමිණියේය. මෙසේ ස්ථිර වාසස්ථානවල ජීවත්වීම ආරම්භ විය. මේ නිසා, සමාජ සහ රාජ්‍ය සකස් විය. එමෙන්ම ධනයේ විෂමතාවන් නිර්මාණය විය. ආර්ථිකයන්ගේ සංවර්ධනය යුද්ධයට හේතුවක් බවට පත් වූ බව කියනු ලැබේ.

දෙවන විප්ලවය වූයේ කාර්මික විප්ලවයයි. ක්‍රියාවෙහි යොදන බලය සොයා ගනු ලැබූ අතර එක සමාන අයිතම කාර්යක්ෂමව නිර්මාණය කිරීමට හැකිවීම වැනි නව්‍යකරණයන්ගේ වර්ධනය බහු නිෂ්පාදනයට සහ බහු පරිභෝජනයට



Art by KEI ©CFM

උපත ලබාදුන්හ මෙය විශාල පරිමාණයේ ධනය ඇතිකිරීමට සහය වෙමින් වෙළෙඳාම සහ වාණිජය ඉක්මණින් ඉදිරියට ගෙන යන ලදී. මෙම විප්ලවය “ජනගහන ප්‍රසාරණය”. ට හේතුවක් විය. කාර්මික විප්ලවයට පෙර ඉහළ උපත් සහ ඉහළ මරණ අනුපාතයක් සහිත යුගය තුළ, මනුෂ්‍ය ජනගහනය සැබැවින්ම ස්ථිරව තිබුනු අතර, සමාජය තුල ධනයේ උච්ඡාවචන යම් තරමකට තිබූ නමුත් කාර්මික විප්ලවය සමඟ මනුෂ්‍ය ජනගහනය වේගයෙන් වැඩිවිය.

තෙවන විප්ලවය වන්නේ අන්තර්ජාලය විසින් නියෝජනය කරන තොරතුරු තාක්ෂණයේ වටිනාකම විසින් ඇතිකළ තොරතුරු විප්ලවයයි. අන්තර්ජාලයට පෙර, තොරතුරු සම්ප්‍රේෂකයින් සීමා වූ අතර, එය ඒකාකාධිකාරි විය. තොරතුරු මූලාශ්‍රයන්ට පුවත්පත් සමාගම්, රූපවාහිණී සහ ගුවන්විදුලි මධ්‍යස්ථාන සහ ප්‍රකාශන සමාගම් වැනි මාධ්‍ය ආයතන ඇතුළත් නමුත් මෙම කණ්ඩායම් තොරතුරු බෙදා හැරීමේදී, පහසුකම් සහ මනුෂ්‍ය බලය අනුව සැලකියයුතු පිරිවැයක් ඒ සමග පවතී. තවද, මෙම කාලයේදී තොරතුරු ප්‍රමාණයෙන් අඩුවන අතර ඒකදිශාගත වේ. එසේවුවත්, අන්තර්ජාලයේ පැමිණීම තොරතුරුවල මෙම විප්ලවය ඇති කරන ලදී. තොරතුරු බෙදා හරින ආකාරය සැලකිය යුතු ලෙසින් වෙනස් කර ඇත.

දැන් අන්තර්ජාලය අතිශයින්ම සමීපව පවතී, අපේ අත්වල අල්ල මත, අපේ මේසවල, සහ අපෙ සාක්කුවලට රිංගා ඇත. ප්‍රවෘත්ති, චිත්‍රපටි සහ සංගීතය ලෙස ඩිජිටල්කරණය කළ හැකි තොරතුරු, සම්පූර්ණයෙන්ම තොරතුරු, පහසුවෙන් අන්තර්ජාලය හරහා සම්ප්රේෂණය කර ගබඩා කර තැබිය හැකිය. ජීවිතය සහ රැකියාව අතිශයින්ම පහසු, විනෝදජනක සහ සුවපහසු බවට පත් වී තිබේ; ක්ෂණිකව ඔබට ඔබේ ප්රියතම වීඩියෝ සහ විකාශන මාධ්‍යයන් කැඳවීමට සහ බැලීමට හැකිය. මීට අමතරව, මෙම තොරතුරු මඟින් ඕනෑම කෙනෙකුට පහසුවෙන්ම සහ ක්ෂණිකව ෆේස්බුක්, ට්විටර් සහ බ්ලොග් ඔස්සේ පුද්ගලික පුවත්වල ඉතා කුඩා දෙවල් ඇතුළුව ඔවුන් ගැන තොරතුරු පහසුවෙන්ම සහ ක්ෂණිකව බෙදා ගැනීමට හැකි වේ.

එසේවුවත් තොරතුරු විප්ලවය හේතු කොට ගෙන සිදුවන වෙනස්වීම්වලට පූර්විකාව අපි තවමත් අත්විඳිමින් සිටින බව මම විශ්වාස කරමි. කෘෂිකාර්මික සහ කාර්මික විප්ලව මනුෂ්‍ය වර්ගයා ජීවත් වූ ආකාරය බරපතල ලෙස වෙනස් කරන ලදී. තොරතුරු විප්ලවයෙන් ඇතිකළ වෙනස්වීම මෙතෙක් ඒ මට්ටමට පැමිණ නැත. මෙය හුදෙක් පරිවර්තනීය කාලපරිච්ඡේදයක් වන අතර සැබෑ වෙනස්වීම් ආරම්භ වීමට නියමිතය. මෙතැන් සිට වසර 20 සිට 30ක් තුල ජනතාවගේ ජීවන රටාවට සහ ලෝකය තුළ විශාල වෙනස්වීම් අපිට දැකිය හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි. එසේවුවත්, මම මෙවැනි වෙනස්වීම් කෙසේවේද? මේවා වෙනස්වන්නේ කෙසේද සහ එය අපට සහ ඉදිරි පරම්පරාව භාරගන්නා තරුණ පරපුරට එය බලපාන ආකාරය. මම නොදනිමි.

## අනාගත ඊ-ව්‍යාපාරික නායකයින් පුහුණු කිරීම

මහාචාර්ය 高 弘昇

# කෝ, හොං සෙඔන්ග් Ko, Hong Seung



සීමාසහිත සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් සමාගම, තොරතුරු උපායමාර්ග (CIO) පිළිබඳ හිටපු කළමනාකරු, උපායමාර්ග සැලසුම් කාර්යාලය.

නිපොන් ව්‍යවහාරික තොරතුරු සංගමයේ (NAIS) නියෝජිත අධ්‍යක්ෂ

**මහාචාර්ය හොං සෙඔන්ග් කෝ දකුණු කොරියාවේ උපත ලැබූ අතර, දැවැන්ත දකුණු කොරියානු විදුලි උපකරණ සහ ඉලෙක්ට්‍රොනික උපාංග නිෂ්පාදකයෙකු වන සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් හි හිටපු තොරතුරු උපායමාර්ග කළමනාකරු වශයෙන් කටයුතු කළ අතර අන්තර්ජාල-මූලික ආයතනික මූලෝපාය වන CALS (මූලික වශයෙන් B2B සංකල්පිකව පදනම් වූ), සහ සාමාන්‍ය පාරිභෝගිකයින් සඳහා ඊ-වාණිජ්‍යය හඳුන්වා දීමට කටයුතු කළේය. එමෙන්ම ඔහු එම සමාගමේ තොරතුරුකරණය හා ලාභදායිතාවය වෙනුවෙන් විශාල දායකත්වයක්ද ලබා දුන්නේය. ඊ-ව්‍යාපාරික ලෝකය තුළ සිදුවන ශීඝ්‍ර දියුණුවත් සමඟ ඒ සඳහා අවශ්‍ය වන මානව කුසලතාවන් පිළිබඳව මහාචාර්ය හොං දීර්ඝ වශයෙන් කථා කළේය.**

### ඊ-ව්‍යාපාර සඳහා උපාය මාර්ගයක් අවශ්‍ය වේ

**—ඊ-ව්‍යාපාර ලෝකය ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින බව පෙනෙන්නට තිබේ. අන්තර්ජාලයේ එම පුළුල් ව්‍යාප්තියත් සමඟ ව්‍යාපාරත් වෙනස් වී තිබේද?**

90 දශකයේ මැද භාගයේදී මා තොරතුරු උපායමාර්ග පිළිබඳ කළමනාකරු වශයෙන් පත්වූ පසුව, සැම්සුන් සමාගම විසින් දේශීයව සහ ජාත්‍යන්තර ගනුදෙනුකරුවන් සඳහා තම වෙබ් අඩවිය එළිදක්වන ලදී. එකල කිසිවෙකු විසින් අන්තර්ජාලය අලෙවිකරණය සඳහා ප්‍රබල මෙවලමක් ලෙස නොසැලකූ අතර, එම ක්‍රියාව පෙනී ගියේ හුදෙක්ම සමාගමෙහි සන්නාම පිළිගැනීම වැඩි දියුණු කිරීමේ ක්‍රමයක් ලෙස පමණි. කෙසේ වෙතත්, අපි වෙබ් අඩවිය විවෘත කළ විට, ලොවපුරා පාරිභෝගිකයින්ගෙන් නිෂ්පාදන පසු රැකවරණ සේවා, පැමිණිලි ආදිය පිළිබඳව විමසීමට දිනකට විද්‍යුත් තැපැල් 200 ක් පමණ අප වෙත ලැබුණි. අපගේ වෙබ් අඩවිය අලෙවිකරණ මෙවලමක් ලෙස භාවිතා කළ හැකිය යන හැඟීම මා තුළ ඇති වූයේ ඒ අවස්ථාවේදී ය.

ඉන් පසුව ඇණවුම් කිරීමේ පද්ධති සහ මූල්‍ය කොටස් වෙළඳාම වැනි අන්තර්ජාලය භාවිතා කළ ව්‍යාපාර වර්ධනය වීම සිදුවිය. එහෙත්, අන්තර්ජාලය තුළ භාවිතය සඳහා පද්ධතියක් නිර්මාණය කර එළිදැක්වීම මගින් විකුණුම්වල විශාල පරිමාණයේ වර්ධනයක් දැකගැනීමට අපට නොහැකි විය. දකුණු කොරියාවේ තොරතුරු තාක්ෂණය තුල අසාර්ථක ඉහළ නැඟීමක් සිදුවූ අතර, එයට හේතුව වූයේ හුදෙක්ම අන්තර්ජාලය භාවිතය හරහා ඔවුන්ගේ ව්‍යාපාර ඉහළ මට්ටමකට පත්වනු ඇතැයි ඔවුන් සිතූ බැවිණි. ඔවුන් සිතුවේ ඔවුන් අන්තර්ජාලය මත පදනම් සාප්පු සංකීර්ණයක් සාදා, විකිණීම සඳහා නිෂ්පාදන ඉදිරිපත් කර ලොව පුරා සිටින ගනුදෙනුකරුවන් සම්බන්ධ කරගතහොත් වාණිජ කටයුතු සාර්ථකව සිදු කරගත හැකි වනු ඇති බවයි. නමුත් වසර කිහිපයක් තුළ එම අන්තර්ජාල සාප්පු සංකීර්ණ සියල්ලම පාහේ අතුරුදහන් විය. අවසානයේදී, ඔවුන් නොදැන සිටි දෙය නම් අන්තර්ජාලය හුදෙක්ම එක් මෙවලමක් පමණක් බවයි. තවද, ඔවුන් බොහෝ විට උපාය මාර්ගයක් නොතිබුණි. ඔබ අන්තර්ජාලයේ කොපමණ නිෂ්පාදන ප්‍රදර්ශනය කර තිබුණද, ඒවා හුදෙක් තිරයක් මත පෙන්වන නිෂ්පාදන පමණක්ම විය. එයට හේතුව වූයේ බොහෝ අවස්ථාවන්හිදී ගනුදෙනුකරුවන් තම නිෂ්පාදන මිලදී ගනු ලැබුවේ ඒවා දැතින් ස්පර්ශ කර පරීක්ෂා කර බැලීමෙන් පසුව වීමයි.

### ජපන් සමාගම් වල අසාර්ථක වීම සහ මානව කුසලතා හිඟකම

**—මෙම දැවැන්ත වෙනස්කම් මධ්‍යයේ, වර්තමාන ගෝලීය ව්‍යාපාරික වටපිටාව ඔබ දකින්නේ කෙසේද?**

අවාසනාවකට මෙන් අනෙකුත් අතරෙහි ජපානයේ සහ දකුණු කොරියාවේ අනෙකුත් වර්තමාන තත්ත්වය නම්, සමාගම් අලෙවිය ඉහළ නංවාගැනීම සඳහා අන්තර්ජාලය භාවිතා කිරීම පිළිබඳ උපාය මාර්ග මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය මානව කුසලතා හිඟයක් පවතී. එසේම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැකසීම සඳහා සමාගම් විශාල ආයෝජනයක් ද සිදු කරන බැවින් මෙම තත්ත්වය ඔවුන්ට නොනවතින ගැටළු සමුදායක් ඇති කරයි.

සරලවම කිවහොත් සමාගම්වලට අවශ්‍ය වන්නේ ඊ-ව්‍යාපාර මූලෝපායන් නිර්මාණය කිරීමට උපකාරී වන මානව කුසලතා වේ. ප්‍රධාන වශයෙන්, ඔවුන් කළ යුත්තේ අලෙවිකරණය සහ කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ සම්පත් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ශක්‍යතාව ඇතිකර ගැනීමයි.

ජපන් හා දකුණු කොරියානු සමාගම්වල සේවකයින් අතර ඇත්තේ අලෙවිකරණය පිළිබඳ දුර්වල සවිඥානකත්වයක් බවට සැලකේ. මෙයට හේතුව වැටුප පිළිබඳ ඔවුන්ගේ චින්තනයේ පදනම වන්නේ, ඔවුන්ගේ එදිනෙදා වැඩ සඳහා උපයන වැටුප හරහා ලැබාගත හැකි ලාභය සාධාරණව බෙදී යාම වීමයි. එහෙත් එක්සත් ජනපදයේ තත්ත්වය මීට වෙනස් වේ. කොපමණ වැඩ ප්‍රමාණයක් සිදු කරනවාද යන්න සහ ඔබේ රැකියාවෙන් ඇත්තෙන්ම සමාගමට කොපමණ දායකත්වයක් ලැබේද යන්න පිළිබඳ නිරන්තර, දැඩි පීඩනයක් පවතී. එක්සත් ජනපද සමාගම්වල අලෙවිකරණය සඳහා පමණක්ම වෙන් කරන ලද දෙපාර්තමේන්තුවක් නොමැති තරම් වේ. සියලුම සේවකයින් දැනටමත් මෙම මානසිකත්වයෙන් යුක්ත නිසා ඇති මෙම දෙපාර්තමේන්තු වල අවශ්‍යතාවයක් නොදැනේ. ආර්ථිකය කෙතරම් දුෂ්කර තත්ත්වයකට හැරුණත් ලාභදායිතාව ඉහළ නංවාගන්නේ කෙසේද යන්න ගැන සිතා බැලීමට එක්සත් ජනපදයේ සමාගම් මානසිකත්වය සැකසී ඇති බැවින් ඔවුන්ට සැම විටම ඉදිරියට යාමට හැකියාවක් ඇත. ජපාන සහ දකුණු කොරියානු සමාගම් වලට ඔවුන් සමඟ පැහීම දුෂ්කර වන්නේ මේ නිසා ය. ජපානයේ සහ දකුණු කොරියාවේ විශාල සමාගම් ඇතුළුව අලෙවිකරණය යනු විකුණුම්කරණය, වෙළඳ ප්‍රචාරණය සහ සන්නාමකරණය ලෙස වරදවා වටහාගත් බොහෝ සමාගම් දක්නට ලැබේ. ව්‍යාපාර සඳහා අන්තර්ජාලය භාවිතයේදී තොරතුරු තාක්ෂණ සමාගම් ලෙස සාර්ථකත්වයට පත්වී ඇත්තේ දැනට එක්සත් ජනපද සමාගම් පමණක් වීමට හේතුව එයයි. ජපානයේ සහ දකුණු කොරියාවේ දේශීය වශයෙන් එවැනි පිළිගැනීමක් ලබා ඇති සමාගම් ඇති නමුත්, ඔවුන් සිදුකර ඇත්තේ යටිතල පහසුකම්වල දියුණුව හේතුවෙන් ඇති වූ ඊ-ව්‍යාපාර රැල්ල ඔස්සේ ගොස් සුදුවක ආකාරයේ අනුමානයකින් සාර්ථකත්වයට පත්වීමතත් වේ. ඊ-ව්‍යාපාර සම්බන්ධයෙන් සාර්ථකත්වයට පත් වූ යුරෝපීය සමාගම් ද දක්නට නොලැබේ. මෙයට හේතුව අන්තර්ජාල ව්‍යාප්තියේ ප්‍රධාන ප්‍රමාදයන් වේ.

### ආසියාව තුළ ආධිපත්‍යය දරන විශේෂිත උපාධි පාසලක් බවට පත්වීම

**—මෙම ව්‍යාපාරික පරිසරය තුළ, KCGI විසින් සැකසිය යුත්තේ කුමන ආකාරයේ විශේෂාංගයන් ද; අප අරමුණු කළ යුත්තේ කුමක් සඳහා ද?**

තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥ උපාධිධාරී පාසල් එතරම් ප්‍රමාණයක් නොමැත. එසේම, KCGI පැවත එන්නේ කියෝතෝ කම්පියුටර් ගකුඉන් වෙතිනි. මෙය අප සතු විශාලතම වාසියයි. එපමණක් නොව, KCGI හි විශේෂඥ කුසලතා සහ දැනුමින් පිරිපුන් සහ ප්‍රධාන සමාගම්වල සේවය කර ඇති ගුරුවරුන් විශාල ප්‍රමාණයක් සිටී. මගේ දේශනවලදී, මම මගේ සාර්ථකත්වය ගැන පමණක් නොව, මගේ අසාර්ථකත්වයන් ගැනද කතා කිරීමට උත්සාහ කරමි. එයට හේතුව වන්නේ අසාර්ථක වීම් වලින් බොහෝ විට සාර්ථකත්වයන්ටත් වඩා බොහෝ දේ උගන්වන බැවිනි. මා මේ යුගයට සැබවින්ම අවශ්‍යව පවතින මානව කුසලතා පුහුණු කරන්නේ මේ අයුරිනි.

වෙනත් රටවලද විශ්ව විද්‍යාල සම්බන්ධ අධ්‍යාපන ජාලය වසරින් වසර පුළුල් වේ. මෙම ක්ෂේත්‍රය ජපානයට පමණක් සීමා වූවක් නොවේ. KCGI ආසියාවේ සහ ගෝලීය මට්ටමේ වැඩ කිරීමේ හැකියාව ඇති මානව කුසලතා පුහුණු කිරීමට දායක විය හැකි විශේෂිත උපාධි පාසලක් වනු දැකීමට මා කැමතිය.





## පූර්ව පූර්වකල්පිත හැඟීම්වලට වහල් නොවන්න. ඔබ ඔබම වී ඔබේ සිහින හඹා යන්න

මහාචාර්ය 土持 ゲーリー 法一

# ගැරී හොයිචි සුචිමොචි Gary Hoichi Tsuchimochi



පීඨ සංවර්ධනය, සංසන්දනාත්මක අධ්‍යාපනික අධ්‍යයන, පශ්චාත් යුද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉතිහාසය සහ සංස්කෘතික අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ

**මහාචාර්ය සුචිමොචි පවසන්නේ ඔහුගේ ඉගැන්වීමේ දර්ශනය "KCGI හි සිසුන් සමග ඔවුන්ගේ පාඩම් නිර්මාණය කිරීමට කටයුතු කිරීම" බව යි. ඔහු KCGI සිසුන්ගෙන් ඉල්ලා සිටින්නේ ඉගැන්වීම් කළඹ සහ ඉගෙනුම් කළඹ යන තේමාවන් ගවේෂණය කරමින්, ශිෂ්‍ය කේන්ද්‍රීය පන්ති කාමර නිර්මාණය කිරීමට ඉගෙනුම් ප්‍රජාවන් පිහිටුවා ගන්නා ලෙස යි.**

### අධ්‍යාපනයේ මුල් අරමුණ වන්නේ සිසුන්ගේ ඉගෙනීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කිරීම යි.

**—ඔබේ ඉගැන්වීම් චින්තනයේ එක් එක් අයිතමය ඔබට පැහැදිලි කළ හැකි ද?**

**අපි පූර්වකල්පිත හැඟීම්වලට වහල් වීමෙන් වැළකී සිටිය යුත්තේ ඇයි?** මන්ද අපි එසේ කරන විට අපගේ නිදහස් නම්‍යශීලී චින්තන හැකියාව ගිලිහී යයි. KCGI යනු අපි AI ඇතුළු ප්‍රමුඛ පෙළේ තොරතුරු තාක්ෂණයන් අධ්‍යයනය කරන ස්ථානයක් වන අතර මෙම ක්ෂේත්‍ර නිර්මාණශීලීත්වයේ අවශ්‍යතාව මතු කරයි.

**ඉගෙනීම (ගකුෂු) සහ පාණ්ඩිත්‍යය (ගකුමොන්) අතර වෙනස කුමක්ද?** මෑතක් වනතුරුම පාසල්වල අවධානය යොමු කරන ලද්දේ ගුරුවරයා විසින් ඉගැන්වූ දේවල් අක්‍රියව අධ්‍යයනය කිරීමට යි. මෙය ඉගෙන ගැනීම යි. මේ ආකාරයේ අධ්‍යයනයෙන් අවධානය යොමු කරන්නේ යෙදවුමට යි. උපාධි පාසලක ස්වභාවය මීට වඩා වෙනස් වේ. එහි කිසිවෙකු ඔබට උගන්වන්නේ නැත: එහි ඇත්තේ ශිෂ්‍යයා තමා විසින්ම සිදු කරන විමර්ශනයකි. "පාණ්ඩිත්‍යය" යන වචනයේ මුල් තේරුම එය යි. රැකියාවෙහි නියුතු වැඩිහිටියෙකුගේ මූලික ලක්ෂණයක් වන්නේ විමසා ඉගෙන ගැනීම යි. මෙම ආකාරයේ අධ්‍යයනයෙන් අවධානය යොමු කරන්නේ ප්‍රතිදානයට යි.

**ගැටළු ගවේෂණය පාදක කොටගත් ඉගෙනීම යනු කුමක්ද?** සමාජය ප්‍රගමනය කරා යාමේ දී ගැටළු ගවේෂණය පාදක කොටගත් ඉගෙනීමට ඇති ඉල්ලුම වේගයෙන් ඉහළ යයි. අලුත් දේවල් නිර්මාණය කිරීමේ දී ගවේෂණය අත්‍යවශ්‍ය කරුණකි. එමෙන්ම ගවේෂණය සඳහා විමර්ශනය අත්‍යවශ්‍ය වේ. නමුත් විමර්ශනයෙන් පමණක් අපට යා හැකි දුර සීමිත වේ. සිසුන් සමූහයක් ලෙස නොව කණ්ඩායමක් ලෙස ඉගෙනීම කළ යුතු ය. කණ්ඩායම් පාදක ඉගෙනීම (TBL) නම් වන මෙම ප්‍රවේශය, ගැටළු පාදක ඉගෙනීම (PBL) වෙනුවට ව්‍යාප්ත වෙමින් පවතී.

**ඉගෙනුම් පරිසරයක් යනු කුමක්ද?** යමෙක් සිදු කරන අධ්‍යයන කටයුත්ත ඉගෙනුම් පරිසරය මත රඳා පවතී. ගුරුවරයෙකුගේ කාර්යය ඉගැන්වීම නොවේ. ඒ වෙනුවට ගුරුවරයෙකු පහසුකම් සලසන්නෙකු විය යුතු ය. ජපන් අධ්‍යාපන ක්‍රමය සහ ඇමරිකානු ක්‍රමය අතර වෙනස මෙය යි. පළමුවැන්න ජපන් ප්‍රවේශය වන අතර දෙවැන්න ඇමරිකානු ප්‍රවේශය යි.

**ලිබරල් කලාවන් යනු මොනවා ද?** ලිබරල් කලාවන් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ හරය යි. සාම්ප්‍රදායිකව ලිබරල් කලාව යනු මානව ශාස්ත්‍ර සමග සම්බන්ධිත එකකි. නමුත් වර්තමානයේ අපි අවධාරණය කරන්නේ ලිබරල් කලාවන් විද්‍යාවන්හිදී ද ඉතා වැදගත් බව යි. නිදසුනක් ලෙස, තෝකියෝ තාක්ෂණ ආයතනයේ නොබෝදා පිහිටුවනු ලැබූ ලිබරල් කලා මධ්‍යස්ථානය සලකන්න. හිටපු NHK වාර්තාකරුවකු වන අකිරා ඉකෙගාමි එහි එක් මහාචාර්යවරයෙකි. එහි තත්ත්වය එක්සත් ජනපදයේ නැගෙනහිර වෙරළ තීරයේ MIT හි තත්ත්වයට සමාන වේ. මීට සමාන නිදසුනක් වන්නේ හිටපු රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් ඉගෙනගත් පාසල ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇති වෙලෙස්ලි විද්‍යාලය, එනම් Mona Lisa Smile චිත්‍රපටය රූගත කළ ස්ථානය යි. වෙලෙස්ලි විද්‍යාලය කාන්තාවන් සඳහා එක්සත් ජනපදයේ ඇති හොඳම විද්‍යා පාසල්වලින් එකකි, නමුත් එය ලිබරල් කලා විද්‍යාලයක් ලෙස ප්‍රසිද්ධියක් උසුලයි. ඔවුන්ගේ "නවක සමුළුව" ජපානය තුළ හඳුන්වා දුන්නේ මම යි.

**රැකියාවෙහි නියුතු වැඩිහිටියෙකුගෙන් අපේක්ෂා කරන මූලික ශක්තීන් මොනවා ද?** රැකියාවෙහි නියුතු වැඩිහිටියෙකුගේ (shakaijin kisoryoku) මූලික ශක්තීන් යනු ජපානයේ විශ්වවිද්‍යාල සහ සමාගම්වල ඔබට නිතර අසන්නට ලැබෙන වාක්‍ය ඛණ්ඩයකි. ඒ පිළිබඳ පොත්පත් ද ප්‍රකාශයට පත්කර ඇත. මෙම එක් පොතක මා උගන්වන පන්තිවල අන්තර්ගතය අඩංගු වන අතර, එහි දී රැකියාවෙහි නියුතු වැඩිහිටියෙකුගේ මූලික ශක්තියක් ලෙස මම ලිබරල් කලාවේ එක් ගුණාංගයක් වන විචාරාත්මක චින්තනය සඳහන් කොට ඇත.

**මිනිසුන්ට AI සමග සහජීවනයෙන් සිටිය හැකි ද?** 2045 වන විට, හැකියාවන් අතින් AI මිනිසුන් අභිබවා යන බවට වූ වාර්තාවක් නිකුත් වූ විට එය මතභේදාත්මක ත්ත්ත්වයක් උද්ගත කිරීමට හේතු විය. බොහෝ දෙනා කල්පනා කළේ AI විසින් මිනිසුන්ගේ රැකියා උදුරා ගනු ඇති ද යන්න යි. පරිගණක අධ්‍යාපනය සඳහා වූ ජපන් විශ්ව විද්‍යාල සංගමයේ (JUCE) ඒකාබද්ධ කර්මාන්ත අධ්‍යයන ව්‍යාපෘතියක් වන "විශ්වවිද්‍යාල පීඨය මගින් සිදු කළ ව්‍යවසාය පරිශ්‍ර පුහුණුවේ දී", මම ප්‍රධාන ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන නිෂ්පාදකයෙකුගේ ආයතනාභ්‍යන්තර පුහුණු වැඩසටහනකට සහභාගී වුණෙමි. මෙම සමාගම AI තාක්ෂණයේ ඉදිරියෙන්ම සිටින සමාගමකි. භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් සහිත ජර්මනියේ හිටපු චාන්සලර්වරිය වන ඇන්ජෙලා මර්කල් සමහර අවස්ථාවල දී එය නැරඹීමට පැමිණේ. AI සමඟ සට්ටනයක් ඇතිකර ගැනීම නොව සහජීවනයේ අවශ්‍යතාව ඇය අවධාරණය කළා ය. ඇය AI සලකන්නේ මානව අධ්‍යාපනය සමග විද්‍යාව හා තාක්ෂණය ඒකාබද්ධ කිරීම යනුවෙනි.

**ඉගෙනුම් ක්‍රම අධ්‍යයනය කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?** MIT සහ වෙල්ස්ලි විද්‍යාලය යන ආයතන දෙකෙන්ම අවධාරණය කරනුයේ ස්වාධීනව ඉගෙන ගැනීමට කියා දීමේ මාර්ගයක් ලෙස මිනිසුන්ට "ඉගෙනුම් ක්‍රම අධ්‍යයනය කිරීම" ඉගැන්වීමේ වැදගත්කම ගැන යි. ලිබරල් කලා විද්‍යාලයක හරය මෙය යි.

**විශ්වවිද්‍යාල-ව්‍යවසාය හවුල්කාරිත්වය යනු කුමක්ද?** එක් අතකට විශ්වවිද්‍යාල සහ උපාධි පාසල් අතරත්, එමෙන්ම අනෙක් අතට සමාජය (ව්‍යවසායන්) අතරත් පවතින හවුල්කාරිත්වය හැඳින්වීමට මා භාවිතා කරන මගේම වචනය එය යි. ස්වාධීන ඉගෙන ගන්නන් බවට පත් වීමට අපි මිනිසුන්ව දැනුවත් කළ යුතු හේතුව එය යි.

**KCG සමූහයේ අධ්‍යාපනික චින්තනය අනුව:** සෑම විශ්වවිද්‍යාලයකම ඇතුළත් වීමේ ප්‍රතිපත්ති, විෂයමාලා ප්‍රතිපත්ති සහ ඩිප්ලෝමා ප්‍රතිපත්ති ඇත. KCGI හි මව් ආයතනය වන KCG හි අධ්‍යාපනික දර්ශනය මේවාට නිදසුන් සපයයි: "පරිගණක තාක්ෂණයේ නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම" සහ "පුළුල් පරාසයක දෘෂ්ටි කෝණවලින් සිතීම වර්ධනය කිරීම". කෙටියෙන් කිවහොත්, විද්‍යාව හා මානව ශාස්ත්‍ර යන දෙකෙහි ඒකාබද්ධය ලිබරල් කලාව යි.

### තොරතුරු තාක්ෂණය හරහා නොදන්නා ලෝකය පිළිබඳ සෙවීමේ අභියෝගයට මුහුණ දීම

**—අවසාන වශයෙන් ඔබට අපගේ සිසුන්ට පැවසීමට ඇත්තේ කුමක් ද?**

KCGI හි ඉගෙනුම ලබන සිසුන් වශයෙන් ඔබ භුක්ති විඳින්නේ අන් අයට වඩා තත්ත්වයෙන් ඉහළ අධ්‍යාපන පරිසරයකි. එයට හේතුව ඔබට තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂීකෘත දැනුම පහසුවෙන් ලබා ගැනීමටත්, නොදන්නා ලෝකය පිළිබඳ සෙවීමේ අභියෝගයට මුහුණ දීම සඳහා ඔබට අවශ්‍ය පරිදි එය යොදා ගැනීමටත් හැකි බැවිනි. මගේ සිහිනය KCGI හි සිසුන් සමග එක්ව ඉගෙනුම් කේන්ද්‍රීය පන්ති නිර්මාණය කිරීම, එම සිසුන් සමග විවෘත සන්නිවේදනයෙහි යෙදීම, සහ ඒ හරහා ඉගෙනුම් ප්‍රජාවක් නිර්මාණය කිරීම යි. ඔබ මට ශක්තියක් වන්න, එවිට අපට එකට එක්ව එම සිහිනය සැබෑ කර ගත හැකි ය.

## ආරක්ෂණය පිළිබඳ අවශ්‍යතාව සමග ශීඝ්‍ර ඩිජිටල්කරණය තුලනය කර ගැනීම

මහාචාර්ය 内藤 昭三

# ෂොසො නයිතො

Shozo Naito



නිපොන් විද්‍යුත් ලිපි හා දුරකථන සමාගමේ තොරතුරු සහ බෙදාහැරීම් වේදිකා රසායනාගාරයේ හිටපු ප්‍රධාන පර්යේෂක

Cyber Kyoto රසායනාගාරයේ අධ්‍යක්ෂ

**මහාචාර්ය ෂොසො නයිතො නිපොන් විද්‍යුත් ලිපි හා දුරකථන සමාගමේ (දැන් NTT) තොරතුරු සහ බෙදාහැරීම් වේදිකා රසායනාගාරයේ ප්‍රධාන පර්යේෂක ලෙස සේවය කරන ලදී. ඔහු ජාල සහ තොරතුරු ආරක්ෂණය පිළිබඳ විශේෂඥයෙකි. මහාචාර්ය නයිතො COVID-19 වසංගතයත් සමග ජපානයේ සහ ලෝකයේ වත්මන් ජාල තත්ත්වය සහ සයිබර් ආරක්ෂණය, සහ ඊට අදාළ ගැටළු සම්බන්ධයෙන් අප සමග කතාබහක යෙදුණි.**

### ජපානය ඩිජිටල්කරණ ප්‍රවර්ධනය කරා යා යුතුයි

—COVID-19 වසංගතය මගින් ඩිජිටල්කරණය සහ තොරතුරු තාක්‍ෂණ භාවිතය වැලඳ ගැනීමට සමාජය පොළඹවා ඇත. 2021 සැප්තැම්බරයේ සැලසුම් කර ඇති "ඩිජිටල් ඒජන්සියක්" එළිදැක්වීම මගින් මෙම ප්‍රවණතාව වේගවත් විය යුතු ය.

භෞතික ලෝකය මෙන්ම සයිබර් අවකාශය ද වෛරසවලින් පිරී ඇති අතර, නිරතුරුවම ඒවායේ නව ප්‍රභේද මතුවන බවක් පෙනෙන්නට තිබේ. විපර්යාස යනු සැබවින්ම භෞතික ලෝකයේ ද සිදු වන දෙයක් වන අතර, අපි අපගේ ජීවන මාර්ග අනුවර්තනය කර ගැනීමෙන් ඒවාට ප්‍රතිචාර දැක්වීමට ප්‍රයත්න දරන්නෙමු. ජපානය තුළ ඩිජිටල්කරණය ලෝකයේ සෙසු රටවලට වඩා යම් ආකාරවලින් පසුගාමී වී ඇත. කෙසේ නමුත්, අවසානයේ දී ජපානය දුරස්ථ පරිගණකකරණයට අනුගත වීමට පටන් ගෙන තිබේ. මෑතකාලීනව ඩිජිටල් පරිවර්තන ප්‍රවේශය මගින් මඟ පෙන්වන ලදුව (DX: ඩිජිටල් තාක්‍ෂණයේ ව්‍යාප්තිය හරහා මිනිසුන්ගේ ජීවිත පරිවර්තනය කිරීම; පවතින වටිනාකම් සහ රාමු පිළිබඳ සංවේදනයන් මූලික වශයෙන් උඩු යටිකුරු කරන රැඩිකල් නවෝත්පාදනය), ඩිජිටල්කරණයේ දියුණුව සඳහා ගන්නාවූ පුළුල් පරාසයක ක්‍රියාමාර්ග වේගවත් වෙමින් තිබේ. ඩිජිටල් නියෝජිතායතනයක් පිහිටුවීමත් සමග ජපානයේ ජාතික රජය ප්‍රගතිය කරා යන බව පෙනෙන්නට තිබේ. පුද්ගලික අංශය ද මෙය ආදර්ශයට ගත යුතු අත්‍යවශ්‍ය මඟ පෙන්වීමක් බව මම විශ්වාස කරමි. ව්‍යාපාරික ලෝකය COVID-19 වසංගතය හමුවේ මුහුණපාන අවදානම උකහාගෙන එය අපගේ වාසියට හරවා ගත යුතු ය.

කෙසේ නමුත් ජාල මත අධික ලෙස විශ්වාසය තැබීමෙන් ආරක්‍ෂණය සම්බන්ධ අවදානම් නිසඟයෙන් ම වැඩි කරයි. ජාලකරණය සහ ආරක්‍ෂණය මෝටර් රථයක රෝද මෙන් එකිනෙකට බැඳී පවතී. මෙම අංශ දෙක අතර සමබරතාව පවත්වා ගැනීම අප සැම විටම මතක තබා ගත යුතු කටයුත්තකි. අධ්‍යයන ලෝකයේ අපි දේශන සහ පන්ති සඳහා නිතිපතා Zoom භාවිතා කරමු. පුද්ගලික අංශය තුළ වඩාත් ශක්තිමත් ආරක්‍ෂණයක් සහිත ඔන්ලයින් සම්මන්ත්‍රණ පද්ධති හඳුන්වා දෙමින් තිබේ. ඒ හා සමානවම, ගිණුම් සත්‍යාපනයේ දී ගිණුම් හිමියන්ව කොපමණ දුරට සත්‍යාපනය කරන්නේ ද පිළිබඳ ප්‍රශ්නය, පුද්ගලයින්ගේ පෞද්ගලිකත්ව අවශ්‍යතාව සමග ගලපා ගත යුතු වේ. අපට කිරීමට අවශ්‍ය දේවල් සහ අපට අවශ්‍ය ආරක්‍ෂණ මට්ටම අතර සමබරතාවක් ඇති කරන විසඳුම් තෝරා ගැනීම වැදගත් වේ. ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම සඳහා, අපි නිරතුරුවම ජාලකරණය සහ ආරක්‍ෂණය අතර සමතුලිතතාව පිළිබඳ විමසිලිමත් විය යුතු ය.

### සයිබර් ප්‍රහාර සිදුවන විට අපට එයට ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රමාණය පිළිබඳ පවතින මතභේදය

—ලොව පුරා සයිබර් ප්‍රහාර ඉහළ යමින් පවතී. එමෙන්ම එම ප්‍රහාරවල අනතුරුදායක බව පෙර නොවූ විරූ ලෙස ඉහළ යමින් පවතී.

2016 එක්සත් ජනපදයේ ජනාධිපතිවරණයට රුසියාවෙහි මැදිහත් වීමක් තිබූ බවට කටකතා පැතිර ගියේ ය. ගොඩබිමෙන්, මුහුදෙන් සහ ගුවනින් සිදු කළ සාම්ප්‍ර දායික ලෝක යුද්ධයෙන් පසුව, සිව්වන සහ පස්වන යුධ අවකාශයන් ලෙස අභ්‍යවකාශය සහ සයිබර් අවකාශය භාවිතා වනු ඇතැයි යන අදහසට ඇතැම් රටවල් ප්‍රතිචාර දක්වන්නේ අභ්‍යවකාශ බලකා සහ සයිබර් බලකා පිහිටුවීමෙනි. පැහැදිලිවම අපි සයිබර් ප්‍රහාර සම්බන්ධයෙන් අපගේ ප්‍රතිචාර ශක්තිමත් කළ යුතු ය. නමුත් අපි අපේ ආරක්ෂාව සඳහා එය කොපමණ දුරකට සිදු කළ යුතු ද? මෙම ප්‍රශ්නයට ජාත්‍යන්තර පොදු එකඟතාවක් අවශ්‍ය වේ. ඒ පිළබඳ වත්මන් කතිකාවෙහි ඇතුළත් මාතෘකා වන්නේ: මිසයිල ප්‍රහාරයකට ප්‍රතිචාර වශයෙන් සතුරු මිසයිල කඳවුරුවලට ප්‍රහාර එල්ල කරන ආකාරයටම සයිබර් ප්‍රහාරවලට ප්‍රතිචාර දැක්වීමට යම් රටකට යා හැකි දුර කුමක්ද? අපට පහර දෙන වෙබ් අඩවි වෙත අපට කෙතරම් දරුණු ලෙස ප්‍රති ප්‍රහාර දිය හැකි ද? මිසයිල කඳවුරක් තමන්ගේම රටේ වුව ද පිහිටා තිබිය හැකි නමුත් සයිබර් ප්‍රහාරයක් ලෝකයේ ඕනෑම තැනක සිට පැමිණිය හැක. සයිබර් ප්‍රහාරයක දී භාවිතා කරන සේවාදායකය පහසුවෙන්ම ජපානයෙන් පිටත ස්ථානගත කර තිබෙන්නට පුළුවන. එවැනි තර්ජනවලට මුහුණ දීමේ තාක්‍ෂණය අප සතුව තිබිය යුතු ය. ඉදිරියේ දී සයිබර් ප්‍රහාරවලට එරෙහිව සටන් කිරීම සඳහා වඩාත් ඵලදායී වන්නේ කුමන ක්‍රමවේදයන් දැයි තීරණය කිරීමට සමජයේ කතිකාවතක් ඇති කළ යුතුව තිබේ.

සයිබර් ප්‍රහාර රජයෙන් රජයට පමණක් සිදුවන දෙයක් නොව පුද්ගලික අංශ මට්ටමින් ද සිදුවන දෙයකි. එය එසේ වුවත් බොහෝ වත්කම් පිහිටා ඇත්තේ අන්තර්ජාලය තුළ යි. අතථ්‍ය මුදල් ලෙස ආරම්භ වී ඩිජිටල් මුදල් සහ ඩිජිටල් බෙරුම්කරණ ප්‍රොටෝකෝල හරහා සිදුවන ගනුදෙනු සමග, මුදල්වල ස්වභාවය ඔන්ලයින් ආකාරයෙන් වෙනස් වේ. කොටස් සහ නිශ්චල දේපල පිළිබඳ තොරතුරු ඔන්ලයින් ඉලෙක්ට්‍රොනික දත්ත ලෙස ද පිහිටා ඇත. ජපන් සමාගම් සතුව බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු අති විශාල ප්‍රමාණයක් ඇති අතර, ඒවා සොරා ගැනීමට අනිටු වංචනිකයන් මඟබලා සිටී. විශාල සමාගම් නිරන්තරයෙන් සයිබර් ප්‍රහාරවලින් බැට කයි. පරිපූර්ණ ආරක්ෂාවක් කියා දෙයක් නොමැති අතර, සමාගම් මෙම තර්ජනවලට එරෙහිව පියවර ගැනීමට සූදානම්ව සිටිය යුතු වේ.

### ජාලයක් පිළිබඳ තොරතුරු පොදුවේ සැමට දැක ගැනීමේ හැකියාව ඇත.

—සාමාන්‍ය පුරවැසියන් වන අපි ද සයිබර් ප්‍රහාර සහ සයිබර් සොරකම්වලින් නිරන්තර තර්ජනයට ලක්ව සිටිමු.

භාවිතයට ඇති පහසුව හෙතුවෙන් ඉලෙක්ට්‍රොනික ගනුදෙනුකරණය, ඉලෙක්ට්‍රොනික මුදල් ආදී දේවලට අපි ඉතා ප්‍රිය කරන නමුත්, ඒ සමගම ඒවා හැක් කිරීමට ලක් වීමට ඇති හැකියාව හේතුවෙන් අපි ඒවා පිළිබඳ නිරන්තර සෝදිසියෙන් සිටිය යුතු ය. යෙදුම් ආදී බොහෝ දේවල ඇති ජීවිතය පහසු කරවන විශේෂාංගවල ඇති අනෙක් පැත්ත නම් ඒවාත් සමග පැමිණෙන සැඟවුණු ආරක්ෂක උගුල් සහ අන්තරායන් පිළිබඳව අවධානයෙන් සිටිය යුතු වීම යි. නිදසුනක් ලෙස, ඔන්ලයින් යාමට තමා ආසන්නයේම ඇති ගාස්තු රහිත WiFi සම්බන්ධතාවක් භාවිතා කිරීමෙන් අන්‍යයන් ඔබට අනවසරයෙන් සවන් දීම හෝ ඔබව හැක් කිරීම සිදු විය හැක. මූලික වශයෙන් ජාලයක ඇති සියලුම තොරතුරු අන්‍යයන්ට දැකගත හැක අතර එමඟින් අනවසරයෙන් සවන්දීමට හෝ නිරීක්ෂණය කරනු ලැබීමට ලක් වීමේ හැකියාවක් ඇත. ඔබ තොරතුරු යවන විට, යමෙකු එය දෙස බලා සිටින බව ඔබ උපකල්පනය කළ යුතු ය. ඔබ ඔබේ මූල්‍ය ගිණුම් කටයුතු සම්බන්ධ යම් දෙයකට හෝ පුද්ගලික තොරතුරු හෙළිදරව් කරමින් ජාලයකට පිවිසෙන සෑම අවස්ථාවකම, "යමෙකු මෙය දුටුවහොත් මට ගැටළුවක් ඇති වේවි ද?" යන ප්‍රශ්නය සිහි තබා ගන්න. නිදසුනක් ලෙස, ඔබ තොරතුරු යැවීමට පෙර එය නිසියාකාරව සංකේතනය කර ඇත්දැයි ඔබෙන්ම විමසන්න. එය පහසු කටයුත්තක් නොවුණත් සෑම අවස්ථාවකදී ම මෙම පියවර අනුගමනය කිරීමට මතක තබා ගැනීම ඉතා වැදගත් වේ. සැබවින්ම මෙම ආරක්ෂක ක්‍රියාමාර්ගවල දී තාක්‍ෂණය වැදගත් මෙහෙයක් ඉටු කරන නමුත් අවසානයේ පරීක්ෂාකාරී බව සහ විචක්ෂණභාවය ඊටත් වඩා වැදගත් වේ.



# අධ්‍යයන පීඨය හඳුන්වාදීම

## KCG හි එක් පීඨ මණ්ඩල සාමාජිකයකුට සිටින උපරිම ශිෂ්‍ය ප්‍රමාණය 10 කි.

ගෝලීය තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ වැජඹෙන නායකයින් ඇති කිරීමේ අපගේ ඉලක්කය සපුරා ගැනීම සඳහා KCGI හි පීඨය, ප්‍රධාන සමාගම්වල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර පරිපාලනය හා ශික්ෂණ විද්‍යා ක්ෂේත්‍රවල ලොව ප්‍රමුඛ ප්‍රායෝගික පළපුරුදු විශේෂඥයන්ගෙන් සමන්විත වේ.

### අධ්‍යයන පීඨ මෙහෙවර

KCGI විසින් පීඨ සාමාජිකයින්ගේ උපදෙස් සමඟ, සෑම සිසුවෙකුටම සිය අනාගත අභිලාෂයන්ට ගැලපෙන පරිදි ඉගෙන ගත හැකි වාතාවරණයක් සකස් කර ඇත.

KCGI පීඨය ඉතා වැදගත් කාර්යභාරයන් දෙකක් ඉටු කරයි. පළමුව, KCGI පීඨය අධ්‍යාපන සම්පත් වල කාර්යභාරය ඉටු කරයි. පීඨ සාමාජිකයින් සිසුන්ගේ අධ්‍යාපනික සම්පත් වේ. පීඨ සාමාජිකයන්ගෙන් සිසුන්ට ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ඉගෙන ගත හැකිය. KCGI පීඨයේ දෙවන කාර්යභාරය අධ්‍යයන සම්බන්ධීකාරක වශයෙන් වේ. අධ්‍යයන කටයුතු පිළිබඳ සිසුන්ගේ අවබෝධය සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් පීඨ සාමාජිකයෝ අධ්‍යයන ක්‍රියාවලිය සැලසුම් කරති. අධ්‍යයන සම්බන්ධීකාරකවරුන් ලෙස පීඨ සාමාජිකයින් ඉටු කරන කාර්යභාරය වන්නේ විවිධ අධ්‍යයන සම්පත් සමඟින් සිසුන් සම්බන්ධ කිරීමයි.

KCGI හි අප විශ්වාස කරන්නේ අපේ මෙහෙවර වන්නේ මෙම අරමුණු සම්පූර්ණ කරගැනීම සහ සෑම සිසුවකුටම සිය අධ්‍යයන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම සහාය ලබා දීමයි.

### උප සභාපති / මහාචාර්ය



**යොයිචි ටෙරෂිටා Yoichi Terashita**

විද්‍යාවේදී උපාධිය - කියොතෝ විශ්ව විද්‍යාලය
ආචාර්ය උපාධිය - ඇමරිකා එක්සත් ජනපදයේ අයෝවා විශ්ව විද්‍යාලය
ගෞරව මහාචාර්ය - කනසාවා තාක්ෂණික ආයතනය
විශේෂඥ - ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය
JICA – හි හිටපු විශේෂඥ



**ෂිගෙරු ඉයිහෝ Shigeru Eiho**

විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය - කියෝතෝ විශ්ව විද්‍යාලය
ඉංජිනේරු විද්‍යාව ආචාර්ය උපාධිය - කියෝතෝ විශ්ව විද්‍යාලය
ගෞරව මහාචාර්ය - කියෝතෝ සරසවිය
හිටපු සභාපති සහ පද්ධති, පාලන සහ තොරතුරු ඉංජිනේරුවන්ගේ ආයතනය
පද්ධති, පාලන සහ තොරතුරු ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජික
අධීක්ෂක - ජපන් වෛද්‍ය ඡායා තාක්ෂණ සංගමය (JAMIT)
සාමාජික - ඉලෙක්ට්‍රොනික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන ඉංජිනේරුවන්ගේ ආයතනය



**ගැරී හොයිචි සුචිමොචි Gary Hoichi. Tsuchimochi**

ශාස්ත්‍රවේදී උපාධිය සහ ශාස්ත්‍රපති උපාධිය, කැලිෆෝනියා විශ්ව විද්‍යාලය (ඇමරිකා එක්සත් ජනපදය); නැගෙනහිර ආසියානු අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති, අධ්‍යාපනපති (එඩ්.එම්.), අධ්‍යාපනය පිළිබඳ ආචාර්ය උපාධිය (එඩ්.ඩී.), ඇමරිකා එක්සත් ජනපදයේ කොලොම්බියා විශ්ව විද්‍යාලය; අධ්‍යාපනය පිළිබඳ ආචාර්ය උපාධිය, ටෝකියෝ විශ්ව විද්‍යාලය
හිටපු පූර්ණ කාලීන උපදේශක, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මානව ශාස්ත්‍ර පීඨය, කොකුෂිකන් විශ්ව විද්‍යාලය; හිටපු මානව විද්‍යා මහාචාර්ය, උපාධි පාසල, ටොයෝ අයිවා කාන්තා විශ්ව විද්‍යාලය; හිටපු මහාචාර්ය, 21 වන සියවසේ අධ්‍යාපන මධ්‍යස්ථානය, හිරෝසාකි විශ්ව විද්‍යාලය; හිටපු මහාචාර්ය, ටයික්යෝ විශ්ව විද්‍යාලය; හිටපු අධ්‍යක්ෂ, ටයික්යෝ විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් හා ඉගෙනුම් මධ්‍යස්ථානය
හිටපු ආරාධිත මහාචාර්ය, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, වික්ටෝරියා විශ්ව විද්‍යාලය (කැනඩාව); ආරාධිත පර්යේෂණ සාමාජික, දකුණු ෆ්ලොරිඩා විශ්ව විද්‍යාලයේ ජපන් අධ්‍යයනය සඳහා මාර්ක් ටී. ඕර් මධ්‍යස්ථානය; ආරාධිත මහාචාර්ය, නාගෝයා විශ්ව විද්‍යාලයේ උසස් අධ්‍යාපන අධ්‍යයන මධ්‍යස්ථානය
පරීක්ෂක මහාචාර්ය, අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MEXT) විශ්ව විද්‍යාල ආයතන සභාව (සංසන්දනාත්මක අධ්‍යාපනය, ජපානයේ අධ්‍යාපන ඉතිහාසය, මානව විද්‍යාවේ මූලික පුහුණුව (අධ්‍යාපන), මානව ශාස්ත්‍රීය න්‍යාය පිළිබඳ මූලික පුහුණුව I සහ II); පරීක්ෂක මහාචාර්ය, මෙක්ස්ට් විශ්වවිද්‍යාල ආයතන කවුන්සිලය (අධ්‍යාපන සංසන්දනාත්මක ඉතිහාසය); අධ්‍යාපන උපදේශක සහතිකය, ඇමරිකා එක්සත් ජනපදයේ බ්‍රිග්හැම් යං විශ්වවිද්‍යාලය; කළඹ පුහුණු සහතිකය, විශ්ව විද්‍යාල ඇගයීම් සහ අධ්‍යයන උපාධි පිළිබඳ ආයතනය, ඩල්හවුසි විශ්ව විද්‍යාලය (කැනඩාව)

### අධ්‍යක්ෂ, සප්පොරො චන්ද්‍රිකාව / මහාචාර්ය



**මසාකි නකමුරා Masaki Nakamura**

ආර්ථික විද්‍යාවේදී අඔයාමා ගකුයින් විශ්ව විද්‍යාලය
නිහොන් යුනිසිස් සමාගමෙහි සේවය කිරීමෙන් අනතුරුව 1987 වසරේදී මෙතුමා විසින් dGIC Inc. ආරම්භ කරන ලදී.
මෙම සමාගමේ සභාපති මෙන්ම අධ්‍යක්ෂද මෙතුමන්ය.
ප්‍රධාන අධ්‍යක්ෂ පරිගනක ආශ්‍රිත කර්මාන්ත සෞඛ්‍ය රක්ෂණ සංගමය හොකයිදෝ
සභාපති තොරතුරු පද්ධති කර්මාන්ත සංගමය හොකයිදෝ
නිපෝන් තොරතුරු කර්මාන්ත සංගම් සම්මේලනය

### අධ්‍යක්ෂ, තෝකියෝ චන්ද්‍රිකාව / මහාචාර්ය



**හිසායා තනාකා Hisaya Tanaka**

ඉංජිනේරු (විද්‍යාවේදී) උපාධිය, වසෙද විශ්ව විද්‍යාලයේ
පද්ධති සහායක අංශයේ හිටපු වැඩ බලන කළමණාකරු, ෆුජිත්සු සමාගම
හිටපු අධ්‍යක්ෂ, ෆුජිත්සු විශ්ව විද්‍යාලය
තොරතුරු තාක්ෂණික ප්‍රවර්ධන නියෝජිතායතනයේ හිටපු විධායක අධ්‍යක්ෂක සහ කළමනාකාර, තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන මූලස්ථානය
ජපන් සමාජ ඉංජිනේරු අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයෙකු ලෙස සහතික කර ඇත
ව්‍යාපෘති සැලසුම් කමිටුවේ සාමාජික, ජපාන ඉංජිනේරු අධ්‍යාපන මණ්ඩල සාමාජික, මිතෝ පදනම

### ගෞරව සහිතව විශ්‍රාමලත් සභාපති / මහාචාර්ය



**තොශිහිදේ ඉබරාකි Toshihide Ibaraki**

ඉංජිනේරු උපාධිධාරී, කියෝතෝ විශ්ව විද්‍යාලය, ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය, කියෝතෝ විශ්ව විද්‍යාලය (ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් උපාධිය)
විශ්‍රාමලත් මහාචාර්ය, කියෝතෝ විශ්වවිද්‍යාලය
කියෝතෝ විශ්ව විද්‍යාලයේ තොරතුරු විද්‍යා පාසලේ හිටපු පීඨාධිපති
හිටපු මහාචාර්ය, ටොයෝහෂි තාක්ෂණ විශ්වවිද්‍යාලය
හිටපු මහාචාර්ය, ක්වන්සෙයි ගකුඉන් විශ්වවිද්‍යාලය
කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලයේ (KCGI) සභාපති (2010 - 2023)

KCGI මහාචාර්යවරුන් සහ සහකාර මහාචාර්යවරුන් ගැන වැඩි විස්තර මෙතැනින් දැනගන්න

# කියෝතෝ, ශිෂ්‍යයන් සඳහා වූ නගරය

කියොතෝවට වසර 1200 කට වැඩි ඉතිහාසයක් තිබේ. එය එක් වරක ජපානයේ අගනුවරවූ අතර තවමත් ජපානයේ සංස්කෘතික හදබිමයි. එය ජාත්‍යන්තර නගරයක් වන අතර බොහෝ තරුණ සිසුන් නගරයේ ජීවත් වේ. KCG විශ්ව විද්‍යාල පහසු ප්‍රදේශ වල පිහිටා ඇති අතර, කියෝතෝ නගරයේ සෑම ප්‍රදේශයකින්ම ඔබට ඒවාට ප්‍රවේශ විය හැක. ඊට අමතරව, ඔසාකා, නාරා, කෝබේ සහ ඔට්සු වැනි කන්සායි ප්‍රදේශයේ අනෙකුත් ස්ථාන වල සිට පහසුවෙන් ළඟා විය හැකිය.



## කියෝතෝ ප්‍රධාන පාසලේ KCGI හයකුමන්බෙන් සරසවිය අවට ප්‍රදේශය

මෙම ප්‍රදේශයේ මුරොමචි සංස්කෘතිය නියෝජනය වන ගින්කකුජි විහාරය, ජිදයි මත්සුරි සමග සම්බන්ධ (කියෝතෝහි විශාලතම උත්සවය අතරින් එකක්)හෙයිඅන් ජින්ගු සිද්ධස්ථානය, සකුරා මල් පිපෙන ගස් සඳහා ප්‍රසිද්ධ ටෙත්සු ගකුනෝ මිචි, ජපානයේ දෙවැනි පැරණිතම සත්වෝද්‍යානය වන කියොතෝ සිටි සත්වෝද්‍යානය, සහ කියෝතෝ සිටි කෞතුකාගාරය (තවත් බොහෝ ස්ථාන අතර). මෙම ජපන් සංස්කෘතිය හා ඉතිහාසය සමඟ සම්බන්ධ වීම පහසුය!

ස්ථානය

| | |
|---|---|
| ජින්කාකුජි | කියෝතෝ නගරය සත්තුවත්ත |
| ටෙට්සුගාකු-නො-මිචි (දාර්ශනිකයින්ගේ පාගමන) | හෙයියන් ජින්ගු විහාරය |
| නන්සෙන්ජි පන්සල | ඊකන්ඩු සෙන්රින්-ජි |
| කියෝතෝ නගරයේ කියොසෙරා කලා කෞතුකාගාරය | චියොන්ජි පන්සල |
| | නූතන කලාව පිළිබඳ ජාතික කෞතුකාගාරය |

## KCGI අවට ප්‍රදේශය කියොතෝ එකිමාඊ චන්ද්‍රිකා සරසවිය

ජපානය පුරා සංචාරය කිරීම ගොඩක් මිනිස්සුට ජේ.ආර්. කින්තෙත්සු සහ නාගරික උමං රේඛා ධාවනය වන කියොතෝ දුම්රිය ස්ථානය කියොතෝ වෙත දොරටුවකි. නවීන ගොඩනැඟිලි සහ ඓතිහාසික ගොඩනැගිලි යන දෙකම මෙම ප්‍රදේශය තුළ පවතින අතර, අපට වෙනස් වාතාවරනයක් දැනේ.

ස්ථානය

| | |
|---|---|
| ටොජී | සන්ජුසන්ජෙන්ඩු |
| නිෂි හොන්ග්වන්ජි විහාරය | කියෝතෝ ජාතික කෞතුකාගාරය |
| හිගාෂි හොන්ගාන්ජි පන්සල | කියෝතෝ දුම්රියපොළ ගොඩනැගිල්ල |
| ටොකෙජී පන්සල | කියෝතෝ මින්මැදුර |
| කියෝතෝ කුළුණ | |



## KCG අවට ප්‍රදේශය රකුහොකු සරසවිය

කිතාඔජි උමං දුම්රිය ස්ථානයෙන් හා රකුහොකු සරසවිය අසල බස්රථ පර්යන්තයේ සිට කියෝතෝ නගරය සහ කියොතෝ දුම්රිය ස්ථානයේ සිට උමං මාර්ගයෙන් සහ නගර බසයෙන් රකුහොකු ප්‍රදේශයට යන්න පහසුය. නවීන ගොඩනැඟිලි වලින් පෙළගැසුණු කිතයමා වීදියට කමිගමෝ සිද්ධස්ථානය ආසන්න වන අතර උද්භිද උද්‍යානය, මිදොරොග-ඉකෙ විල සහ කමෝ ගඟෙහි අපට විනෝද විය හැක.

ස්ථානය

| | |
|---|---|
| කමිමමෝ සිද්ධස්ථානය | කියොතෝ උද්භිද උද්‍යානය |
| මිදොරොගා-ඉකි විල (එමෙන්ම මිසෝරොගා-ඉකි විල ලෙසද හඳුන්වයි) | කිතායාමා වීදිය |

## KCG අවට ප්‍රදේශය කමොගවා සරසවිය

කියෝතෝහි විශාලතම උත්සව තුනෙන් එකක් වන අඔයි උත්සවය සමග සම්බන්ධ ෂිමගොමෝ සිද්ධස්ථානය, සහ කියෝතෝහි රජ මාලිගය සරසවිය අසල පිහිටා ඇත. මෙය ස්වභාව ධර්මයෙන් පොහොසත් ප්‍රදේශයකි.

ස්ථානය

| | |
|---|---|
| ෂිමොගාමො විහාරය | ටඩාසු නො මොරි (විහාර වනය) |
| කියෝතෝ හි අධිරාජ්‍ය මාලිගය | කියෝතෝ නගරයේ ඓතිහාසික කෞතුකාගාරය |







# kcg.edu අධ්‍යාපන ජාලය

කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය අනෙකුත් KCG සමූහ අධ්‍යාපන ආයතන සමග සමීප ජාලයක් නිර්මාණය කරමින් රාජ්‍ය හා විදේශීය විශ්ව විද්‍යාල සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, ගෝලීය අධ්‍යාපන ආයතනයක් මෙන්ම තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ ප්‍රමුඛයා ලෙසද ලෝක මට්ටමේ ඉහල මට්ටමේ තොරතුරු තාක්ෂණ අධ්‍යන සාක්ෂාත් කර ගැනීම අරමුණු කරයි.

රොචෙස්ටර් තාක්ෂණික ආයතනය යනු 1829 දී ආරම්භ කරන ලද ඉංජිනේරු විශ්ව විද්‍යාලයක් වන අතර තොරතුරු තාක්ෂණ පාඨමාලා පිහිටුවීමට (1991) එක්සත් ජනපදයේ පළමු විශ්ව විද්‍යාල වලින් එකක් ලෙස ප්‍රසිද්ධය. පරිගණක චිත්‍රක, ක්‍රීඩා සහ තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රවල එක්සත් ජනපදය තුළ ඉහළම ප්‍රතිඵල පෙන්වීම පිළිබඳ අපි සාඩම්බර වන්නෙමු. රොචෙස්ටර් තාක්ෂණික ආයතනය 1996 දී කියෝතෝ කොම්පියුටර් ගැකුයින් සමග සහෝදර පාසල් ගිවිසුමකට එළඹී ඇත.

1963 දී පිහිටුවන ලද ජපානයේ ප්‍රථම පරිගණක අධ්‍යාපන ආයතනය ලෙස වසර 60ක සම්ප්‍රදාය සහ ජයග්‍රහණ පිළිබඳ සාඩම්බර වෙමින්, කියෝතෝ කොම්පියුටර් ගකුයින් ජපානයේ තොරතුරු කර්මාන්තයේ විශාලතම පුද්ගලික ජාලය නිර්මාණය කර ඇත්තේ 50,000 කට අධික උපාධිධාරීන් පිරිසක් සමගිනි.

**kcg.edu** Kyoto Computer Gakuin
**KCG**

**රොචෙස්ටර් තාක්ෂණ ආයතනය**
**RIT**
**Rochester Institute of Technology**

**kcg.edu** Kyoto Computer Gakuin Automobile School
**KCGM**

**kcg.edu** The Kyoto College of Graduate Studies for Informatics
**KCGI**

කියෝතෝ කොම්පියුටර් ගැකුයින් මෝටර් රථ පාසල ඊළඟ පරම්පරාව සඳහා වූ රථවාහන තාක්ෂණයට අදාළ තොරතුරු තාක්ෂණය හා ජාලකරණය පිළිබඳ දැනුම සහ උසස් තාක්ෂණික ක්‍රම සමඟින් රථවාහන යාන්ත්‍රික ක්‍රම පෝෂණය කරයි.

**kcg.edu** Kyoto Japanese Language Training Center
**KJLTC**

කියෝතෝ ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථානයේ, ජපන් භාෂා අධ්‍යාපන පහසුකම අධිකරණ අමාත්‍ය විසින් අනුමත කර ඇති අතර, තම රට තුල අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යයංශ යටතේ වසර 12 ක පාසල් අධ්‍යාපනයක් නොලැබූ සිසුන් සඳහා වූ ජපන් භාෂා ආයතනයක් ලෙස නම් කර ඇත.

**kcg.edu** Kyoto Computer Gakuin - U.S.A.
**නිව් යෝර්ක් කාර්යාලය**

**kcg.edu** Kyoto Computer Gakuin - China
**බීජිං කාර්යාලය**
**ඩාලියන් කාර්යාලය**
**ෂැංහයි කාර්යාලය**

KCG සමූහයේ විදේශ මෙහෙයුම් සඳහා පදනම ලෙස, නිව් යෝර්ක් කාර්යාලය නිව් යෝර්ක් ලෝක වෙළඳ මධ්‍යස්ථානය තුල 2000දී පිහිටුවන ලදී. සැප්තැම්බර් 11 දින ඇමරිකා එක්සත් ජනපදය හදිසි ත්‍රස්ත ප්‍රහාරවලින් පීඩාවට පත් වුවත්, දැන් නිව් යෝර්ක් කාර්යාලය රොක්ෆෙලර් මධ්‍යස්ථානයේ පිහිටා ඇති අතර එහි කටයුතු නැවත ආරම්භ කර ඇත.

චීනයේ විශ්ව විද්‍යාල සමඟ හුවමාරු කර ගැනීමේ පදනමක් ලෙස කේ.සී.ජී. බීජිං කාර්යාලය 2002 දී බීජිං හි චීන ජාතික පුස්තකාලය තුළ ස්ථාපිත කරන ලද අතර කේ.සී.ජී. විසින් එය සමග සබඳතා ශක්තිමත් කරගනිමින් සිටී.කේ.සී.ජී. විසින් 2008 දී කේ.සී.ජී. ඩේලියන් කාර්යාලය සහ 2018 දී KCG ෂැංහයි කාර්යාලය විවෘත කළ අතර එමඟින් චීන විශ්ව විද්‍යාල සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යාපනික සහාය ලබා දෙයි.

## KCGI සමාලෝචනය

**නම:** කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය

**මව් සංවිධානය:** කියොතෝ ජෝහෝ ගකුඑන්

**ලිපිනය:** 7 Tanakamonzen-cho, Sakyo-ku, Kyoto 606-8225, Japan

**උපාධි පාසල:** ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ විද්‍යාලය

**ප්‍රධාන:** අන්තර්ජාල ව්‍යාපාර තාක්ෂණ වැඩසටහන

**සම්පූර්ණ කළ යුතු ක්‍රෙඩිට් ගණන:** 44

**ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව:** 700 (මුළු ධාරිතාව පුද්ගලයන් 1300 කි.)

**පාඨමාලා වාරය:** අවුරුදු 2 යි

**උපාධිය:** තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය (M.S. - IT)

URL: https://en.kcg.edu

## KYOTO



රොම්, මුරුටා නිෂ්පාදන, නින්තෙන්දෝ, හොරිබා, ක්යොසෙරා, නිඩෙක් සහ ඔම්රොන් ඇතුලු ජපන් කර්මාන්තයේ නියමුවන් වන තොරතුරු තාක්ෂණ සමාගම් බොහෝමයක්, ජපානයේ සාම්ප්‍රදායික සංස්කෘතියේ මධ්‍ය ලක්ෂය වන කියොතෝහි පිහිටා ඇත. කියොතෝ බොහෝ නොබෙල් ත්‍යාගලාභීන් ද උපන් භූමිය වේ. KCGI විසින් කියෝතෝ විසින් නිෂ්පාදනය කරනු ලබන අති උත්කර්ෂවත් බලශක්තිය රැගෙන ඒවා පංති කාමරය තුලට ගෙන ඒමට අරමුණු කරයි.

### හයකුමන්බෙන් සරසවිය, කියෝතෝ ප්‍රධාන පාසල







**ලිපිනය**

7 Tanakamonzen-cho, Sakyo-ku, Kyoto, 606-8225, Japan

**ප්‍රවේශය**

- හයකුමන්බෙන් මංසන්ධියේ සිට මිනිත්තු 1ක් උතුරට ඇවිද යන්න
- දෙමචියනගි දුම්රිය ස්ථානයේ සිට මිනිත්තු 8ක් ඇවිද යන්න; කෙයිහන් දුම්රිය හෝ එයිසන් විදුලි දුම්රියෙන් ගමන් කරන්න
- කියොතෝ දුම්රිය ස්ථානයෙන් අංක 17 බස් රථය ගන්න "හයකුමන්බෙන්" වලින් බසින්න, නැත්නම් අංක 206 බස් රථයක නැග "අසුකයිවෝ" වලින් බසින්න

### කියෝතෝ එකිමාඑ් චන්ද්‍රිකා, කියෝතෝ ප්‍රධාන පාසල







**ලිපිනය**

10-5 Nishikujoteranomae-cho, Minami-ku, Kyoto, 601-8407, Japan

**ප්‍රවේශය**

- කියොතෝ දුම්රිය ස්ථානයෙන් හචිජෝ බටහිර පිටවීමේ සිට සිට මිනිත්තු 7ක් බටහිරට ඇවිද යන්න

### සප්පොරො චන්ද්‍රිකාව







**ලිපිනය**

දයිගෝ ගොඩනැගිල්ල 7 වන මහල
(dGIC ඉන්කෝපරේෂන් ඇතුළත),
5-11 Odorinishi, Chuo-ku, Sapporo, 060-0042, Japan

**ප්‍රවේශය**

- ඔදොරි දුම්රිය ස්ථානයේ 2වන පිටවීමෙන් උතුරට මිනිත්තු 1ක් ඇවිද යන්න

### තෝකියෝ චන්ද්‍රිකාව







**ලිපිනය**

VORT මොතෝඅසබු 4වන මහල
(හිතොමිඩියා ඉන්කෝපරේෂන් ඇතුළත)
3-1-35 Motoazabu, Minato-ku, Tokyo, 106-0046, Japan

**ප්‍රවේශය**

- ටෝකියෝ මෙට්‍රො හිබියා මාර්ගයේ පිහිටි රෝප්පොන්ගි දුම්රිය ස්ථානයේ 1A පිටවීමේ සිට මිනිත්තු 8ක ඇවිදීම
- තොඑයි ඔඑදො මාර්ගයේ පිහිටි රෝප්පොන්ගි දුම්රිය ස්ථානයේ 3 පිටවීමේ සිට මිනිත්තු 10ක ඇවිදීම